# කාර්යසාධන වාර්තාව

# අධිකරණ අමාත්‍යාංශය

**2014- ජනවාරි සිට දෙසැම්බර් දක්වා**

අධිකරණ අමාත්‍යාංශය

උපරිමාධිකරණ සංකීර්ණය

කොළඹ **12.**

**www. justiceministry.gov.lk**

**ගරු අධිකරණ අමාත්‍ය**

**ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා, ජනාධිපති නීතිඥ**

**ගරු නියෝජ්‍ය අමාත්‍ය**

**නීතිඥ සුජීව සේනසිංහ මහතා**

**අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමිය**

**කමලිනී ද සිල්වා මහත්මිය**

# පටුන


පිටු අංකය

**I** කොටස

1. අධිකරණ අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර **03**
2. අධිකරණ අමාත්‍යාංශයේ කාර්යයන් **04**
3. අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන **05**
4. අධිකරණ අමාත්‍යාංශයේ කාර්යයන් සංක්ෂිප්තව **07**
5. අධිකරණ අමාත්‍යාංශයේ එක් එක් අංශයන්ගේ ප්‍රගතිය
   - **5.1** නීති අංශය **08**
   - **5.2** පාලන හා ආයතන අංශය **15**
   - **5.3** යටිතල පහසුකම් අංශය **18**
   - **5.4** ගිණුම් අංශය **21**
   - **5.5** සැලසුම් අංශය **22**
   - **5.7** අභ්‍යන්තර විගණන අංශය **23**
   - **5.8** අධිකරණ නොවන නිලධාරින් සඳහා පුහුණු ආයතනය **23**
6. අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතන
   - **6.1** රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව **25**
   - **6.2** නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව **27**
   - **6.3** ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව **29**
   - **6.4** නීති ආධාර කොමිෂන් සභාව **31**
   - **6.5** සමථ මණ්ඩල කොමිෂන් සභාව **36**
   - **6.6** උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය **38**
7. අධිකරණ
   - **7.1** ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය **40**
   - **7.2** අභියාචනාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය **42**
   - **7.3** කම්කරු විනිශ්චය සහා ලේකම් කාර්යාලය **43**
8. අනෙකුත් ආයතන
   - **8.1** ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය **45**
   - **8.2** නීති විද්‍යාලය **47**

**II** කොටස

9. පුනුරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය **49**
   - **9.1** බන්ධනාගාර දෙපාර්තමේන්තුව **52**
   - **9.2** ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව **58**
10. නීතිපති දෙපාර්තමේන්තුව **63**
11. නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව **66**
12. මහා භාරකාර දෙපාර්තමේන්තුව **67**

# අධිකරණ අමාත්‍යාංශය

## දැක්ම

- යුක්තිය පසිඳලීමේ කාර්යක්ෂම ක්‍රමයක්
- ගෝලීය උන්නතීන්ට හා ජනතා අපේක්ෂාවන්ට සරිලන පරිදි සමාජීය අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර වශයෙන් නීති ප්‍රතිසංස්කරණය කිරීම;

## මෙහෙවර


- කාර්යක්ෂම හා අර්ථවත් ලෙස යුක්තිය පසිඳලීමේ අරමුණ ඇතිව ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම;
- පුරවැසියන්ගේ අයිතිවාසිකම් වඩාත් හොඳින් පිළිගැනීම ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණය කිරීම;

## 02. අධිකරණ අමාත්‍යාංශයේ කාර්යයන්


- යුක්තිය පසිඳලීම, පරිපාලනය කිරීමේ යාන්ත්‍රණයට අදාලවන ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් සම්පාදනය කිරීම
- අදාළ අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම් බලධාරීන් සමග එකඟත්වයට පැමිණි කාලසීමාව හා අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් වෙනත් කිසිදු ආයතනයක් වෙත පවරා දෙනු නොලැබූ යුක්තිය පසිඳලීමේ අධිකරණයන්හි පරිපාලනය පිළිබඳ කටයුතු
- උසාවි පරිපාලනය
- යම් වරදකරුවකුට නියම කරනු ලැබූ දඬුවම් සම්බන්ධයෙන් සමාවදීම, එම දඬුවම් අඩු කිරීම, ලිහිල් කිරීම, ප්‍රමාද කිරීම හා අත්හිටුවීම සම්බන්ධයෙන් උපදෙස් දීම
- කම්කරු විනිශ්චය සභාවන්ට අදාළ කටයුතු
- නීති ප්‍රතිසංස්කරණ කටයුතු
- නීති ශබ්ද මාලා පිළියෙල කිරීම
- සමස්ත ක්වාසි පද්ධතියේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම පිණිස සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- යුක්තිය පසිඳලීම පරිපාලනයේ ප්‍රමාදයන් වැළැක්වීම පිණිස වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලංකා නීති වර්තා පලකිරීම
- අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු / ආයතන අධීක්ෂණය සහ එම ආයතනවලට පැවරි ඇති අනෙකුත් සියලුම විෂයයන්

# 03. අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන

## අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු



# අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින ආයතන



## 04. අධිකරණ අමාත්‍යාංශයේ කාර්යයන් සංක්ෂිප්තව

- අමාත්‍යාංශයේ කාර්යයන් පහත අංශ මගින් ක්‍රියාත්මක කරනු ලබයි. එනම්,
    - i. නීති අංශය
    - ii. පාලන අංශය
    - iii. යටිතල පහසුකම් අංශය
    - iv. ගිණුම් අංශය
    - v. සැලසුම් අංශය
    - vi. අභ්‍යන්තර විගණන අංශය

**i.** නීති අංශය

යුක්තිය පසිඳලීමට අදාළ නීති සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම, නීති වාර්තා පලකිරීම, නීති ආධාර ලබා දීම, අපරාධ, සිවිල් සහ වාණිජ කරුණු සම්බන්ධයෙන් සහ අන්තර්ජාතික ළමා අපහරණය පිළිබඳ සිවිල් පැතිකඩයන් සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය සහයෝගීතාවය ලබා දීම සඳහා මධ්‍යම බලධාරියා වශයෙන් කටයුතු කිරීම, 1995 අංක 05 දරණ පනත යටතේ සිරකරුවන් මාරුකිරීම, ව්‍යවස්ථාකරණය පිළිබඳ කැබිනට් අනුකාරක සභා පැවැත්වීම, සිරකරුවන්ට සමාව ප්‍රදානය කිරීම පිළිබඳ නිර්දේශයන් ලබා දීමත් නීති අංශය මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන කාර්යයන් වේ.

**ii.** පාලන අංශය

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරන ලද උපලේඛනගත රාජ්‍ය නිලධාරීන් හැර අනිකුත් සියලුම නිලධාරීන්ගේ සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල පරිපාලන කටයුතු කිරීම.

**iii.** යටිතල පහසුකම් අංශය

අධිකරණ ගොඩනැගිලි, විනිශ්චයකාරවරුන්ගේ නිල නිවාස සහ කම්කරු විනිශ්චය සභා ඉදිකිරීම, අධිකරණ ගොඩනැගිලි, විනිශ්චයකාරවරුන්ගේ නිල නිවාස හා කම්කරු විනිශ්චය සභා කාර්යාල ගොඩනැගිලි වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීම.

**iv.** ගිණුම් අංශය

අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තුවල සහ අධිකරණවල මූල්‍ය සැලසුම් කළමනාකරණය සහ පාලනය.

**v.** සැලසුම් අංශය

අමාත්‍යාංශයේ හා එය යටතේ පවතින දෙපාර්තමේන්තුවල කටයුතු පිළිබඳ ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම, ප්‍රගති පාලනය සහ සුපරීක්ෂණය.

**vi.** අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශයේ හා එය යටතේ පවතින දෙපාර්තමේන්තුවල සහ අධිකරණවල ගිණුම් විගණනය.

# 05. අධිකරණ අමාත්‍යාංශයේ එක් එක් අංශයන්හි ප්‍රගතිය

## 5.1 නීති අංශය

මෙම වසරේ 2014.12.31 වන විට නීති අංශය මගින් නව පනත් කෙටුම්පත් හා පනත් (සංශෝධන) සම්මත කිරිමේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

1. ළමා ආරක්ෂක පනත් කෙටුම්පත
   මෙම පනත් කෙටුම්පත මගින් ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් වර්තමානයට ගැලපෙන පරිදි ප්‍රතිපාදන සැළසීමට මෙන්ම යල්පැනගිය ළමා හා තරුණ පුද්ගලයින් සම්බන්ධ ආඥා පනත ඉවත් කිරීමට අපේක්ෂා කරයි. මේ මගින් අධිකරණය, පරිවාසය හා පොලීසිය අතර සහයෝගීතාවය වැඩි කිරීමට බලාපොරොත්තු වන අතර ළමයාගේ උපරිම සුභ සාධනය සැළසීමට අපේක්ෂා කරයි. මෙම පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පියවරගෙන ඇත.

2. කාලාවරෝධී විශේෂ විධිවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත
   1983 -2009 කාලය තුළ අවතැන්වූ හා අසාධාරණයට ලක්වූ දේපල හිමිකරුවන්ට කාලාවරෝධී ආඥා පනතේ ප්‍රතිපාදන මඟින් සහනයක් ලබාදීමට අපේක්ෂා කරයි. මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

3. කාලාවරෝධී අඥා පනතේ සංශෝධනය (15 වගන්තිය)
   මෙම පනත 2014 අංක 26 ලෙස පාර්ලිමේන්තුව මඟින් සම්මත කරන ලදී.

4. අශ්ශීල ප්‍රකාශන පනත් කෙටුම්පත
   පරිගණක අපරාධ පනතෙහි පරිගණක ආධාරයෙන් සිදු කරන ළමයින් පිළිබඳ අසභ්‍ය දර්ශනවලට අදාළ වගන්තියක් ඉවත්කර මෙම නව පනතට ඇතුළත් කර ඇත. මෙම පනත් කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුව මගින් සළකාබලමින් පවති.

5. 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනත සංශෝධනය
   ජාතික මානව හිමිකම් ක්‍රියාකාරි සැළැස්ම මගින් සිදු කල නිර්දේශයන් ඇතුළත් කරමින් මෙම පනත් කෙටුම්පත සකස් කර ඇත.

6. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභා (සංශෝධිත) පනත් කෙටුම්පත
   ජාතික මානව හිමිකම් ක්‍රියාකාරි සැළැස්ම මගින් සිදුකළ නිර්දේශයන් සැළකිල්ලට ගනිමින් මෙම පනත් කෙටුම්පත සකස් කර ඇත.

7. අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන් වෙත සහාය හා ආරක්ෂාව සැළැස්වීමේ පනත් කෙටුම්පත
   මෙම පනත මගින් අපරාධ වින්දිතයින් හා සාක්ෂි කරුවන් වෙත සහය හා ආරක්ෂාව සැළසීමේ ප්‍රතිපාදන සපයයි. මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අතර ශ්‍රේෂ්ඨාධිකරණයේදී අභියෝගයට ලක්කරන ලදි. මෙම පනත් කෙටුම්පත සඳහා 2015 වර්ෂයේදී පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට නියමිතය.

8. නොතාරිස් ආඥා පනත (සංශෝධන) පනත් කෙටුම්පත
   වංචා සහගත ඉඩම් ගනු - දෙනු සිදුවෙමින් පවතින නිසා නොතාරිස් ආඥා පනත සංශෝධනයට යොමු කර ඇත. මෙහිදී ඔප්පුවට අත්සන් තබන අවස්ථාවේදී ජීවමිතික අත්සන් උපයෝගී කර ගැනීම හා වංචා වැළැක්වීම සඳහා ප්‍රතිපාදන අන්තර්ගත කර ඇත. පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමෙන් පසු ව්‍යවස්ථාකරණය පිළිබද අමාත්‍ය අනුකාරක සභාවට යොමු

කරන ලදී. ඉන්පසු ව්‍යවස්ථාකරණය පිළිබඳ අමාත්‍ය අනුකාරක සභාවේ නිර්දේශ පනත් කෙටුම්පතට ඇතුලත් කරන ලදී. පසුව පනත් කෙටුම්පත රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

**9.** මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත

ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් පත් කරන ලද කමිටුව මගින් මුස්ලිම් විවාහ සහ දික්කසාද (සංශෝධන) පනත පිළිබඳ සාකච්ඡා කරමින් පවතී. පනත් කෙටුම්පත අධිකරණ අමාත්‍යාංශය මගින් සකස් කරමින් පවතී.

**10.** බන්ධනාගාර පරිපාලන පනත් කෙටුම්පත

මෙම පනත මගින් බන්ධනාගාර සිරකරුවන් පරිපාලනය කිරීමට අවශ්‍ය නව පාලන ක්‍රමයක් සඳහා විධිවිධාන සලස්වනු ලබයි. අවශ්‍ය සංශෝධන ඇතුලත් කිරීම සඳහා මෙම පනත් කෙටුම්පත බන්ධනාගාර හා පුනරුත්ථාපන අමාත්‍යාංශයට යොමු කල අතර ඉදිරිපත් කරන ලද යෝජනා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට යොමුකර ඇත.

**11.** සිවිල් නඩු කටයුතුවලදී දෙමව්පියභාවය පරීක්ෂා කිරීමේ පනත් කෙටුම්පත

මෙම පනත් කෙටුම්පත මගින් මාතෘත්වය හා පිතෘත්වය හඳුනා ගැනීමට ජාන පරීක්ෂණය (ඩී.එන්.ඒ) සිදුකිරීම සඳහා විධි විධාන සැළසේ. මෙම කෙටුම්පත ළමයින්ගේ භාරකාරත්වය, නඩත්තු සහ උරුමකාරත්වය වැනි කරුණු සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන සළසයි. පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කල අතර අමාත්‍ය මණ්ඩලය මගින් ප්‍රමාද කර ඇත.

**12.** අධිකරණ සංවිධාන (සංශෝධන) පනත (මහාධිකරණ විනිසුරුවන් සංඛ්‍යාව වැඩිකිරීම)

අමාත්‍ය මණ්ඩල සංදේශය කැබිනට් මණ්ඩලයට යොමු කිරීමෙන් පසු මහාධිකරණ විනිසුරුවන් සංඛ්‍යාව 92 දක්වා වැඩිකිරීමට නැවත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී. අමාත්‍ය මණ්ඩල සංදේශය සමඟ පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කල අතර අමාත්‍ය මණ්ඩලය මගින් ප්‍රමාද කර ඇත.

**13.** සිවිල් නඩු විධිවිධාන සංග්‍රහය ( පූර්ව නඩු විභාග /නඩු කටයුතු ) පනත් කෙටුම්පත

පනත් කෙටුම්පත ව්‍යවස්ථාකරණය පිළිබඳ කැබිනට් අනුකාරක සභාව වෙත ඉදිරිපත් කර එහි නිර්දේශ පනත් කෙටුම්පතට ඇතුලත් කිරීමෙන් පසු නීතිඥ සංගමයේ නිරීක්ෂණ සඳහා ඉදිරිපත් කර ඇත.

**14.** විදේශීය නඩු තීන්දු ක්‍රියාත්මක කිරීම

නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව මගින් යොමුකරන ලද පනත් කෙටුම්පත සළකා බලමින් පවතී.

**15.** අධිකරණයට අපහාස කිරීමේ පනත් කෙටුම්පත.

පනත් කෙටුම්පත සළකා බලමින් පවතී.

**16.** ඇටෝර්නි බලපත් (සංශෝධන) පනත් කෙටුම්පත.

වංචා වැළැක්වීම සඳහා මෙම අඥා පනත සංශෝධනය කරනු ලබයි. පනත් කෙටුම්පත සකස් කර ඇත.

**17.** අපරාධ වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත

උපලේඛනයට නිශ්චිත දැක්වෙන වැරදි ඇතුළත් කරමින් කෙටුම්පතක් සකස් කර ඇත. පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කර ඇත.

**18.** අපරාධ නඩු විධාන සංග්‍රහ (සංශෝධන) පනත් කෙටුම්පත
නඩු භාණ්ඩ ඉවත් කිරීම සඳහා ප්‍රතිපාදන සැළසීම පිණිස මෙම සංශෝධනයේ කෙටුම්පතක් සකස් කර ඇත.

**19.** අයාල ආඥා පනත (සංශෝධන) පනත් කෙටුම්පත
පනත් කෙටුම්පත සකස්කර ඇති අතර සාකච්ඡාවට බඳුන් වෙමින් පවතී.

- අනෙකුත් කටයුතු

- **2001 අංක 10 දරණ ජාත්‍යාන්තර ළමා අපහරණ පනත**

2001 අංක 10 දරණ පනත යටතේ, ළමා අපහරණය පිළිබඳ අයදූම්පත් 52ක් ලැබී ඇත. ඉන් බොහෝමයක්ම නඩු පැවරීමකින් තොරව සමථයකට පත් විය. දැනට මෙම පනත යටතේ මහාධිකරණයේ එක් නඩුවක් සහ අභියාචනාධිකරණයේ තවත් නඩුවක් විභාග වෙමින් පවතී. එක්සත් රාජධානියට ගෙනයන ලද ළමුන් දෙදෙනෙකු ශ්‍රී ලංකාවට ගෙන ඒමට කටයුතු කළ අතර සමථකරණය මත ඔවුන් ආපසු යවන ලදී. අයර්ලන්තයට ගෙනයන ලද ළමයෙකු ශ්‍රී ලංකාවට ගෙන ඒමට කටයුතු කළ අතර අධිකරණ නියෝගයක් මත ඔහු ආපසු යවන ලදී.

- වරදකරුවන් මාරුකිරීම

ශ්‍රී ලංකාව තුළදී වරදක් කර වැරදිකරුවෙකු බවට පත්වූ වෙනත් රටක පුර වැසියෙකු එරටට භාර දීම සහ වෙනත් රටකදී වරදකරුවකු වූ ශ්‍රී ලාංකික පුරවැසියෙකු ශ්‍රී ලංකාවට භාර දීම සම්බන්ධයෙන් 1995 අංක 5 දරණ මෙම පනත ක්‍රියාත්මකවේ. ඒ අනුව ඉන්දීය වරදකරුවන් 23 දෙනෙකු, පකිස්තානු වරදකරුවන් 50 දෙනෙකු සහ මාලදිවයින් වරදකරුවෙකු එම රටවලට භාරදී ඇත. එක්සත් රාජධානිය තුළ වරදකරුවන් වූ ශ්‍රී ලාංකිකයන් 02 දෙනෙකු ඔහුගේ සිර දඩුවම ක්‍රියාත්මක කිරීම සඳහා මෙම පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවට භාර දී ඇත. මාලදිවයිනේ සිටින ශ්‍රී ලාංකික සිරකරුවන් 10 දෙනෙකු නුදුරේදීම රැගෙන ඒම පිළිබඳ සාකච්ඡා කරමින් පවතී.
ශ්‍රී ලංකා රජය සහ වියට්නාම් රජය අතරද සිරකරුවන් මාරු කිරීමේ ගිවිසුමක් අත්සන් කරන ලදී.

- ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය පිහිටුවීම.

ශ්‍රී ලංකාවේ ප්‍රථම ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථාන පිහිටුවන බව 2011 දෙසැම්බර් මාසයේ දී අධිකරණ අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත්කරන ලදි. මෙම මධ්‍යස්ථානය මගින් යම් වානිජ ආරවුල් විසඳීම සඳහා අන්තර්ජාතික සමාගම් වෙත අවස්ථා උදා කරනු ඇත. ශ්‍රී ලංකාව, මෙම කලාපයේ පිහිටි ජාත්‍යාන්තර බේරුකරණ කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම රජයේ ද අපේක්ෂාවයි. මෙම ව්‍යාපෘතිය සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් මූලික වශයෙන් රුපියල් මිලියන 100 ක මුදලක් ආයෝජනය කර ඇත. ලෝක වෙළඳ මධ්‍යස්ථානය ව්‍යාපාරික කේන්ද්‍රස්ථානයක් මධ්‍යයේ පිහිටා තිබීමත් තරු

පන්තියේ හෝටල සහ ආපනශාලා මෙන්ම සංචාරක ආකර්ශනීය ස්ථාන වලට ඉතා සමීප වීමත්, ජාත්‍යන්තර බේරුම්කරණය සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් වලට ආසන්න වීමත් නිසා මෙම බේරුම්කරණ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සඳහා ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 6 වන මහළ තෝරාගන්නා ලදී.

මෙම මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා සමාගමක් ස්ථාපිත කරගැනීම පිණිස අවශ්‍ය පියවර ගෙන ඇත. දැනටමත් අදාල සමාගම පිහිටුවීමට අනුමැතිය අපේක්ෂාවෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත්කර ඇත. සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය අවසන් වශයෙන් සකස් කෙරෙමින් පවති. නොබෝ කලකින් බේරුම්කරණ කටයුතු සහ බේරුම්කරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, බේරුම්කරුවන් පුහුණු කිරීම වැනි බේරුම්කරණය ආශ්‍රිත අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා ද බේරුම්කරණ මධ්‍යස්ථානය විවෘත කෙරෙනු ඇත.

- විදේශ ගතව සිටින විත්තිකරුවන්ට ශ්‍රී ලංකාවේ උසාවිවලින් නිකුත් කරන සිතාසි භාර දීමේ සේවාව පිළිබඳ කරුණු

2000 අංක 39 දරණ සිවිල් හා වාණිජ කරුණු වලදී අන්‍යෝන්‍ය සහයෝගය පිළිබඳ පනතට අනුව 2014 ජනවාරි 01 සිට දෙසම්බර් 31 දක්වා කාලයට අදාලව ශ්‍රී ලංකාවේ උසාවි වලින් නිකුත් කරන ලද සිතාසි 1004 ක් පහත දක්වා ඇති පරිදි විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා විවිධ උසාවි වලට භාරදී ඇත.

| රට | නිකුත් කරන ලද සිතාසි සංඛ්‍යාව | රට | නිකුත් කරන ලද සිතාසි සංඛ්‍යාව |
|---|---|---|---|
| ඕස්ට්‍රේලියාව | 85 | ප්‍රංශය | 41 |
| කැනඩාව | 81 | ඉන්දියාව | 45 |
| සයිප්‍රසය | 11 | ජපානය | 27 |
| ජර්මනිය | 13 | කොරියාව | 18 |
| ඉතාලිය | 196 | ලෙබනනය | 05 |
| ජෝර්දානය | 28 | නවසීලන්තය | 02 |
| කුවේටය | 35 | සවුදි අරාබිය | 34 |
| මලයාසියාව | 11 | ස්විට්සර්ලන්තය | 24 |
| කටාර් | 43 | එක්සත් ආරාබි එමීර් රාජ්‍ය | 110 |
| සීෂෙල්ස් | 01 | ඇමෙරිකා එක්සත් ජනපදය | 62 |
| එක්සත් රාජධානිය | 129 | වෙනිසියුලාව | 01 |
| චීනය | 02 | | |

- අපරාධ කරුණු සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය නීති උපකාර ගිවිසුම්

අපරාධ කරුණු සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය නීති උපකාර කිරීමේ ගිවිසුමක් ශ්‍රීලංකා රජය හා බෙලරුස් රජය අත්සන් කර ඇත. විමර්ශනය, චෝදනා ඉදිරිපත් කිරීම, නඩු විභාග කිරීම සහ එහි ප්‍රතිඵලය ලෙස ඇති වන නීති කෘත්‍යයන් ඇතුළු සාපරාධී කාරණා වලදී එක් එක් පාර්ශවය වෙත අන්‍යෝන්‍ය නෛතික සහයෝගිතාව ලබා දීමේ අපේක්ෂාවෙන් බෙලරුස් ජනරජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මෙම අවබෝධතා ගිවිසුමට එළඹ ඇත. ශ්‍රී ලංකාවට මෙන්ම බෙලරුස් රාජ්‍යයට ද ප්‍රතිලාභ

අත්කර දෙන ආකාරයෙන් සහ මෙම රාජ්‍යයන්වල නීති සහ රාජ්‍යයන් දෙක විසින් පිළිගෙන ඇති හෝ අත්සන් කර ඇති ජාත්‍යාන්තර ගිවිසුම් වලට අනුකූල වන ආකාරයෙන්, දෙරටෙහි නීතිමය පද්ධතිය, ආයතන සහ ව්‍යවස්ථා සංවර්ධනය කිරීම ආශ්‍රිතව පවත්නා ගැටළු සම්බන්ධයෙන් නෛතික රාමුවක ස්වරූපයක් ගන්නා සහයෝගීතාවක් ඇති කිරීමට ක්‍රියා කිරීම ශ්‍රී ලංකාවේ රජය හා බෙලරුස් රජය අතර ඇති කර ගන්නා අවබෝධතා ගිවිසුමේ පරමාර්ථය වේ.

මීට අමතරව රුසියාව සමග අපරාධ කරුණු සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය නීති උපකාර හා සිරකරුවන් හුවමාරුව සම්බන්ධයෙන් ගිවිසුමක් ඇතිකර ගැනීමේ කටයුතු අවසන් කර ඇත. එමෙන්ම *BIMSTEC රටවල් අතර අන්‍යෝන්‍ය නීති උපකාර සම්බන්ධයෙන් ගිවිසුමද ඇතිකරගෙන ඇත. ශ්‍රී ලංකා රජය විසින් 2014 වර්ෂය තුළ චීනය, බෙලරුස්, සහ එකසත් අරාබි එමිර් රාජ්‍ය සමඟ අපරාධ කරුණු සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය නීති උපකාර කිරීමේ ගිවිසුම් වලට එළඹ ඇත.

***The Bay of Bengal Initiative for multi sectrorial Technical and Economic Coperation**

- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) - නීතිය බලාත්මක කිරීම සවිබල ගැන්වීම, යුක්තියට ප්‍රවේශය සහ සමාජ ඒකාබද්ධතාව පිළිබද ව්‍යාපෘතිය.

  2014 පෙබරවාරි මාසයේ දී සිය කාර්යභාරය ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය මඟින් කටයුතු රැසක් සම්පූර්ණ කර ඇති අතර, තවත් පියවර ගණනාවක් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබේ.

- නීතියේ ප්‍රමාදයන් අවම කිරීම මූලිකව ම අපේක්ෂා කරනු ලබන මෙම ව්‍යාපෘතිය මඟින් දරන ලද උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන්, නඩු වාර්තා දමිළ බසින් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම සඳහා අභියාචනාධිකරණයේ විශේෂ පරිවර්තන ඒකකයක් පිහිටුවා තිබේ. මෙම ඒකකය මඟින් නඩු වාර්තා 98ක් පමණ පරිවර්තනය කර ඇත.

- මෙම ව්‍යාපෘතියේ සහය ඇතිව ශ්‍රී ලංකා කණිෂ්ඨ නීතිඥ සංගමයේ ප්‍රථම නීතිඥ සංසදය දිවයින පුරා විසිරී සිටින කණිෂ්ඨ නිතිඥවරුන් දෙසීයකගේ සහභාගිත්වයෙන් (උතුරු පළාතේ නීතිඥවරුන් තිස්පස්දෙනෙකු ඇතුළුව) පවත්වනු ලැබූ අතර, එහි දී ගරු අග්‍රවිනිශ්චයකාර තුමා, ගරු නීතිපතිවරයා, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමිය, පොලිස්පතිතුමා සහ ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිවරයාගේ සහභාගීත්වයෙන් ඉහළ පෙළේ සාකච්ඡාවක් ද පවත්වන ලදී. නීතියේ ප්‍රමාදවීම් ඇතුළු ව අධිකරණ ක්ෂේත්‍රයේ පවතින ප්‍රධාන අභියෝග මෙම සංසදයේ අවධානයට පාත්‍ර විය.

- 2014 ජූලි මාසයේ දී, සියලුම ප්‍රධාන පෙළේ උනන්දුවක් දක්වන්නන්ගේ සහභාගීත්වයෙන් අධිකරණ විෂය සම්බන්ධ ජාතික මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කර ක්‍රියාත්මක කරන ලදී.

- ගාල්ල දිස්ත්‍රික්කයේ අධිකරණ නොවන කාර්යමණ්ඩලය ඉලක්ක කරගෙන ඵලදායිතාව නංවාලීමේ පුහුණු වැඩ සටහන පැවැත්වීම සඳහා මෙම ව්‍යාපෘතිය මඟින් අධිකරණ අමාත්‍යාංශයට සහාය දක්වන ලදී.

- යුක්තිය සඳහා ප්‍රවේශය නංවාලීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය මඟින් දණ්ඩ නීති සංග්‍රහය සහ අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සිංහල, දමිළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ම පෘථුලව එකාබද්ධ සළකා බැලීමක් සිදු කරමින් පවතියි.

- බන්ධනාගාර තුළ නීති ආධාර ලබා දීම සඳහා සහාය වීම පිළිබඳව සහ නීති ආධාර පිළිබඳ ව ජාතික ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් මෙම ව්‍යාපෘතිය විසින් නීති ආධාර කොමිෂම සමඟ මූලික සහ නිරන්තරව සාකච්ඡා ද පවත්වන ලදී.

- මඩකලපුව දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර එහිදී නඩු කළමනාකරණ කමිටුවක් පිහිටුවීම පිණිස මහාධිකරණ විනිශ්චයකාරවරයා, මහේස්ත්‍රාත්, පැමිණිලිකරු සහ පොලිසියේ සහභාගීත්වයෙන් මූලික රැස්වීම් පවත්වන ලදී.

- කණිෂ්ඨ නීතිඥවරුන් ඉලක්ක කරගෙන අපරාධ නීතිය සහ මහජන නීතිය සම්බන්ධයෙන් මෑත කාලීනව උද්ගත වූ ජාත්‍යාන්තර සංවර්ධන ප්‍රවණතාවන් පිළිබඳව පුහුණු වැඩසටහන සඳහා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ කනිෂ්ඨ ජාතික නීති සම්මන්ත්‍රණය පැවැත්වීම සම්බන්ධයෙන් නීතිඥ සංගමයට සහය ලබා දෙයි.

- රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රජා මූල විශෝධනය කිරීමේ යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යනයක් සිදු කරන ලදී.

- එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ සහයෝගිතාව ඇතිව ආරම්භ කරන ලද ළමා ආරක්ෂාව සහ ළමා අධිකරණ පිළිබඳ ව්‍යාපෘතිය.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ළමා අපයෝජන පිළිබඳ නඩු සම්බන්ධයෙන් ක්‍රියා කර ඒවා විභාග කොට අවසන් කිරිම, කඩිනම් කිරිම සහ ළමා අපයෝජනයට ගොදුරු වූවන් දෙවන වතාවටත් වින්දිතයින් බවට පත්වීම වැළක්වීමයි. මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධ ආයතනවලට නීතිපති දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව සහ සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළත්වේ. අදාළ ළමා අපයෝජන සිද්ධිය පිළිබඳ පැමිණිලි පොලිසියට ඉදිරිපත් කළ දිනයේ සිට වසරකට අඩු කාලයක් ඇතුළත ඊට අදාළ ළමා අපයෝජන නඩු සම්බන්ධයෙන් ක්‍රියාකර, එම නඩු විභාග කොට අවසන් කිරිම කඩිනම් කිරිම මෙම නව ක්‍රියාමාර්ගයෙන් අපේක්ෂා කරනු ලැබේ. එසේම අපරාධයට ගොදුරුවූ ළමා වින්දිතයින් පවතින අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට අවතීර්ණ වීම නිසා නැවත වතාවක් වින්දිතයින් බවට පත්වීම වැළක්වීම සාක්ෂාත් කර ගැනිමටද මෙම ව්‍යාපෘතියෙන් ඉලක්ක කරනු ලැබේ.

**2014.01.01** සිට **2014.12.31** දක්වා අධිකරණ අමාත්‍යාංශය විසින් පහත වැඩසටහන් පවත්වා ඇත.

- ගොඩගැසී තිබූ ළමා අපයෝජන නඩු ප්‍රමාණය අවසන් කිරීමට සහයෝගය ලබා දීම.
- අධිකරණ නවීකරණය කිරීමට සම්බන්ධව රැස්වීම් ගණනාවක් පැවැත්වීම.
- අලුතින් බඳවාගනු ලබන මහේස්ත්‍රාත්වරුන් සඳහා නීති පද්ධතිය තුළ ළමා ආරක්ෂණය පිළිබඳ හඳුන්වා දීමේ වැඩසටහන් පැවැත්වීම.
- අපරාධ වගකීම පැවරීම සඳහා අවම වයස නිශ්චය කිරීම පිළිබඳ වැඩමුළු පැවැත්වීම.
- උතුරු පළාතේ අධිකරණ නොවන උසාවි කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- නීතිපති දෙපාර්තමේන්තුව සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ සහයෝගය ඇතිව ජාලගත නඩු වාර්තා පරිශීලනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම.
- පවුල් උපදේශන පුහුණු වැඩසටහන් පැවැත්වීමට පියවර ගැනීම.

- ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන යෝජිත ව්‍යවස්ථා සහ ප්‍රතිපත්ති වාර්තා සම්බන්ධයෙන් අධ්‍යනය කිරීම සහ ඒ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ සභාපතීත්වය යටතේ 2011.08.03 වන දින ව්‍යාස්ථා සම්පාදනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව පත් කරන ලදී.

අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව යටතේ නිලධාරීන්ගේ කමිටුවක් පත්කරන ලද අතර එම නිලධාරී කමිටුව විසින් ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳව අධ්‍යනය කොට සිය තීරණ සහ නිර්දේශ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙත වාර්තා කරනු ලැබේ.

අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරිය ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ කැඳවුම්කරු වන අතර ව්‍යවස්ථා සම්පාදනය සම්බන්ධයෙන් නිලධාරි මට්ටමෙන් විශ්ලේෂණ සහ නිර්දේශ සිදුකරනු ලබන්නේ අධිකරණ අමාත්‍යාංශයේදීය. බොහෝ විට මෙම නිර්දේශ ව්‍යවස්ථා කෙටුම්පතක් ආකාරයෙන් ක්‍රියාත්මක කෙරේ.

අනතුරුව, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් නිලධාරීන්ගේ කමිටුවේ නිර්දේශ කියවා බලා කාරක සභාවේ නිර්දේශ සඳහන් කරනු ලබයි. අධිකරණ අමාත්‍යාංශය විසින් මෙම නිර්දේශ සංග්‍රහ කොට අවශ්‍ය කටයුතු සඳහා අදාළ අමාත්‍යාංශය වෙත යවනු ලැබේ.

- මිනිස් ජාවාරමට එරෙහි ජාතික කාර්ය සාධක බලකාය

2010 වර්ෂයේදී, අධිකරණ අමාත්‍යාංශය විසින් මිනිස් ජාවාරමට එරෙහි ජාතික කාර්ය සාධක බලකාය පිහටුවන ලද අතර, ශ්‍රීලංකාව තුළ මිනිස් ජාවාරමට එරෙහිව සිදුකරන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම සහ එම කටයුතු අධීක්ෂණය කිරීම පිණිස මෙම කාර්ය සාධක බලකාය ජාතික සම්බන්ධීකරණ ආයතනය වශයෙන් කටයුතු කරනු ලබයි. නඩු කටයුතු පැවරීම වේගවත් කිරීම සහ වින්දිතයන්ගේ ආරක්ෂාව දැඩි කිරීම පිණිස රජයේ ප්‍රධාන පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය සවිබල ගැන්වීම මෙම ජාතික කාර්ය සාධක බලකායේ අරමුණයි. රට තුළ සිදුවන මිනිස් ජාවාරම් වලට විසඳුම් සැපයීම සම්බන්ධයෙන් වගකිව යුතු ආයතන වශයෙන් හඳුනා ගන්නා ලද සියළුම රාජ්‍ය ආයතනයන්හි නියෝජිත වරුන්ගෙන් මෙම ජාතික කාර්ය සාධක බලකාය සමන්විත වේ.

මිනිස් ජාවාරම්හි වින්දිතයන් බවට පත්වන කාන්තාවන් සඳහා නිවහනක් ස්ථාපිත කිරීම දැඩි ජාතික අවශ්‍යතාවයක් වන බව කාර්ය සාධක බලකාය විසින් හඳුනා ගන්නා ලද අතර , ඒ අනුව ළමා සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් එම නිවහන 2012 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී.

මෙම ජාතික කාර්ය සාධක බලකායේ ප්‍රධානතම කාර්යයන් වන්නේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සංවර්ධනය කිරීමයි. මෙම ජාතික කාර්ය සාධක බලකාය විසින් 2011, 2012, 2013 සහ 2014 වර්ෂ සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කරන ලද අතර සාමාජිකයන් විසින් ඒවා සාර්ථක අයුරින් ක්‍රියාවට නංවා ඇත. මීට අමතරව 2015-2018 කාලසීමාව සඳහා අදාල කාර්යයන් ස්ථාපිත කරමින් "උපාය මාර්ගික සැලසුමක්" අවසන් අදියරේ සකස් කරමින් පවති.

මිනිස් ජාවාරමේ වින්දිතයන් බවට පත්වන්නන් බඳවා ගැනීම, ඔවුන් උපදෙස් සඳහා විශේෂඥයෙකු වෙත යොමු කිරීම සහ ආරක්ෂාව සැපයීම වැඩිදියුණු කිරීම සඳහා සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටියක් කාර්ය සාධක බලකාය විසින් හඳුන්වාදෙන ලද අතර එය අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් අනුමත කර ඇත. මිනිස් ජාවාරම් පිළිබඳව මහජනතාව සහ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධයෙන් ද කාර්ය සාධක බලකාය විසින් අදාල සමාජීක ආයතන අධීක්ෂණය කරනු ලබයි.

- අධිකරණ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය.

 අධිකරණ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය **www.justiceministry.gov.lk**

## 5.2 පාලන හා ආයතන අංශය

අධිකරණ අමාත්‍යාංශය, ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු, ආයතන හා අධිකරණ සඳහා ප්‍රශස්ථ මෙන්ම පුහුණු මානව සම්පතක් ලබා දීම සහතික කිරීම ආයතන හා පාලන අංශයේ ප්‍රධාන අරමුණ වේ. ඒ යටතේ අවශ්‍ය කරන කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීම, බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීම, තෝරා ගැනිම, බඳවා ගැනිම, පුහුණු කිරිම, ස්ථාන මාරුකිරීම, උසස් කිරීම හා විනය කටයුතු මෙම අංශයෙන් ඉටු කරනු ලබයි. මේ යටතේ අධිකරණ අමාත්‍යාංශයේ ඍජු පාලනයට යටත්වන කාර්ය මණ්ඩලයේ **215** කගේ සහ අධිකරණවල කාර්ය මණ්ඩලය **3697** ක ගේ පරිපාලන කටයුතු මෙම අංශයෙන් ඉටුවේ.

මීට අමතරව ඉහත සඳහන් සියළු ආයතනවල සේවකයින්ගේ අතිකාල, ගමන් වියදම්, ණය හා අත්තිකාරම් අධිකරණ මගින් රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ වෙන්දේසි, රජයේ නිලධාරින් ගේ ඇප අනුමත කිරීමද මෙම අංශයෙන් ඉටුවේ.

තවද, හදිසි මරණ පරීක්ෂක, සාමවිනිසුරුවරු හා නිල නොලත් මහෙස්ත්‍රාත්, දිවුරුම් කොමසාරිස්වරුන් පත් කිරීම, දිවුරුම් දුන් භාෂා පරිවර්තකයින් පත් කිරීම සඳහා අදාළ නිර්දේශ ලබා දිම ද මෙම අංශයෙන් ඉටුකරනු ලබයි.

**2014.01.01** සිට **2014.12.31** දින දක්වා කාලය තුළ මෙම අංශයෙන් ඉටු කරන ලද සේවාවන් පහත පරිදිවේ.

- තනතුරු ඇති කිරීම

මුදල් රෙගුලාසි **71** යටතේ ඉහත කාලය තුළ අළුතින් ඇති කරන ලද තනතුරු පහත පරිදි වේ.

| ආයතනය | මාණ්ඩලික ශ්‍රේණිය | සමාන්තර සේවා | කණිෂ්ඨ සේවක | එකතුව |
|---|---|---|---|---|
| අධිකරණ අමාත්‍යාංශය | 08 | 08 | 40 | 56 |
| අධිකරණ | - | - | 73 | 73 |
| රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | 99 | 113 | 79 | 291 |
| නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | 07 | 15 | 07 | 29 |
| ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව | 01 | 14 | 04 | 19 |
| කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය | 42 | 295 | 152 | 489 |
| අධිකරණ නොවන නිලධාරින්ගේ පුහුණු ආයතනය | 01 | 05 | 04 | 10 |
| විනිසුරු පුහුණු ආයතනය | 07 | 08 | 08 | 23 |
| උපරිමාධිකරණ කලමනාකරණ මණ්ඩලය | 15 | 102 | 60 | 177 |
| ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ටාර් කාර්යාලය | 22 | 84 | 74 | 180 |
| සමථ මන්ඩල කොමිෂන් සභාව | 05 | 124 | 07 | 136 |
| මුළු එකතුව | | | | 1483 |

- බඳවා ගැනිමේ පටිපාටි සකස් කිරිම සහ බඳවා ගැනිමේ පටිපාටි අනුමත කරවා ගැනිම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා මෙම කාලය තුළ බඳවා ගැනීමේ පටිපාටි **03** ක් ඉදිරිපත් කර ඇත.

බඳවා ගැනීමේ පටිපාටි 01 ක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත.

- බඳවා ගැනීම සහ පත් කිරීම

- බඳවා ගැනීම

| ආයතනය | තනතුර | බඳවාගත් සංඛ්‍යාව |
|---|---|---|
| අධිකරණ අමාත්‍යාංශය | අධ්‍යක්ෂ (ඉංජිනේරු) | 01 |
| | රියදුරු | 02 |
| | භාෂා පරිවර්තන අධිකාරි | 01 |
| අධිකරණ අමාත්‍යාංශය (අධිකරණ සඳහා) | සිතාසි බෙදන්නා හා ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා | 08 |
| කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය | ලඝු ලේඛක (සිංහල මාධ්‍යය) | 62 |
| | ලඝු ලේඛක (ඉංග්‍රීසි මාධ්‍යය) | 01 |
| සමථ මණ්ඩල කොමිෂන් සභාව | රියදුරු | 01 |

- පත් කිරීම්

ගරු අධිකරණ අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කරන ලද පත් කිරීම් සහ නිර්දේශයන් පහත පරිදි වේ.

| තනතුර | පත්කිරීම් සංඛ්‍යාව |
|---|---|
| දිවුරුම් කොමසාරිස් | 255 |
| හදිසි මරණ පරීක්ෂක | 28<br>තාවකාලික පත්කිරීම් 18 |
| සාමවිනිසුරු හා නිල නොලත් මහේස්ත්‍රාත් | 43 |
| සාම විනිසුරු | 4514 |
| *දිවුරුම් දුන් භාෂා පරිවර්තක | 70 |

*දිවුරුම් දුන් භාෂා පරිවර්තකවරුන් නිර්දේශ කිරීම සඳහා

| පැවැත්වූ විභාග සංඛ්‍යාව | | පෙනී සිටි අපේක්ෂකයින් සංඛ්‍යාව |
|---|---|---|
| දිවුරුම් දුන් භාෂා පරිවර්තකයින් බඳවා ගැනීමේ විභාගය (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන් සඳහා) | 02 | 299 |

- පුහුණු කිරීම්

දේශීය

| පුහුණුවේ ස්වභාවය | නිලධාරි සංඛ්‍යාව |
|---|---|
| විෂයානු බද්ධ | 76 |
| භාෂා දැනුම<br>දෙමළ භාෂාව | 160 |
| මානව හිමිකම් ඩිප්ලෝමාව | 25 |
| අභිප්‍රේරණ | 02 |

විදේශීය

| පුහුණුවේ ස්වභාවය | නිලධාරි සංඛ්‍යාව |
|---|---|
| පුහුණු (විනිසුරුවරුන් ඇතුළුව) | 208 |
| සම්මන්ත්‍රණ | 11 |

- ණය අනුමත කිරීම

| ණය අනුමත කිරීම | | |
|---|---|---|
| ණය වර්ගය | සංඛ්‍යාව | මුදල (රු) |
| දේපළ/නිවාස | 102 | 137,615,940 |
| වාහන | - | - |
| ආපදා | 72 | 5,089,886 |
| උත්සව | 163 | 815,000 |
| විශේෂ | 68 | 170,000 |
| පාපැදි | - | - |

- වෙන්දේසි කිරීම
- විනිසුරුවරුන්ගේ සුව සම්පත රක්ෂණ ක්‍රමය

| වෙන්දේසි සංඛ්‍යාව | ආදායම (රු) |
|---|---|
| 130 | 40,871,625 |

- නිල රථ රක්ෂණය කිරීම

| ආයතනය | නිල රථ සංඛ්‍යාව | | මුදල (රු) |
|---|---|---|---|
| අමාත්‍ය කාර්ය මණ්ඩලය | 10 | (පූර්ණ) | 1,447,883.00 |
| අධිකරණ නිලධාරීන්ගේ නිල රථ | 157 | (පූර්ණ) | 8,825,631.03 |
| | 03 | (තුන්වන පාර්ශව) | 3,467.56 |
| අමාත්‍යාංශයේ නිල රථ | 20 | (පූර්ණ) | 926,502.63 |
| | 06 | (තුන්වන පාර්ශව) | 8,455.47 |

- වෙනත් කාර්යයන්

- අධිකරණ ආරක්ෂක 158, පිස්කල් භාරකාරමාතා 10, සිතාසි බෙදන්නා හා ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා 46 සහ සෝෂක ප්‍රවේශක 03 දෙනෙකු සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම.
- අධිකරණ කාර්ය මණ්ඩලය සඳහා ඵලදායිතා සංකල්පය හඳුන්වා දීම.
  ඒ අනුව ,කොළඹ, ගාල්ල, මාතර, තංගල්ල , හම්බන්තොට යන අධිකරණ කලාපවලට අයත් අධිකරණ 31 ක සහ අධිකරණ අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා ඵලදායිතා සංකල්පය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- මේ වන විට ඵලදායිතා සංකල්පය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඒ අනුව කටයුතු කර ඇති අම්පාර, කල්මුණේ, මඩකලපුව, පොළොන්නරුව, ත්‍රිකුණාමලය,කුරුණෑගල, කෑගල්ල, හලාවත සහ පුත්තලම යන අධිකරණ කලාපවලට අයත් අධිකරණ සඳහා ඵලදායිතා සම්මාන ලබාදීම.


## 5.3 යටිතල පහසුකම් අංශය

**අධිකරණ අමාත්‍යාංශයේ යටිතල පහසුකම් අංශය මගින් අධිකරණ පද්ධතිය සඳහා අවශ්‍ය නව අධිකරණ සංකීර්ණ හා විනිශ්චයකාරවරුන්ගේ නිල නිවාස ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම, නඩත්තු කටයුතු මෙන්ම ඉඩම් පවරා ගැනීම වැනි වැදගත් කාර්යභාරයන් රාශියක් ඉටු කරනු ලබයි.**

**2014 .01.01 සිට 2014.12.31 කාලය තුළ ඉදිකිරීම් අවසන් කරන ලද ව්‍යාපෘති**




**01.** මඩකලපුව නව අධිකරණ සංකීර්ණය.




**02.** සමන්තුරේ මහේස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල

**03.** කැකිරාව දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ කාර්යාලය, ලේඛනාගාරය සහ නඩු භාණ්ඩ කාමරය

**04.** උඩුගම මහේස්ත්‍රාත් අධිකරණ කාර්යාල ගොඩනැගිල්ල

**05.** බිබිල මහේස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල

**06.** වෙල්ලමනල් කාති උසාවි

**07.** කල්පිටිය මහේස්ත්‍රාත් අධිකරණ සංකීර්ණය ඉදිකිරීම්

**08.** පොල්ගහවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ කාර්යාලය, ලේඛනාගාරය සහ නඩු භාණ්ඩ කාමරය ඉදිකිරීම්

## 2014.01.01 සිට 2014.12.31 කාලය තුල ඉදිකිරීම් ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති






01. ගාල්ල අධිකරණ සංකීර්ණය





02. වත්තල අධිකරණ සංකීර්ණය




03. හෝමාගම අධිකරණ සංකීර්ණය ඉදිකිරීම
04. කොළඹ ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය
05. ගලගෙදර අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම
06. ඇල්පිටිය මහේස්ත්‍රාත් අධිකරණ කාර්යාලය හා ලේඛනාගාරය ඉදිකිරිම
07. හිඟුරක්ගොඩ දිසා/මහේස්ත්‍රාත් අධිකරණ ලේඛනාගාරය හා නඩු භාණ්ඩ කාමරය ඉදිකිරීම
08. මහියංගනය මහේස්ත්‍රාත් අධිකරණ ලේඛනාගාරය හා නඩු භාණ්ඩ කාමරය ඉදිකිරීම
09. මුතූර් මහේස්ත්‍රාත් අධිකරණය ඉදිකිරීම
10. නාවුල මහේස්ත්‍රාත් අධිකරණයේ ලේඛනාගාරය හා නඩු භාණ්ඩ කාමරය ඉදිකිරීම
11. නොච්චියාගම සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය ඉදිකිරීම
12. මාතර අධිකරණ සංකීර්ණය ඉදිකිරීම

13. පුත්තලම මහාධිකරණ විනිසුරු නිළ නිවාසය ඉදිකරීම
14. කැස්බෑව, ගල්ගමුව, තිස්සමහාරාමය, හෙට්ටිපොල, නිකවැරටිය හා ආනමඩුව අධිකරණ වල නඩු භාණ්ඩ කාමර හා ලේඛනාගාර ඉදිකිරීම.
15. වැල්ලවාය මහේස්ත්‍රාත් අධිකරණයේ කාර්යාලය හා නඩු භාණ්ඩ කාමරය ඉදිකිරීම

**2014.01.01 සිට 2014.12.31 කාලය තුළ නවීකරණය කර ඇති ගොඩනැගිලි**

01. කෑගල්ල විනිසුරු නිල නිවාසය අලුත් වැඩියාව
02. වත්තල මහේස්ත්‍රාත් අධිකරණය අලුත් වැඩියාව
03. මහර අධිකරණ සංකීර්ණයේ නඩු භාණ්ඩ කාමරය හා ආරක්ෂක මුරපොල අතිරේක අධිකරණ ගොඩනැගිල්ලක් බවට පරිවර්ථනය කිරීම
04. හෝමාගම දිසා මහේස්ත්‍රාත් අධිකරණය අලුත් වැඩියාව
05. පානදුර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ කාමරය හා ආරක්ෂක මුරපොල අතිරේක අධිකරණ ගොඩනැගිල්ලක් බවට පරිවර්ථනය කිරීම
06. නුවරඑළිය දිසා විනිසුරු නිළ නිවස අලුත් වැඩියාව
07. මාතර දිසා විනිසුරු නිළ නිවස අලුත් වැඩියාව
08. දෙහිඅත්තකන්ඩිය මහේස්ත්‍රාත් අධිකරණය අලුත් වැඩියාව
09. සියඹලාන්ඩුව සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය අලුත් වැඩියාව
10. කන්තලේ මහේස්ත්‍රාත් අධිකරණය අලුත් වැඩියාව
11. වරකාපොළ දිසා විනිසුරු නිළ නිවස අලුත් වැඩියාව
12. පොළොන්නරුව මහාධිකරණ විනිසුරු නිළ නිවස අලුත් වැඩියාව

**2014.12.31 වනවිට මූල්‍ය ප්‍රගතිය (228-01-01)**

| | විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|---|
| **2104** | ගොඩනැගිලි ඉදිකිරීම | **627,800,000** | **526,218,073** |
| | 1. ගාල්ල අධිකරණ සංකීර්ණය | 100,000,000 | 137,641,482 |
| | 2. හෝමාගම අධිකරණ සංකීර්ණය | 100,000,000 | 110,652,027 |
| | 3. වත්තල අධිකරණ සංකීර්ණය | 50,000,000 | 33,252,564 |
| | 4. මඩකලපුව අධිකරණ සංකීර්ණය අදියර - 1<br>අදියර - 11 | 80,000,000 | 11,575,755<br>8,615,510 |
| | 5. ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය | 67,500,000 | 39,224,886 |
| | 6. ගලගෙදර අධිකරණ ගොඩනැගිල්ල | 5,000,000 | 12,532,566 |
| | 7. කුඩා පරිමාන සංවර්ධන ව්‍යාපෘති | 225,300,000 | 172,723,283 |
| **2001** | ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය | **160,000,000** | 174,606,528 |
| | මුළු මුදල | 787,800,000 | 700,824,601 |

## 5.4 ගිණුම් අංශය

අධිකරණ අමාත්‍යාංශයේ ගිණුම් කටයුතුවල කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වර්ධනය කිරීම පිණිස අමාත්‍යාංශ පාලන හා අධිකරණ පාලන වැය ශීර්ෂයන් යටතේ පහත සඳහන් පරිදි ගිණුම් විධිමත් කිරීමේ කටයුතු **2014** වර්ෂයේ සිදුකර ඇත.

මේ සඳහා මහා භාණ්ඩාගාරය විසින් පහත ආකාරයෙන් ප්‍රතිපාදන ලබා දෙනු ලැබේ.

1. ගරු අමාත්‍යතුමාගේ කාර්යාලය
2. අමාත්‍යාංශ පරිපාලනය
3. අධිකරණ පරිපාලනය
4. සමථ මණ්ඩල කොමිෂන් සභාව
5. නීති ආධාර කොමිෂන් සභාව / ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය

**2014.01.01** සිට **2014 .12 .31** දක්වා ප්‍රගතිය

අමාත්‍යාංශ පරිපාලන ශීර්ෂ **110 - 1, 2 , 3**

| විස්තරය | ඇස්තමේන්තුව (රුපියල්) | වියදම (රුපියල්) |
|---|---:|---:|
| පුනරාවර්තන වියදම් | **600,196,050** | **559,117,600** |
| ප්‍රාග්ධන වියදම් | **153,146,950** | **88,342,651** |
| මුළු එකතුව | **753,343,000** | **647,460,251** |

අධිකරණ පරිපාලන **228 - 1, 2**

| විස්තරය | ඇස්තමේන්තුව (රුපියල්) | වියදම (රුපියල්) |
|---|---:|---:|
| පුනරාවර්තන වියදම් | **4,075,550,000** | **4,053,688,052** |
| ප්‍රාග්ධන වියදම් | **1,026,900,000** | **877,423,341** |
| මුළු එකතුව | **5,102,450,000** | **4,931,111,393** |

## 5.5 සැලසුම් අංශය

සැලසුම් අංශය මගින් අධිකරණ අමාත්‍යාංශය, ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතන වලට අදාලව සැලසුම් කිරීම, ව්‍යාපෘතිවල පසු විපරම් කටයුතු මෙන්ම පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබේ.

- අමාත්‍යාංශය සඳහා වාර්ෂික මූලධන අයවැය ඇස්තමේන්තුව පිළියෙල කිරීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
- ඊට අදාළ ත්‍රෛයිමාසික ප්‍රගතිය සකස් කිරීම සහ අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.
- අධිකරණ ගොඩනැගිලි ඉදිකිරීම පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කිරීම.
- වාර්ෂික කාර්යය සාධන වාර්තාව සකස් කිරීම.
- ප්‍රගති වාර්තාව පිළියෙල කිරීම. (ඉදිරි වර්ෂයේ ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම)
- නඩු සම්බන්ධ සංඛ්‍යා ලේඛන රැස් කිරීම.
- නඩු පිළිබඳ වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම.
- ව්‍යාපෘති වාර්තා පිළියෙල කිරීම සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් ලබා ගැනීමට කටයුතු කිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල වාර්ෂික විගණන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීම.
- අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්වල ප්‍රගති සමාලෝචන සහ පසු විපරම් කටයුතු සිදුකිරිම.
- අධිකරණ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන දිස්ත්‍රික් මට්ටමේ සහ ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමග සම්බන්ධීකරණය කිරීම.
- දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයේ අමාත්‍යාංශ ප්‍රදර්ශන කුටි සකස් කිරිම.
- පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
- පාර්ලිමේන්තු ප්‍රශ්න සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

## 5.7 අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ පවත්නා දෙපාර්තමේන්තු, උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය, විනිසුරු පුහුණු ආයතනය සහ නීති ආධාර කොමිෂන් සභාව යන ව්‍යවස්ථාපිත ආයතන තුනත්, අමාත්‍යංශ පරිපාලන වැය විෂයේ සහායක ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක වන සමථ මණ්ඩල කොමිෂන් සභාවත් අධිකරණ පරිපාලන වැය විෂයේ සහායක ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක වන කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයත් අධිකරණ පරිපාලන වැය ශීර්ෂය යටතේ වන මහාධිකරණ, සිවිල් අභියාචනා මහාධිකරණ, දිසා අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණ වල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය කටයුතු කරනු ලැබේ.

අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය ප්‍රධාන අභ්‍යන්තර විගණක, ගණකාධිකාරි (අභ්‍යන්තර විගණන), මුල්‍ය සහකාර නිලධාරින් 06 ක්, සංවර්ධන නිලධාරින් 06ක්, සහ කළමණාකාරණ සහකාර නිලධාරින් 5 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම නිලධාරින් ක්‍රම විගණනය කෙරෙහි විශේෂ අවධානයකින් යුක්තව ඉහත සඳහන් ආයතනවල අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරනු ලබන අතර 2014 ජනවාරි 01 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා මහාධිකරණ 13 ක්, දිසා/මහේස්ත්‍රාත් අධිකරණ 21ක්, දිසා අධිකරණ 18ක්, මහේස්ත්‍රාත් අධිකරණ 24ක්, දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතන 12 ක් සහ විශේෂ විමර්ශන 01ක් ආදි වශයෙන් සම්පූර්ණ විගණන පරීක්ෂණ 89ක් සිදුකර ඇත.

## 6.7 අධිකරණ නොවන නිලධාරින්ගේ පුහුණු ආයතනය

දැක්ම

අධිකරණ අමාත්‍යාංශයේ අංශයක් ලෙස ක්‍රියාත්මක වන බැවින් අමාත්‍යාංශයේ දැක්ම මෙම ආයතනය සඳහා ද අදාල වේ.

මෙහෙවර

අධිකරණවල සේවයේ නියුතු විනිසුරුවරුන් හැර අනෙකුත් උපලේඛනගත හා උපලේඛනගත නොවන නිලධාරින් පුහුණු කිරීම තුළින් අධිකරණ සේවයේ කාර්යක්ෂමතාවය සහ ගුණාත්මකභාවය ඉහළ නංවා නඩු විසඳීමේ යාන්ත්‍රණයේ ඇති ප්‍රමාදයන් අවම කර ජනතාවට වඩා යහපත් සේවයක් ලබා දීම.

අධිකරණවල සේවය කරන අධිකරණ නොවන නිලධාරීන් පුහුණු කිරීම අරමුණුකර ගනිමින් 2010 වර්ෂයේ බත්තරමුල්ල - පැලවත්තේ පිහිටි අධිකරණ ගොඩනැගිල්ලෙහි මෙම අංශය ස්ථාපිත කරන ලදී. මෙම ආයතනය මගින් මේ වන විට අධිකරණ ක්ෂේත්‍රයේ රාජකාරි සිදුකරන නිලධාරින් සහ සේවකයන් පුහුණු කිරීමේ වැඩසටහන් ගණනාවක් පහත අරමුණු මුල්කර ගනිමින් පවත්වා ඇත.

**01.** ආකල්ප හා විනය සංවර්ධනය
**02.** රාජකාරිය පිළිබඳ අවබෝධය
**03.** නව්‍යකරණය හා නිර්මාණකරණය
04. අල්ලස හා දූෂණය මැඩලීම

**2014** ජනවාරි **01** සිට දෙසැම්බර් **31** දක්වා පහත සඳහන් පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

| අංකය | පුහුණු වැඩසටහන | පැවැත්වූ වැඩසටහන් ගණන | පුහුණුවූ පුහුණුලාභීන් ගණන | පුහුණුලාභීන් සහභාගි කර වූ අධිකරණ කලාපයන් |
|---|---|---|---|---|
| **01** | කාර්යාල කාර්ය සහයක තනතුරේ නිලධාරින් පුහුණු කිරීමේ වැඩසටහන | **26** | **495** | කොළඹ,කළුතර, ගම්පහ, රත්නපුර,අවිස්සාවේල්ල,මීගමුව, ගාල්ල,කෑගල්ල,කුරුණෑගල,මාතර, මහනුවර, ඇඹිලිපිටිය, සහ තංගල්ල |
| **02** | සිතාසි බෙදන්නන් හා ඇස්කිසි ක්‍රියාත්මක කරන නිලධාරින් | **06** | **108** | ගාල්ල,අවිස්සාවේල්ල, සහ මීගමුව,රත්නපුර,මහනුවර |
| **03** | කලාප පුහුණු වැඩසටහන් | **06** | **521** | කළුතර, මීගමුව,මාතර |
| **04** | අධිකරණ ලිපිකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | **02** | **40** | අවිස්සාවේල්ල, මීගමුව, ගාල්ල මාතර, කුරුණෑගල, මහනුවර, හම්බන්තොට, ඇඹිලිපිටිය |
| **05** | ගෙවීම් කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | **08** | **181** | කොළඹ, කළුතර,මාතර,ගාල්ල කුරුණෑගල, අවිස්සාවේල්ල, රත්නපුර, මහනුවර, කුලියාපිටිය, ගම්පහ |
| **06** | භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන | **08** | **169** | කොළඹ,කළුතර, ගම්පහ, ගාල්ල, මාතර, කුරුණෑගල,කොළඹ, මීගමුව, හලාවත,කෑගල්ල |
| **07** | පෞද්ගලික ලිපිගොනු පිළිබඳ පුහුණු වැඩසටහන | **06** | **135** | අවිස්සාවේල්ල, මීගමුව, ගාල්ල, මාතර,කුරුණෑගල,මහනුවර, රත්නපුර |
| **08** | ලඝු ලේඛක පුහුණු වැඩසටහන | **04** | **34** | කොළඹ, අවිස්සාවේල්ල, |
| **09** | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන | **06** | **91** | මීගමුව, ගම්පහ, කොළඹ, කළුතර, ගාල්ල, අවිස්සාවේල්ල, කුරුණෑගල, කෑගල්ල |
| **10** | ගිණුම් අංශයේ නිලධාරීන් සඳහා පැවති පුහුණු වැඩසටහන | **01** | **25** | _ |
| **11** | විනය කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | **04** | **75** | අවිස්සාවේල්ල, කළුතර, පානදුර, ගාල්ල, |

# 06. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතනවල ප්‍රගතිය

## 6.1 ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

**දැක්ම**
**සාධාරණ සහ නීති ගරුක සමාජයක් ගොඩනැගීම.**

**මෙහෙවර**
**අධිකරණ, නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ වෙනත් ආයතනවලට අධිකරණ විද්‍යා සහ ආහාර විද්‍යා ක්ෂේත්‍රයන් සම්බන්ධ විශ්ලේෂණ, විශේෂඥ සහ උපදේශක සේවාවන් සැපයීම.**

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව අධිකරණ විද්‍යා අංශය සහ ආහාර විද්‍යා අංශය යන ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වන අතර එය ලංකාවේ ඇති එකම අධිකරණ විද්‍යා රසායනාගාරය වේ. ආහාර විද්‍යා අංශය, ආහාර හා මධ්‍යසාර, කිරි හා ජලය යනුවෙන් වූ විද්‍යාගාර හතරකින් ද අධිකරණ විද්‍යා අංශය, ප්‍රක්ෂිප්ත විද්‍යා, පුපුරණ ද්‍රව්‍යය, ගිණි විශ්ලේෂණ, මත්ද්‍රව්‍ය අංශය, මස්තු විද්‍යා, අධිකරණ ධූලක විද්‍යා, සැක කටයුතු ලේඛන අංශය, විවිධ අංශය යනුවෙන් ප්‍රධාන අංශ හතකින්ද යනුවෙන් අනු අංශ 11කින් සමන්වික වේ. මෙය සේවාවන් සඳහා වෙන්වූ දෙපාර්තමේන්තුවක් වන අතර උසාවි, පොලිස්, රේගුව, සුරාබදු, පළාත් පාලන ආයතන, සෞඛ්‍ය, වරාය, වෙනත් රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන මගින් යොමුකරනු ලබන නඩුභාණ්ඩ විද්‍යාත්මක පරීක්ෂණයන්ට ලක් කිරීම සහ ඒවා පිළිබඳ වාර්තා නිකුත් කිරීම කරනු ලැබේ. මීට අමතරව විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු සහ රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන ආදර්ශ තත්වපාලන කටයුතු පිළිබඳ පරීක්ෂා කරනු ලබන අතර ශ්‍රී ලංකා රේගුව යොමු කරන ආදර්ශ තත්වපාලන කටයුතු සහ තීරු බදු වර්ගීකරණය යන කරුණු දෙකම උදෙසා පරීක්ෂා කරනු ලබයි. තවද අධිකරණ මගින් ඉදිරිපත් කරනු ලබන සැක සහිත ලේඛන පරීක්ෂා කිරීම හා වාර්තා කිරීමද මෙම දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරනු ලබයි.

පරීක්ෂණ සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම නඩු භාණ්ඩ හෝ වෙනත් ආදර්ශ, ආහාර හා ඖෂධ පනත, ජාතික පාරිසරික පනත , සුරාබදු ආඥා පනත , දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනත, සුවඳ විලවුන් උපකරණ හා ඖෂධ පනත, පලිබෝධනාශක පාලනය කිරීමේ පනත, ගිනි අවි ආඥා පනත, පුපුරණ ද්‍රව්‍ය පනත, විෂවර්ග, අබිං සහ අන්තරායකාර ඖෂධ පනත, තහනම් පිහි පනත, මොටර් වාහන පනත, අපාරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය, සාක්ෂි අඥාපනත වැනි විවිධ අණ පනත් යටතේ පරීක්ෂණයන්ට භාජනය කර වාර්තා නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුවෙන් සිදු කෙරේ.

මෙවැනි සේවා සැපයීමට අමතරව මෙම දෙපාර්තමේන්තුවේ සිටින විවිධ ක්ෂේත්‍රවල නිපුණතා ලබා ඇති විද්‍යාඥයින් විසින් රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතනවලට විද්‍යාත්මක උපදේශනයන්ද ලබාදීම සිදු කරයි. විශේෂයෙන්ම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ විවිධ ප්‍රමිති පිරිවිතර සැදීමේදී මෙම නිලධාරීන්ගෙන් විශාල දායකත්වයක් ලැබේ. ආරක්ෂක අමාත්‍යාංශයට අවශ්‍ය ආයුධ හා උපකරණ මිලදී ගැනීම් වලදි තාක්ෂණික කමිටු වලට විශේෂඥ සහාය ලබාදීමද මෙම නිලධාරින් විසින් සිදු කරනු ලැබේ.


මෙම දෙපාර්තමේන්තුව 2013 වර්ෂයේ මැයි මස බත්තරමුල්ල, පැලවත්ත ප්‍රදේශයේ නවීන විද්‍යාත්මක උපකරණ හා සියළු පහසුකම් වලින් සමන්විත නව ගොඩනැගිල්ලක ස්ථාපිත කරන ලදී. අධිකරණ විද්‍යා අංශයට අත්‍යාවශයව තිබූ ඩී.එන්.ඒ. රසායනාගාරයකට අවශ්‍ය සියලු උපකරණ සහිතව

මෙම පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති අතර නඩු භාණ්ඩ විශ්ලේෂණ කටයුතු සිදුකරගෙන යනු ලැබේ. තවද මෙම දෙපාර්තමේන්තුවේ පළාත් රසායනාගාරයක්ද කුරුණෑගල පිහිටා ඇත.

## 2014 .01. 01 සිට 2014. 12.31 දක්වා ප්‍රගතිය

| අංශය | 2013.12.31 දින ඉතිරි නඩු සංඛ්‍යාව | ලැබී ඇති නඩු සංඛ්‍යාව | වාර්තා කල නඩු සංඛ්‍යාව | 2014.12,31 දක්වා වාර්තා නොකල නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මත්ද්‍රව්‍ය අංශය | 675 | 6,089 | 6,438 | 326 |
| ප්‍රක්ෂිප්ත විද්‍යා අංශය | 816 | 359 | 721 | 454 |
| පුපුරණ ද්‍රව්‍ය හා ගිනි විමර්ශන අංශය | 530 | 351 | 627 | 254 |
| අධිකරණ ධූලක විද්‍යා අංශය | 2,397 | 1,989 | 3,084 | 1,302 |
| අධිකරණ මස්තු විද්‍යා අංශය | 1,401 | 1,162 | 1,367 | 1,196 |
| සැක කටයුතු ලේඛණ අංශය | 570 | 773 | 960 | 383 |
| අධිකරණ විද්‍යා විවිධ අංශය | 231 | 246 | 282 | 195 |
| ප්‍රධාන කාර්යාලය (මත්පැන්) | 317 | 2,306 | 2,622 | 1 |
| මධ්‍යසාර හා දුම්කොළ | 112 | 1,135 | 1,239 | 8 |
| කුරුණෑගල (මත්පැන්) | 563 | 3,151 | 3,687 | 27 |
| ආහාර පනත යටතේ ආහාර සාම්පල | 529 | 5,250 | 5,686 | 93 |
| විවධ ආහාර | 38 | 1,517 | 1,503 | 52 |
| **එකතුව** | **8,179** | **24,328** | **28,216** | **4,291** |

## 2014.01.01 සිට 2014.12.31දක්වා වාර්ථා වල ප්‍රගතිය



**2014.01.01 සිට 2014 .12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය (233-01-01)**

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම | **182,808,000** | **174,368,000** |
| ප්‍රාග්ධන වියදම | **118,667,000** | **87,483,000** |
| එකතුව | **301,475,000** | **261,851,000** |

## 6.2 නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව 1969 අංක 03 දරණ නීති කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලදී. නීති ප්‍රතිසංස්කරණයෙහි නියැලි ප්‍රධානතම රජයේ ආයතනය නීති කොමිෂන් සභාව වන අතර ඒ සඳහා අවශ්‍ය පරිපාලනමය හා පර්යේෂණාත්මක සහයෝගය මෙම දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලැබේ.**

දැක්ම

**යහපාලනය උදෙසා නීති ප්‍රතිසංස්කරණය ප්‍රවර්ධනය කිරිම.**

මෙහෙවර

**නීති ප්‍රතිසංස්කරණය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභා පනතින් කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ හා නියම කරනු ලැබූ කාර්යයන් ක්‍රියාත්මක කිරීම.**

**නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණයි ඉහත කාර්ය සඳහා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව මඟින් පහත සඳහන් කාර්යයන් සිදු කරනු ලැබේ.**

I. නීතිය සංග්‍රහ ගත කිරීම
II. නීතියේ විෂමතා නැති කිරීම
III. හරයාත්මක නීතිය හා කාර්ය පටිපාටික නීතිය ක්‍රමානුකූලව සංවර්ධනය කිරීමේ හා ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් සමාලෝචනය කිරීම හා පවත්වාගෙනයාම
IV. අභාවයට ගිය හා අනවශ්‍ය පනත් ඉවත් කිරීම
V. නීතිය සරල කිරීම හා නවීකරණය කිරීම
VI. නීති ප්‍රතිසංස්කරණය සඳහා යෝජනා භාරගෙන සලකා බැලීම
VII. ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් නීතියේ විවිධ අංශ පරීක්ෂා කිරීම සඳහා වැඩසටහන් කලින් කලට සකස්කොට අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම
VIII. වෙනත් රටවල නීති ක්‍රම පිළිබඳව අධ්‍යයනය කොට තොරතුරු ලබාගැනීම.
IX. අනුනීති මනාව පිළිගත් සිද්ධාන්ත වලට හා නීතියේ පාලනයට අනුකූල වන බව සුරක්ෂිත කිරීමේ අදහසින් පාර්ලිමේන්තුව නොවන වෙනත් මණ්ඩල විසින් අනුනීති සෑදීමේ බලය ක්‍රියාත්මක කිරීම නිරන්තරයෙන් සමාලෝචනය කිරීම.
X. නඩුකීම හා සම්බන්ධ පරිපාලනාත්මක ස්වභාවයේ කාර්ය පරිපාටිය ඇතුළුව නීති කාර්ය පරිපාටි තර්කාපණය කිරීම හා සරල කිරීම සඳහා වැඩසටහන් ක්‍රමාණුකූලව සකස් කිරීම.

**2014.01.01 සිට 2014.12.31 දක්වා ප්‍රගතිය**

**නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් නීති ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබයි.**

**01.** සායනික නඩු විභාග පිළිබඳ යෝජිත නීති පද්ධතිය නිරීක්ෂණය කිරීම.
සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නීති කොමිෂන් සභාවේ නිරීක්ෂණය පිණිස එවන ලද සායනික නඩු විභාග පිළිබඳ පනත් කෙටුම්පත නීති කොමිෂන් සභාව විසින් අධ්‍යනය කරනු ලැබේ.

**02.** ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ සම්බන්ධයෙන් දඬුවම් නියම කිරීමේ පිළිවෙත සංශෝධනය කිරීම පිළිබඳ සළකා බැලීම.

**03.** බද්ධ නිවාස අයිතිවාසිකම් පනතට යෝජිත සංශෝධන පිළිබඳව නිරීක්ෂණය කිරීම.

**04.** ස්ත්‍රී දූෂණය, ව්‍යාභිචාරය සහ උපතේ සිට පැවත එන අසාමාන්‍යතාවයක් හේතුවෙන් සිදුවූ ගැබ් ගැනීමක් වෛද්‍ය විද්‍යාත්මකව අවසාන කිරීම විධිමත් කිරීම.

**05.** සිවිල් නඩු විභාග වලදී දිවුරුම් ප්‍රකාශ මඟින් සාක්ෂි ඉදිරිපත් කිරීම

**06.** ඉඩම් අත් කර ගැනීම සහ ඒ සම්බන්ධ නියෝග පරීක්ෂා කිරීම

**07.** නඩු තීන්දු පදනම් කරගෙන ඉඩම් පවරා දීම, ප්‍රදානය කිරීම සහ අන්සතු කිරීම සම්බන්ධ මූලධර්ම

**08.** නීති ප්‍රමාදයන් සම්බන්ධයෙන් කාර්යපටිපාටි ආශ්‍රිතව පවත්නා නීති සමාලෝචනය කිරීම

**09.** එලදායීව යුක්තිය පසිඳලීම හා සම්බන්ධ ව්‍යවස්ථාමය සහ නීතියේ වෙනත් විධිවිධාන පිළිබඳ පරීක්ෂා කිරීම

**10.** ජල සම්පත් කළමනාකරණය පිළිබඳව පරීක්ෂා කිරීම

**11.** ප්‍රසම්පාදන කාර්යපටිපාටිය පිළිබඳව නීති සම්පාදනය

**12.** වාණිජ නීතියේ විවිධ පැතිකඩ පරීක්ෂා කිරීම (හවුල් ව්‍යාපාර නීතිය සහ භාණ්ඩ විකිණීමේ ආඥා පනත, මුහුදෙන් භාණ්ඩ රැගෙන යාම පිළිබඳ ආඥා පනත, අද්මිරාල්ති ආඥා පනත ආදිය)

**13.** උකස් පනත පරිච්ඡින්න කොට ආදේශ කිරීම් පිළිබඳ යෝජනාව

**14.** ජෛව විවිධත්වය සහ වන ජීවීන් සම්බන්ධයෙන් පවත්නා නීති පද්ධතියේ ප්‍රමාණවත් භාවය පරීක්ෂා කිරීම

**15.** ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව සම්බන්ධයෙන් නෛතික පාලන ක්‍රමය පරික්ෂා කිරීම

**16.** ස්ත්‍රී පුරුෂ භාවය මත වෙනසකට භාජනය කිරීම සම්බන්ධ නීති පරික්ෂා කිරීම

**17.** දේපල නීතිය විමසීම

**18.** පරිසරය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් බලපත්‍ර ලබාදීම සහ විධිවිධාන බලාත්මක කිරීම සමාලෝචනය කිරීම.

**19.** අපරාධ නීතියේ ඇතැම් පැතිකඩ සමාලෝචනය කිරීම

**2014.01.01 සිට 2014.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය (235-01-01)**

| විස්තරය | ප්‍රතිපාදන(රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම | **13,950,000** | **10,818,000** |
| ප්‍රාග්ධන වියදම | **1,750,000** | **933,520** |
| එකතුව | **15,700,000** | **11,751,520** |

## 6.3 ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

**1941 අංක 39 දරණ ණය සහනදායක අඥාපනත යටතේ මෙම දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. මෙහි ප්‍රධාන අරමුණ ඉඩකඩම්, කුඹුරු, වතුපිටි, නිවාස වැනි නිශ්චල දේපල පොරොන්දු සින්නක්කර ඔප්පු මත, හෝ උකස්කර ඔප්පුවක් මත ඇපයට තබාගත් ණය සහ පොරොන්දු නෝට්ටු, චෙක්පත් වැනි ලියවිලි මත, ලබා ගත් ණය සම්බන්ධයෙන් ණය ගැතිවී ඇති මහජනතාව එයින් මුදවාලීම සඳහා කිසියම් සහනදායී ක්‍රියාමාර්ගයක් හඳුන්වා දිම වෙයි.**

දැක්ම

**නිශ්චල දේපල සම්බන්ධ ණය මුදල් නැවත ගෙවීම සඳහා අගතියට පත් ජනතාව සඳහා කඩිනම් සහන සැලැස්මට ලබා දීම.**

මෙහෙවර

**කෘෂිකාර්මික ඉඩම්, නිවාස දේපල ආදිය උකස් කර, පොරොන්දු සින්නක්කර, හෝ විකුණුම්කර මත ඇපයට තබා අඩු පොළී අනුපාතයට වාරික පදනමින් ආපසු ගෙවීම පිණිස ණය මුදල් ලබාගන්නා විට ණයගැති භාවයට පත්වන තැනැත්තන්ට එම ඉඩම් සහ නිවාස දේපල ආදිය ආපසු ලබා ගැනීම පිණිස සහන සපයමින් නීතියේ ආරක්ෂාව සැලසීම.**

අරමුණ

**නිශ්චල දේපල සම්බන්ධයෙන් උකස්කර, පොරොන්දු සින්නක්කර හා හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර හා අනෙකුත් බැඳීම් කෙරෙහි වු අයවිය යුතු ණය පිළිබඳව සම්මුතිවලට පාර්ශවයන් පැමිණවීම.**

**මීට අමතරව 1999 අංක 29 දරන පනත මගින් කරන ලද සංශෝධනයට අනුව හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු සම්බන්ධයෙන් මණ්ඩලයට මැදිහත් වි සහන සැළැස්විමට හැකිවිමෙන් මෙම සහනදායි ක්‍රියා මාර්ගය තවත් පුළුල්වි ඇත.**

**මෙම මණ්ඩලය අමාත්‍යවරයා පත් කරනු ලබන සමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් එක් සමාජිකයෙකු මණ්ඩලයේ සභාපති ලෙස අමාත්‍යවරයා විසින් පත්කරනු ලබයි.**

**මෙම මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර සඳහා කිසිම ගාස්තුවක් අය නොකෙරෙන අතර මණ්ඩලයේ කටයුතු මුද්දර ගාස්තුවලින් තොරව ඉටු කරනු ලැබේ. ගැසට් හා නොතීසි ගාස්තු වශයෙන් අයකරනු ලබන්නේ ඉතා සුළු මුදලක් වන බැවින් ණය බරින් මිරිකී සිටින ජනතාවට මෙමගින් ලැබී ඇති**

සේවය අති විශාලය. එසේම තමා වෙනුවෙන් මණ්ඩලය ඉදිරියේ නීතිඥයින් ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවන බැවින් එයින් මහජනතාවට සිදුවන සේවය ඉමහත්ය.

මෙම මණ්ඩලයේ රාජකාරී කටයුතු සමාන්‍ය අධිකරණයක පවත්නා ස්වරූපයට වඩා වෙනස් ස්වරූපයක් ගනී. මණ්ඩලය ඉදිරියේදී එළඹෙන ගිවිසුම් පාර්ශවකරුවන් ඔවුනොවුන් කැමැත්තෙන් එළඹෙන ගිවිසුම් මිස ණය සහන දායක මණ්ඩලයේ විධාන ක්‍රියාත්මක කිරීමක් නොවෙයි. එසේ වුවද අසාධාරණ පොලී ප්‍රමාණයන් අඩු කිරිමටද මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන සාධාරණ යෝජනා ණය හිමියන් විසින් පිළිනොගන්නේ නම් ඒ සම්බන්ධයෙන් ආඥාපනත යටතේ ණය කරුවන්ට සහතිකයක් නිකුත් කිරීමටද මණ්ඩලයට බලතල ඇත. එසේම ණයහිමි පාර්ශවය අවසාන විභාගය සඳහා නිකුත් කල නොතීසිය පරිදි විභාගයට නොපැමිණියහොත් ඒක පාක්ෂික නඩු විභාගයකින් අනතුරුව ණයකරු වෙත සහතිකයක් නිකුත් කරනු ලබයි.

### 2014.01.01 සිට 2014.12.31 දක්වා ප්‍රගතිය

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| ඉදිරියට ගෙනා නොනිමි ඉල්ලුම්පත් සංඛ්‍යාව ( 2014.01.01) | **715** |
| නව ඉල්ලුම්පත් සංඛ්‍යාව | **454** |
| සමාලෝචනය සඳහා ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව | **49** |
| මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව (2014.12.31 දින වන විට) | **1218** |
| සමථයට පත් කල ඉල්ලුම්පත් සංඛ්‍යාව | **154** |
| නිෂ්ප්‍රභා කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව | **214** |
| සමාලෝචනය කරන ලද අයදුම්පත් සංඛ්‍යාව | **29** |
| සහතික නිකුත් කල ඉල්ලුම්පත් සංඛ්‍යාව | **03** |
| ඉල්ලා අස්කර ගත් ඉල්ලුම් පත් සංඛ්‍යාව | **30** |
| පියවර ගත් මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව | **430** |
| 2014.12.31 දිනට අවසන් නොවී ඉතිරි වු ඉල්ලුම්පත් සංඛ්‍යාව | **788** |

### 2014.01.01 සිට 2014.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය (231-01-01)

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්ථන වියදම් | **9,720,000** | **7,960,400** |
| ප්‍රාග්ධන වියදම් | **1,250,000** | **1,059,000** |
| එකතුව | **10,970,000** | **9,019,400** |

## 6.4 නීති ආධාර කොමිෂන් සභාව ( LAC )

නීති ආධාර කොමිෂන් සභාව 1978 අංක 27 දරණ නීති ආධාර පනත මගින් ස්ථාපිත කරන ලදි. දරිද්‍රතාව නිසා යුක්තියේ පිළිසරණ ලබා ගැනිමට නොහැකි වූ ශ්‍රී ලංකාවේ දුගී ජන කොටස් සඳහා නීති ආධාර සැපයීම මෙහි ප්‍රධාන අරමුණ වේ. අඩු අදායම්ලාභී ජනතාවට නොමිලේ නීතිඥ සහාය හා නීති උපදේශ ලබාදීමත් සමස්ත සමාජයම නීතිය පිළිබඳව දැනුවත් කිරීමත් කොමිෂන් සභාවේ කාර්යභාරය වේ. මේ වසර තුළ දී පහත සඳහන් අංශ යටතේ වැඩසටහන් ගණනාවක්ම පවත්වා ඇත.

- නීති අංශය - යුක්තියේ පිළිසරණ ලබා ගැනිමට හැකියාවක් නොමැති තැනැත්තන් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටිම.

සෘජුව ප්‍රධාන කාර්යාලය යටතේ ක්‍රියාත්මක කොළඹ නීති ආධාර මධ්‍යස්ථානය ඇතුළුව නිති ආධාර මධ්‍යස්ථාන 76 ක් දිවයින පුරා ක්‍රියාත්මක වේ. නඩු කටයුතු වලදී අවශ්‍ය නීති ආධාර සැපයීම නිති ආධාර මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණවේ. මාසික ආදායම රුපියල් 15000 /= හෝ ඊට අඩු තැනැත්තන් සඳහා නීති අධාර ලබාදෙයි. නමුත් තමන් සඳහා සහ දරුවන් සඳහා ගාස්තු ලබාගැනීමට අපේක්ෂා කරන කාන්තාවන් සඳහා ආදායම් මට්ටම නොසළකා නීතිඥ නියෝජනය ලබාදෙයි.

නීති ආධාර කොමිෂන් සභාව මගින් සේවා සපයන ලද නඩු පිළිබඳ විස්තර.

| නඩු පිළිබඳ විස්තරය | නඩු ප්‍රමාණය |
|---|---|
| 2013 වසරේ සිට ඉදිරියට ගෙන එන ලද නඩු සංඛ්‍යාව | 31,775 |
| 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අලුතින් එකතු වූ නඩු සංඛ්‍යාව | 9,596 |
| 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අවසන් කරන ලද සංඛ්‍යව | 20,7466 |
| ඉදිරියට ගෙන යන ලද නඩු සංඛ්‍යාව | 20,625 |
| 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා නීති ආධාර කොමිෂන් සභාවේ සේවය ලබාගත් සේවාදායකයින් සංඛ්‍යාව | 56,992 |

- ජනමාධ්‍ය වැඩසටහන්

- රූපවාහිනි මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කළ වැඩසටහන්

විවිධ රූපවාහිනි ආයතන වලින් ලැබෙන ආරධනාවන්ට අනුව මහජනතාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් කොමිෂන් සභාවේ නීති කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලදී. 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මෙවැනි වැඩසටහන් ගණනාවක් පවත්වා ඇත.

• මහජනතාවගේ නීතිමය ගැටලුවලට පුවත්පත් මගින් පිළිතුරු ලබාදීමේ වැඩසටහන්

පුවත්පත් වල නීති ප්‍රශ්න පිළිතුරු පිටු පලකිරීම, මහජනතාවගේ ගැටළු විසඳීම හා මහජනතාවගේ නිතිමය දැනුම වැඩිකිරිම සඳහා නීති ආධාර කොමිෂන් සභාව ගත් තවත් පියවරකි. මීට අමතරව කාලීන වශයෙන් උනන්දුවක් දක්වන මාතෘකා සම්බන්ධයෙන් නීති ආධාර කතුවැකි පවත්වා ගෙන යයි.

සංවර්ධන නීති ආධාර අංශය

• සංක්‍රමණික සේවකයින් සම්බන්ධයෙන් තොරතුරු ඒකකය

ගැටළුවලට මුහුණ පෑ සංක්‍රමණික සේවකයින් සඳහා මෙම අංශය විසින් 2014 වසරේදි උපදේශන වැඩසටහන් පවත්වා තිබේ. උපදේශන සේවා ලබාදීමෙන් පසු එම තැනැත්තන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය වෙත හෝ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත යොමු කරන ලදී. සංක්‍රමණික සේවකයින් මුහුන පාන ගැටළු වැටුප් නොගෙවීම, ලිංගික අතවර, විදෙස් රටවලදී සිදුවන සංක්‍රමණික සේවක මරණ, නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම ආදි වශයෙන් වර්ග කරනු ලබයි.

2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ සංක්‍රමණික සේවකයින් සඳහ හා ඔවුන්ගේ පවුල්වල අය සඳහත් සංක්‍රමණික සේවකයින් සහ මහජනතාව සඳහත් වැඩසටහන් පැවැත්වීමට මෙම අංශයට හැකිවී ඇත. මෙම අංශය මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබුයේ USAID ව්‍යාපෘතියෙන් ලද අරමුදල් වලිනි.

• කාන්තා හා ළමා අයිතිවාසිකම්

නීති ආධාර කොමිෂන් සභාවට අනුබද්ධ කාන්තා සහ ළමා කටයුතු අංශය හා ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය වෙමින් නීති ආධාර කොමිෂන් සභාවේ මෙන්ම අමාත්‍යාංශයේද අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ. මුලතිවු ප්‍රදේශයේ ස්ථාන දෙකක ළමා වැඩසටහන් පවත්වමින් කොමිසම විසින් 2014.10.01 දින ජාත්‍යාන්තර ළමා දිනය සමරන ලදී. එසේම හැටන් ප්‍රදේශයේ වැඩසටහන් තුනක් පවත්වමින් හැටන් නීති ආධාර කොමිසම විසින් ජාත්‍යාන්තර කාන්තා දිනය සමරන ලදි. දැනට නඩත්තු නඩු සංඛ්‍යාව ඉහළ ගොස් තිබීම නිසා නීති ආධාර කොමිෂන් සභාවේ වැඩි අවධානය කාන්තාවන් හා ළමුන් කෙරෙහි යොමුවී ඇත. ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සම්බන්ධ නඩු කාන්තාවන්ට අතුරු නියෝග මඟින් සහන ලබාගත හැකි තවත් නඩු කාණ්ඩයකි.

• සිරකරුවන්ගේ අයිතිවාසිකම්

නීති ආධාර අවශ්‍ය කිසියම් සිරකරුවෙකුගේ ළඟම ඥාතියෙකුට ඕනෑම නීති ආධාර මධ්‍යස්ථානයක සහය පැතිමේ හැකියාව ඇත. නිතරම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් නඩු, නීති ආධාර කොමිෂන් සභාව වෙත යොමුකරයි.

• හදිසි අනතුරුවලින් විපතට පත් තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ඒකකය

හදිසි අනතුරු වලින් විපතට පත් තැනැත්තන් සඳහා වන්දි ලබා දිම මෙම අංශයේ ප්‍රධාන අරමුණවේ. වන්දි ලබා ගැනීම සඳහා ඉතා ඉක්මනින් සිවිල් නඩුවක් දිසා අධිකරණයේ පැවරීම ක්‍රියාපටිපාටියයි. වන්දි ලබාගැනීමේ හෝ මුදල් අයකරගැනීමේ නඩුවක් වසර **2** කින් කාලවරෝධය වීම එයට හේතුවයි.

ඒ අතරතුර රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයාගේ අනුග්‍රහය යටතේ අදාළ රක්ෂණ සමාගම සමග සාකච්ඡා පවත්වනු ලබයි. දිගු අධිකරණ ක්‍රියාමාර්ගයකට නොගොස් සාකච්ඡා මාර්ගයෙන් සමථයකට පත්කිරීම මෙහි අරමුණයි. මේ වන විට එවැනි නඩු ගණනාවක් රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයාගේ උපදෙස් ලබාදීම යටතේ පවතී. **2014** දෙසැම්බර් **31** වන විට දිවයින පුරා දිසා අධිකරණවල එවැනි හදිසි අනතුරු නඩු **775**ක් විසඳීමට ඇත.

• මානව හිමිකම් කාර්යාංශය

මෙම අංශයෙන් පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් රජයේ නිලධාරීන් විසින් කඩකිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනු කිරීම සිදු කරයි.

• වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිම සඳහා වූ ඒකකය

වැඩිහිටි තැනැත්තන් සමාජයේ බෙහෙවින්ම අනාරක්ෂිත කණ්ඩායමක් වශයෙන් හඳුනා ගැනීමෙන් පසු, නීති ආධාර කොමිෂන් සභාව විසින් වැඩිහිටි තැනැත්තන් ඉලක්කකර ගනිමින් වැඩසටහන් රාශියක් දියත් කරන ලදී. වැඩිහිටි තැනැත්තන් සම්බන්ධ ආරවුල් සමථයකට පත් කිරීමට නොහැකිවූ අවස්ථාවක දී, නීති ආධාර කොමිසම එම ආරවුල වැඩිහිටි තැනැත්තන් නඩත්තු කිරීමේ මණ්ඩලය වෙත යොමු කරනු ලැබේ.

• කම්කරු අයිතිවාසිකම් අංශය

නීති ආධාර මධ්‍යස්ථාන සහ ප්‍රධාන කාර්යාලයේ නීති නිලධාරීන් දිවයිනපුරා කම්කරු විනිශ්චය සභා වෙත අයදුම්පත් ඉදිරිපත් කරන අයවලුන් වෙනුවෙන්ද පෙනී සිටියි. ඒ අනුව **2014** දෙසැම්බර් **31** වන විට දිවයින පුරා කම්කරු විනිශ්චය සභාවල අයදුම්පත් **258** ක් විසඳීමට ඇත.

විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන්

- පරිපූරක නෛතික ව්‍යාපෘති

නීති ආධාර කොමිෂන් සභාව පරිපූරක නිති අධ්‍යයනය සඳහා සහතිකපත් පාඨමාලාවක් ආරම්භ කරන ලදී. මෙම පාඨමාලාව පළමුව 2011 දී නීති ආධාර කොමිෂන් සභාවේ නීතිමය පරිසරයක සේවය කරන කළමනාකරණ සහකාරවරුන් සඳහා හඳුන්වා දෙන ලදී. එහි අරමුණ ඔවුන්ගේ කාර්යභාරය ඉටු කිරීමේ හැකියාව වර්ධනය කිරීමයි. එතැන් සිට මෙම පාඨමාලාව අධිකරණ කාර්යමණ්ඩලය ඇතුළු රජයේ නිලධාරින්ට, රාජ්‍ය භාෂා හා ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර නිලධාරින් සහ පුද්ගලික අංශයේ පුද්ගලයින් දක්වා පුළුල් කරන ලදී. මෙම ඒකකය විසින් මේ දක්වා කණ්ඩායම් හතක් සඳහා පරිපූරක නෛතික අධ්‍යාපන පාඨමාලාවන් හතක් පවත්වා ඇත. හත්වන කණ්ඩායම සඳහා පාඨමාලාව 2014 වර්ෂයේ මාර්තු සිට දෙසැම්බර් දක්වා පවත්වන ලදී.

- ආධුනික නීතිඥයින් සඳහා වන පුහුණු වැඩසටහන

වසරකදී පුහුණු වැඩසටහන් දෙකක් පවත්වනු ලැබේ. මෙය ස්වයං මූලය වැඩසටහනක් වන අතර සහභාගිවන්නන්ගෙන් ශාලා ගාස්තු , පාඨමාලාව සඳහා නිබන්ධන සකස් කිරීම ආදිය සඳහා වන ප්‍රධාන වියදම් පියවා ගැනිම සඳහා වන නාමික මුදලක් පමණක් අය කරනු ලැබේ.

- ජාත්‍යාන්තර සංවර්ධනය සඳහා එක්සත් ජනපද ඒජන්සිය (USAID) අරමුදල් ලබාදෙන ව්‍යාපෘතිය.

නීතියේ ආධිපත්‍ය සඳහා සිවිල් සමාජය ගන්නා පියවර සම්බන්ධ වැඩසටහන (CSLROL) නීති ආධාර කොමිෂන් සභාවේ හඳුනාගත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරමින් සිටී.

- CSLROL මඟින් නීති ආධාර කොමිෂන් සභාවේ නීති නිලධාරින් සඳහා පුහුණුවක් ලබාදුන් අතර එහි සමාලෝචන රැස්වීම 2014 අප්‍රේල් 5-7 දිනවල පවත්වන ලදී. නීති ආධාර මධ්‍යස්ථාන 76 අතරින් නීති නිලධාරින් 120 දෙනෙකු පමණ මෙම පුහුණුවට සහභාගි වන ලදී.
- නිති ආධාර කොමිසම සඳහා ආයතනික හා මානව ධාරිතා වර්ධනය.
- දකුණු හා බස්නාහිර ඒකකයන්ට සහය දැක්වීම සඳහා වැඩසටහනක් ස්ථාපිත කිරිම.
- නීති නිලධාරින් සඳහා උසාවි නිපුණතා පුහුණු වැඩසටහන්.
- විදේශ රැකියා සඳහා යන ශ්‍රමිකයන්ගේ නීතිය පිළිබඳ දැනුවත් භාවය නංවාලීමේ වැඩසටහන
  නීති නිලධාරින් විසින් විදේශ රැකියා සඳහා යන ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල් ඉලක්ක කරගෙන නීතිය පිළිබඳ දැනුවත් භාවය නංවාලීමේ වැඩසටහන් 16ක් CSLROL සංවිධානයේ සහයෝගයෙන් පවත්වන ලදී.
- දින දාහසයක ක්‍රියාකාරි වැඩසටහන
- ලෝක ඒඩ්ස් දිනය
- නීති නිලධාරින්ගේ ද්විපාර්ෂික සමුළුව සහ පුහුණුව - 2014 දෙසැම්බර්
  හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි පර්යේෂණ ආයතනයේ ශ්‍රවණාගාරයේදී 2014 දෙසැම්බර් 20-22 දෙවන ද්විපාර්ෂික සමුළුව හා පුහුණුව CSLROL සහයෝගයෙන් පවත්වන ලදී.

- **BIZ Sri Lanka** ව්‍යාපෘතිය

- වතු සේවකයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්

  **GTZ** මුල්‍ය සහයෝගයෙන් නුවරඑළිය පෙඩ්‍රෝ වතුයායේ සහ බදුල්ල ඌරි වතු යායේ දැනුවත් කිරිමේ වැඩසටහන් දෙකක් **2014** නොවැම්බර් **22, 23** දිනවල නීති ආධාර කොමිෂන් සභාව විසින් පවත්වන ලදී.

- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන

මෙම වැඩසටහන මඟින් **2014** වර්ෂයේදී කොළඹ බන්ධනාගාර ව්‍යාපෘතිය හා උතුරේ ළමා අයිතිවාසිකම් වැඩසටහන කෙරෙහි අවධානය යොමු කරන ලදී.

- බන්ධනාගාර ව්‍යාපෘතිය භාර නීති නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සායන දහයක් වැලිකඩ බන්ධනාගාරයේදි පවත්වන ලදී.
- ළමා දිනය සැමරිම

  එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන මඟින් **2014** ඔක්තෝම්බර් මාසයේදි වැඩසටහන් කිහිපයක් පවත්වමින් මුලතිවු ප්‍රදේශයේදි ළමා දිනය සමරන ලදී.

- යුරෝපා සංගමය අරමුදල් සපයන ව්‍යාපෘතිය

යුරෝපා සංගම් ව්‍යාපෘතිය සහ ස්විට්සර්ලන්ත තනාපති කාර්යාලය මඟින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති මඟින් සිදු කරගෙන යන සමාජ සහභාගීත්ව වැඩසටහන් සායන සහ පුහුණු වැඩසටහන්

| මධ්‍යස්ථානය | වැඩසටහන් ගණන | මධ්‍යස්ථානය | වැඩසටහන් ගණන |
|---|---|---|---|
| මඩකලපුව | **47** | යාපනය | **79** |
| පොළොන්නරුව | **26** | මන්නාරම | **46** |
| මුත්තූර් | **33** | පොතුවිල් | **41** |
| කිලිනොච්චි | **60** | වව්නියාව | **185** |
| ත්‍රිකුණාමලය | **90** | මුලතිවු | **57** |

**2014.01.01** සිට **2014.12.31** දක්වා මුල්‍ය ප්‍රගතිය **(110-01-02)**

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් **(1503)** | **133,000,000** | **133,000,000** |
| ප්‍රාග්ධන වියදම් **(2201)** | **24,000,000** | **15,750,000** |
| මුළු වියදම් | **157,000,000** | **148,750,000** |

## 6.5 සමථ මණ්ඩල කොමිෂන් සභාව

1988 අංක 72 දරණ සමථ මණ්ඩල පනත මගින් සමථ මණ්ඩල කොමිෂන් සභාව පිහිටුවන ලදී. ඒ යටතේ ශ්‍රී ලංකාවේ සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයක් සඳහාම සමථ මණ්ඩල පිහිටුවීම ආරම්භ කරන ලදි. මෙය අධිකරණ ක්‍රියාවලිය පහසු කරලීමේ අරමුණින් ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රමවේදයක් ලෙස අධිකරණය වෙත ඉදිරිපත් වන ආරවුල් වලින් සුළු ආරවුල් විසඳාලීම උදෙසා සකස් කරන ලද ඉතා වටිනා වැඩපිළිවෙලක් ලෙස හඳුන්වා දිය හැකිය. මේ වන විට ශ්‍රී ලංකාව පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 328 ක පිහිටුවා ඇති සමථ මූල මණ්ඩලවල සමථකරුවන් 8200 කට අධික පිරිසක් ස්වේච්ඡාවෙන් සේවය කරනු ලබයි.

සමථ මණ්ඩල කොමිෂන් සභාව සාමාජිකයින් 05 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන් පත්කිරීමේ බලය අතිගරු ජනාධිපතිතුමා සතුවෙයි. පනතේ සඳහන් පරිදි සමථ මණ්ඩල කොමිෂන් සභාවේ සමාජිකයින් පස්දෙනාගෙන් තිදෙනෙකු උපරිමාධිකරණවල විශ්‍රාමික විනිශ්චයකාරවරුන් විය යුතුය. සමථ මණ්ඩල කොමිෂන් සභාව විසින් සමථකාරවරුන් පත් කිරීම, මාරු කිරීම හා ඔවුන්ගේ විනය පාලනය වැනි සමථ මුල මණ්ඩලට අදාල පරිපාලනමය කටයුතු සිදුකරනු ලබයි.

සමථකරණ ක්‍රියාවලිය මගින් පාර්ශවකරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ප්‍රමාණයක් අතර ඇතිවන ආරවුල් විසඳා ගැනීම සඳහා තුන්වන පාර්ශවයක් ලෙස සමථකරුවන් කටයුතු කරනු ලබයි.

තමන්ගේ ගැටළු විසඳීමට පහසු හා අඩු වියදම් යාන්ත්‍රණයක් ලෙස ජරජාව විසින් සමථකරණය පිළිගැනීමෙන් පසු ප්‍රජාව සමථකරණය දෙසට යොමුවීම ඉහළ ගොස් ඇත. එමනිසා සෑම වසරකදීම ලක්ෂයකට අධික ආරවුල් ප්‍රමාණයක් සමථ මණ්ඩල වෙතට යොමුවේ.


### 2014.01.01-2014.12.31 දින දක්වා ප්‍රගතිය

| | ආරවුල් සංඛ්‍යාව |
|---|---|
| සමථ මණ්ඩල වෙත යොමු කිරීම් | **210535** |
| සාකච්ඡාවට ගත් ආරවුල් වලින් සමථයට පත් කිරීම් | **94967** |
| ප්‍රතිශතය | 49% |

- **2014.12.31** වන විට පස්දින වැඩමුළු **55**ක් පවත්වා සමථකාරවරුන් **2250** ට ආසන්න ප්‍රමාණයක් පුහුණු කර ඇත.

- වැඩසටහන් සහකාර නිලධාරින් විසින් ප්‍රජා සමථකරණය, පාසැල් සමථකරණය හා වෙනත් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරනු ලබයි. ඔවුන් පස්දින වැඩසටහන් **75**ක් ද, තුන්දින වැඩසටහන් **06** ක්ද, එක්දින සමථකරණ වැඩසටහන් **62** ක්ද පවත්වා ඇත.

**2014.01.01 - 201412.31 දින දක්වා පළාත් මට්ටමින් සමථ මණ්ඩල වල ආරවුල් ලැබීම**




**2014.01.01 සිට 2014.12.31 දින දක්වා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේ ප්‍රගතිය**

| | |
|---|---|
| පවත්වා ඇති සම්මුඛ පරීක්ෂණ ගණන | **44** |
| ප්‍රතිශතය | **95%** |

**2014.01.01 දින සිට 2014.12.31 දින දක්වා පත්වීම් ලබාදි ඇති සමථ මුල මණ්ඩල**

| | |
|---|---|
| කොළඹ | කඩුවෙල, මහරගම |
| ගම්පහ | මීරිගම |
| කළුතර | බේරුවල, ඉංගිරිය |
| ගාල්ල | බද්දේගම, බෙන්තොට, අම්බලන්ගොඩ, වැලිවිටිය දිවිතුර, නාගොඩ |
| මාතර | මාතර(ක.ස.),වැලිගම |
| කුරුණෑගල | වීරඹුගෙදර, කොටවෙහෙර, මහව, වාරියපොළ, නක්කාවත්ත |
| පුත්තලම | පල්ලම, හලාවත(පුරප්පාඩු), දන්කොටුව |
| මහනුවර | පාතහේවාහැට, හාරිස්පත්තුව, පන්විල |
| මාතලේ | ගලේවෙල, යටවත්ත, නාඋල |
| නුවරඑළිය | ගිනිගත්හේන |
| රත්නපුරය | ඇලපාත |
| කෑගල්ල | කෑගල්ල, බුලත්කොහුපිටිය |
| අනුරාධපුරය | රඹෑව, නැගෙනහිර නුවරගම් පළාත, මිහින්තලය |
| පොළොන්නරුව | ලංකාපුර |
| බදුල්ල | ඌව පරණගම, බණ්ඩාරවෙල, ලුණුගල, කන්දකැටිය,පස්සර.මීගහකිවුල |
| මොණරාගල | බුත්තල, සෙවනගල |
| හම්බන්තොට | කටුවන, තංගල්ල,ඕකෙවෙල. හම්බන්තොට |
| අම්පාර | මහඔය, ලාහුගල, අක්කරෙයිපත්තු,(පුරප්පාඩු II ), කල්මුණේ, සමන්තුරෙයි, අක්කරෙයිපත්තු(පුරප්පාඩු III) |
| වවුනියාව | වවුනියාව (පුරප්පාඩු) |

| | |
|---|---|
| මඩකලපුව | පඩ්ඩිප්පලෙයි, මඩකලපුව, වාලච්චේනෙයි මධ්‍යම, මන්මුනෙයිපත්තු, කලුවන්චිකුඩි. කිරාන්. එරාවූර්, ඔට්ටමාවඩි |
| කිලිනොච්චි | කරච්චි |
| මුලතිවු | මාන්තෙයි නැගෙනහිර. තුනුක්කායි |
| ත්‍රිකුණාමලය | තඹලගමුව,පදවිශ්‍රීපුර, ගෝමරන්කඩවල,කන්තලේ,සේරුවිල,ත්‍රිකුණාමලය(ක.ස),කින්නියා,මුතූර් |

**2014.01.01 සිට 2014 .12 .31 දක්වා මූල්‍ය ප්‍රගතිය (110-01-03)**

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | **232,350,944** | **227,478,152** |
| ප්‍රග්ධන වියදම් | **1,700,000** | **1,424,884** |
| එකතුව | **234,050,944** | **228,903,036** |

## 6.6 උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

දැක්ම

ශ්‍රී ලංකා උපරිමාධිකරණ සංකීර්ණ කළමණාකරණ මණ්ඩලය ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම කළමණාකරණයකින් යුතු මණ්ඩලය බවට පත් කිරීම.

මෙහෙවර

උපරිමාධිකරණ සංකීර්ණ කළමණාකරණ මණ්ඩලයේ මෙහෙවර වනුයේ පවත්නා ගොඩනැගිලි නඩත්තු කිරීම සහ වැඩි දියුණු කිරීම මඟින් ඒවා භාවිතයට ගන්නා විනිශ්චයකාරවරුන්, නීතිඥවරුන්, නඩු කියන්නන්, අධිකරණ අමාත්‍යාංශයේ සේවකයින් සහ මාර්ෂල් කාර්යාලයේ සේවකයින්, සෙසු මහජනතාව ඇතුළුව සියළු දෙනාට තම කාර්ය කාර්යක්ෂමව සහ ඵලදායී අයුරින් ඉටු කිරීමට සහ ඉටු කරවා ගැනීමට අවශ්‍ය වඩාත් ජන හිතකාමී පරිසරයක් සැකසීම තුළින් අයතනයේ දර්ශනය සාක්ෂාත් කර ගැනීම වේ.

උපරිමාධිකරණ සංකීර්ණය හා එහි ගොඩනැගිලි පාලනය කිරීම, පරිපාලනය කිරීම හා ගොඩනැගිල්ලට අලුතින් කොටස් එකතු කිරීම, වෙනස් කිරීම හා පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා 1987 අංක 50 දරණ පනත මගින් උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය ස්ථාපිත කර ඇත. මෙම මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වෙයි.

- අග්‍ර විනිශ්චයකාරතුමා
- අග්‍රවිනිශ්චයකාරතුමා විසින් පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙක්
- අභියාචනාධිකරණයේ සභාපතිතුමා
- අභියාචනාධිකරණයේ සභාපතිතුමා විසින් පත් කරනු ලබන අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයෙක්
- අධිකරණ විෂයයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා
- රාජ්‍ය නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම්වරයා
- ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිවරයා
- කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා
- මුදල් විෂයය භාර අමාත්‍යාංශයේ නියෝජිතයෙක් සහ
- ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක්

**2014.01.01 සිට 2014.12.31 දක්වා ප්‍රගතිය**

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදිවේ.

- උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය විසින් උපරිමාධිකරණ සංකීර්ණයේ සියළුම නඩත්තු කටයුතු, ආරක්ෂක සේවාවන් පවත්වාගෙන යාම සහ විනිසුරු වරුන්ගේ නිල නිවාස සඳහා අවශ්‍ය ආරක්ෂාව සැපයීම වැනි කටයුතු සිදු කර ඇත.
- විනිසුරුවරුන්ගේ නිල නිවාස, කාර්ය මණ්ඩල නිල නිවාස සහ ආයතනයට අයත් ගොඩනැගිලි අළුත්වැඩියා කිරිම.
- අධිකරණ අමාත්‍යාංශයේ ඇළුමිනියම් දොර සහ ජනෙල් නැවත සවි කිරීම.
- අධිකරණ කටයුතු සම්බන්ධ තොරතුරු ජනතාවට බලා ගත හැකි ආකාරයෙන් එල්.ඊ.ඩී වර්ගයේ රූපවාහිනී යන්ත්‍ර 11ක් මිලදී ගෙන උපරිමාධිකරණ සංකිර්ණයේ සවි කිරිම.

**2014.01.01 සිට 2014.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය (228-01-01)**

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | **134,000,000** | **124,780,000** |
| ප්‍රග්ධන වියදම් | **70,000,000** | **17,700,000** |
| එකතුව | **204,000,000** | **142,480,000** |

## 07. අධිකරණ

පහත සඳහන් අධිකරණ සඳහා වූ ප්‍රතිපාදන මෙම අමාත්‍යාංශයේ වැය සම්මතයට ඇතුළත්වේ.

- ශ්‍රේෂ්ඨාධිකරණය
- අභියාචනාධිකරණය
- මහාධිකරණ
- පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණ
- දිසා අධිකරණ
- මහේස්ත්‍රාත් අධිකරණ
- කම්කරු විනිශ්චය සභා
- කාති අභියාචනා මණ්ඩලය සහ කාති උසාවි

ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණ 20 ක්, මහාධිකරණ 31ක්, වාණිජ මහාධිකරණයක්, දිසා/මහේස්ත්‍රාත්අධිකරණ 40 ක්, දිසා අධිකරණ 41 ක්, මහේස්ත්‍රාත් අධිකරණ 57 ක්, ළමා මහේස්ත්‍රාත් අධිකරණ 02 ක්, සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ 25 ක්, කම්කරු විනිශ්චය සභා 37 ක්, කාති අභියාචනා මණ්ඩලය සහ කාති උසාවි 65 ක් සම්බන්ධයෙන් ගිණුම්කරණ වගකීම් අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලැබේ. මහාධිකරණ ගිණුම් කාර්යාල 25 ක් හරහා වියදම් බෙදා හැරේ.

### 7.1 ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය

ශ්‍රී ලංකා අධිකරණ පද්ධතියේ ඉහළම අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණයයි. අග්‍රවිනිශ්චයකාරතුමා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් 11 දෙනා අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන අතර ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ලැබෙන සියළුම ඉල්ලුම්පත්‍ර එම අධිකරණය විසින් විභාග කරනු ලබයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ශ්‍රේෂ්ඨාධිකරණයට පහත කරුණු සම්බන්ධයෙන් බලය ලබාදෙයි.

- මූලික අයිතිවාසිකම් සම්බන්ධ අධිකරණ බලය
- අවසාන අභියාචනා අධිකරණ බලය
- උපදේශක අධිකරණ බලය
- මැතිවරණ පෙත්සම් (ජනාධිපතිවරණ) සම්බන්ධ අධිකරණ බලය
- කවරම ආකාරයක හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනය කිරීම පිළිබඳ අධිකරණ බලය
- පාර්ලිමේන්තුව විසින් නිතියෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් කාරණයක් පිළිබඳ අධිකරණ බලය

ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ටාර් කාර්යාලය ශ්‍රේෂ්ඨාධිකරණයේ කටයුතු සඳහා සහාය දක්වන අතර ඒ සඳහා අධිකරණ අමාත්‍යාංශයේ 234 ශීර්ෂය යටතේ ප්‍රතිපාදන සපයයි. ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ටාර් කාර්යාලයේ කාර්‍යයන් පහත පරිදි වේ.

- ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තා තබා ගැනීම.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ රැස්වීම් පිළියෙල කිරීම සහ ඉල්ලීම් දින ගත කිරීම.
- අධිකරණ නියෝගයන්ට සහ නඩු තීන්දුවලට අනුකූලව ප්‍රකාශ වාර්තා ගත කිරීම.

- ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන් බඳවා ගැනීම.
- අභියාචනා අධිකරණයෙන් ලැබෙන අභියාචනා නඩුවල පිටපත් සකස් කිරීම නඩු ගාස්තු තක්සේරු කිරීම.

**2014.01.01 සිට 2014.12.31 දක්වා ප්‍රගතිය**

| නඩු වර්ගය | 2014.01.01 දිනට විසඳීමට ඇති සංඛ්‍යාව | 2014.01.01 සිට 2014.12.31 දක්වා ලියාපදිංචි නඩු සංඛ්‍යාව | 2014.01.01-2014.12.31 දක්වා විසඳීමට ඇති මුළු නඩු සංඛ්‍යාව | 2014.01.01-2014.12.31 ඉල්ලීමට ඉඩ ලබාදුන් සංඛ්‍යාව | 2014.01.01-2014.12.31 අවසන් කළ නඩු සංඛ්‍යාව | 2014.12.31 දිනට විසඳීමට ඇති ඉතිරි නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| මූලික අයිතිවාසිකම් ඉල්ලුම්පත්‍ර | 817 | 369 | 1186 | - | 448 | 738 |
| විශේෂ අවසර ඉල්ලුම්පත්‍ර | 379 | 261 | 640 | 74 | 230 | 336 |
| පාර්ලිමේන්තු පනත් කෙටුම්පත් පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝග | - | 05 | 05 | - | 05 | 00 |
| අභියාචනා නඩු | 368 | 199 | 567 | - | 211 | 356 |
| වාණිජ මහාධිකරණ අභියාචනා නඩු | 257 | 88 | 345 | - | 121 | 224 |
| මහාධිකරණ අවසර ඉල්ලුම්පත් | 153 | 80 | 233 | 13 | 74 | 146 |
| රිට් ඉල්ලුම්පත්‍ර | 01 | 02 | 03 | - | 01 | 02 |
| පළාත්බද මහාධිකරණ අභියාචනා නඩු | 1103 | 686 | 1789 | 155 | 458 | 1176 |
| ප්‍රතිශෝධන නඩු | - | 07 | 07 | - | 02 | 05 |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්ථ නිරූපනය සම්බන්ධ නඩු | 01 | 00 | 01 | - | - | 01 |
| විවිධ නඩු | 06 | 04 | 10 | - | 01 | 09 |
| SC TAB APPEL | 01 | 01 | 02 | - | 02 | 00 |
| SC SPECIAL | 07 | 08 | 15 | - | 02 | 13 |
| එකතුව | 3093 | 1710 | 4803 | 242 | 1555 | 3006 |

**2014.01.01 සිට 2014.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය (234-01-01)**

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | 69,090,000 | 58,676,877 |
| ප්‍රාග්ධන වියදම් | 8,100,000 | 3,328,726 |
| එකතුව | 77,190,000 | 62,005,603 |

## 7.2 අභියාචනාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය

**ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද අභියාචනාධිකරණයට මුල් අවස්ථා අධිකරණවල, කම්කරු විනිශ්වය සභාවල සහ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලවල තීන්දු සම්බන්ධයෙන් අභියාචනා සහ ප්‍රතිශෝධන අධිකරණ බලය ඇත. තවද රිට් ආඥා පිළිබඳ අධිකරණ බලයද සතුය. 2002 අංක 25 දරණ සාපරාධී කරුණු වලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව ලබාදීමේ පනත සහ 2000 අංක 39 දරණ සිවිල් සහ වාණිජ කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගිතාවය ලබාදීමේ පනත්වල සඳහන් කාරණා පිළිබඳ අවශ්‍ය නියෝග හා විධාන ලබාදීමද, මැතිවරණ පෙත්සම් විභාග කිරීමද අභියාචනාධිකරණයෙන් සිදු වන අතර ඕනෑම මුල් අවස්ථා අධිකරණයක හෝ කම්කරු විනිශ්වය සභාවක හෝ වෙනත් ආයතනයක නඩු වාර්තාවක් අධීක්ෂණය කිරීමට හා පරීක්ෂා කිරීමට අභියාචනාධිකරණයට බලය සහ අධිකාරය ඇත.**

**2014.01.01 සිට 2014. 12.31 දක්වා නඩු විමසීමේ කාර්ය සාධනය**

| නඩු වර්ගය | 2014.01.01 දිනට විසඳීමට ඇති සංඛ්‍යාව | 2014.01.01-2014.12.31 දක්වා ලියාපදිංචි නඩු සංඛ්‍යාව | 2014.01.01-2014.12.31 දක්වා තීරණයවූ නඩු සංඛ්‍යාව | 2014.12.31 දිනට විසඳීමට ඇති ඉතිරි නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| රිට් අයදුම්පත් | 1,135 | 416 | 348 | 1203 |
| මහාධිකරණ අභියාචනා (අපරාධ) | 813 | 283 | 241 | 855 |
| (රෙම්) | 04 | - | 02 | 02 |
| පළාත්බද මහාධිකරණ අභියාචනා | 1,224 | 200 | 307 | 1117 |
| සිවිල් අභියාචනා | 1,379 | - | 398 | 981 |
| පළාත්බද මහාධිකරණ ප්‍රතිශෝධන අයදුම්පත් | 285 | 156 | 159 | 282 |
| ප්‍රතිශෝධන (සිවිල්) සහ අභියාචනයට අවසර අයදුම්පත් | 113 | 20 | 49 | 84 |
| වෙනත් අයදුම්පත් | 82 | 90 | 33 | 139 |
| එකතුව | 5,035 | 1,165 | 1,537 | 4.663 |

**2014.01.01 සිට 2014 12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය (234-01-02)**

| විස්තරය | ප්‍රතිපාදන(රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | 48,020,000 | 43,012,258 |
| ප්‍රාග්ධන වියදම් | 1,200,000 | 130,633 |
| එකතුව | 49,220,000 | 43,142,891 |

## 7.3 කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය

දැක්ම

"රාජ්‍ය නොවන සේවකයින්ගේ රැකියා සුරක්ෂිත භාවය වඩා තහවුරුකිරිම"

මෙහෙවර

"ශක්තිමත් හා පුහුණු කාර්යය මණ්ඩලයක් හරහා කඩිනම් වුත් සාධාරණ වුත් යුක්තිය පසිඳලීමේ කාර්යක්ෂම ක්‍රියාවලියක් තුලින් රාජ්‍ය නොවන සේවකයින්ගේ රැකියා සුරක්ෂිත භාවය වඩා තහවුරු කිරිම"

කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය අංක **428/11**ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල අධිකරණ අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ පළමු මහලෙහි ස්ථාපිත කර ඇත.

**1957** අංක **62** දරණ කාර්මික ආරවුල් පනතේ **31** (ආ) වගන්තිය ප්‍රකාරව ලැබෙන පැමිණිලි සම්බන්ධ ඉල්ලුම්පත් විභාග කොට විසඳීම කම්කරු විනිශ්චය සභා වෙත පැවරී ඇති මූලික වගකීමවේ. රාජ්‍ය නොවන ආයතනවල සේවක පක්ෂය රැකියාවලින් නෙරපීම් ආදී අසාධාරණකම් පිළිබඳව යුක්තිය ඉෂ්ඨ කරවා ගැනීම සඳහා ඔවුන්ට ඇති මහඟු වරප්‍රසාදයක් ලෙස කම්කරු විනිශ්චය සභාව දැක්විය හැක. කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය යටතේ කම්කරු විනිශ්චය සභා **37** ක් ක්‍රියාත්මකවේ.

පහත සඳහන් ප්‍රදේශවල කම්කරු විනිශ්චය සභා ස්ථාපිතව ඇත.

| | | | |
|---|---|---|---|
| ළඹ 06 | පානදුර 01 | මහනුවර 01 | අම්පාර 01 |
| අවිස්සාවෙල්ල 01 | කළුතර 01 | පලාපත්වල 01 | මඩකලපුව 01 |
| රත්මලාන 01 | ගාල්ල 01 | නාවලපිටිය 01 | ත්‍රිකුණාමලය 01 |
| කඩුවෙල 01 | මාතර 01 | හැටන් 01 | හලාවත 01 |
| මහරගම 01 | කොටපොල 01 | තලවකැලේ 01 | අනුරාධපුරය 01 |
| වත්තල 01 | රත්නපුර 01 | නුවරඑළිය 01 | කුලියාපිටිය 01 |
| ගම්පහ 01 | කෑගල්ල 01 | බදුල්ල 01 | බලංගොඩ 01 |
| මීගමුව 02 | කුරුණෑගල 01 | බණ්ඩාරවෙල 01 | |

කම්කරු විනිශ්චය සභා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මානව සම්පත්, මූල්‍ය සම්පත් ලබාදීම හා කළමනාකරණය කිරීම කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයේ කාර්යයන්වේ. මේ හැර කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් හැර අනෙකුත් නිලධාරීන්ගේ ආයතන හා පරිපාලන කටයුතු සහ කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයේ වැටුප් හා දීමනා ගෙවීම් ඇතුළුව සියළුම මූල්‍ය පරිපාලන හා ගිණුම් කටයුතු ද කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය මගින් සිදු කරනු ලබයි.

**2014.01.01** දින සිට **2014.12.31** දින දක්වා ප්‍රගතිය

| **2014.01.01** දිනට විසඳීමට තිබූ නඩු සංඛ්‍යාව | **2014.01.01- 2014.12.31** දක්වා | | **2014.12.31** දිනට විසඳීමට ඇති නඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| | පැවරු නඩු ගණන | විසඳු නඩු ගණන | |
| **5,431** | **2320** | **2933** | **4818** |

කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් (2014.01.01 සිට 2014.12.31 දක්වා)

| තනතුර | ප්‍රමාණය | පාඨමාලාව |
|---|---|---|
| කා.ක.ස | නිලධාරීන් 04 | පොත් බැඳුම්කරු |
| රා.ක.ස.සේ | නිලධාරීන් 03<br><br>නිලධාරීන් 03<br><br>නිලධාරීන් 01<br><br>නිලධාරීන් 01 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව දෙමළ උසස් පාඨමාලාව<br>රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව දෙමළ මූලික පාඨමාලාව<br>ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන ඉංග්‍රීසි භාෂා මූලික පාඨමාලාව<br>පරිගණක පුහුණු වැඩසටහන |
| කවිස වල සියළුම නිලධාරීන්ට | නිලධාරීන් 315 | ඵලදායිතා සංකල්ප පිළිබඳ පුහුණු වැඩසටහන |
| ලසු ලේඛක නිලධාරීන්ට | නිලධාරීන් 46 | නවක ලසු ලේඛක නිලධාරීන් සඳහා දෙදින පුහුණු වැඩමුළුව |
| ගණකාධිකාරි | නිලධාරීන් 01 | IELTS පාඨමාලාව |

- ලසු ලේඛක නිලධාරීන්ගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ලිඛිත විභාගයක් වෘත්තිය පරීක්ෂණයෙන් සුදුසුකම් ලත් අයට සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුසුකම් ලත් නිලධාරීන් බඳවා ගැනීමේ කටයුත්ත අවසාන කර 2014.07.14 දින සිට ක්‍රියාත්මකවන පරිදි ලසු ලේඛක නිලධාරීන් 62 ක් බඳවා ගැනිම සිදුකරන ලදි.
- කම්කරු විනිශ්චය සභාවල සේවයේ නියුතු සියළුම නිලධාරීන් ආවරණය වන පරිදි ඵලදායිතා පුහුණු වැඩසටහන් 03ක් සති අන්තයේ පැවැත්වූ අතර එකි අත්දැකිම හා දැනුම භාවිතයෙන් කම්කරු විනිශ්චය සභාවල ඵලදායිතා වර්ධනය කිරිමට හා ඵලදායිතා ලේකම් කාර්යාලය සම්බන්ධීකරණයෙන් අවශ්‍ය දැනුවත් කිරීම් ලබාදිමටත් එම ආයතනය පවත්වන තරඟ සඳහා ඉදිරිපත් කිරිමට අවශ්‍ය කටයුතු කිරිම.
- 2014 දැයට කිරුළ වැඩසටහනට සමගාමීව අධිකරණ අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් අධිකරණ කලාප අතර පවත්වන ලද ඵලදායිතා සම්මාන තරඟාවලියේ <u>විශිෂ්ඨතම ඵලදායිතා සම්මානය</u> කුරුණෑගල කම්කරු විනිශ්චය සභාව හිමිකර ගැනිමට සමත්වූ අතර එම තරඟාවලියේම <u>කාර්යාල ක්‍රම</u> සඳහා වන විශේෂ කුසලතා සම්මානය කුලියාපිටිය කම්කරු විනිශ්චය සභාව වෙත ලබා ගැනිමට අවශ්‍ය මඟ පෙන්විම හා සම්පත් දායකත්වය ලබාදෙන ලදී.
- සියළුම කම්කරු විනිශ්චය සභා ආවරණය වන පරිදි පරිගණක උපාංග කට්ටලය බැගින් ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කල අතර එහි මුල් අදියර ලෙස නඩු සංඛ්‍යාව අධික කම්කරු විනිශ්චය සභා 30 ක් සඳහා පරිගණක උපාංග කට්ටලය බැගින් සපයන ලදී. ඉතිරි කම්කරු විනිශ්චය සභා සඳහා 2015 වසර ප්‍රතිපාදන භාවිතා කරමින් එකී වැඩසටහන ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර ඇත.

2014.01.01 දින සිට 2014 .12.31 දින දක්වා මූල්‍ය ප්‍රගතිය (228-01-02)

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | 233,550,000 | 233,256,858 |
| ප්‍රාග්ධන වියදම් | 15,116,000 | 12,530,453 |
| එකතුව | 248,666,000 | 245,787,311 |

# 08. අනුබද්ධිත ආයතන

## 8.1 ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය 1985 අංක 46 දරණ පනත යටතේ පිහිටුවා ඇත. මෙම ආයතනයේ පරිපාලනය කළමනාකරණ මණ්ඩලයක් මගින් සිදුවේ. එහි කළමනාකාරිත්වය අගවිනිසුරුතුමා සහ අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් දෙදෙනෙකුගෙන් සැදුම්ලත් සාමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම ආයතනයට අවශ්‍ය ප්‍රතිපාදන අමාත්‍යාංශය මගින් වෙන් කරනු ලැබේ.

අයතනයේ විෂයයන් හා කාර්යයන්

- I. අධිකරණ නිලධාරීන් අතර අධිකරණමය සහ නීතිමය ගැටළු පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීමට පහසුකම් සැපයීම
- II. අධිකරණ නිලධාරීන්ගේ දැනුම, කුසලතාවය, වෘත්තීය අත්දැකීම්, වැඩිදියුණු කිරීමට සාකච්ඡා, දේශන, වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම
- III. යුක්තිය පරිපාලනය සම්බන්ධව විවිධ තේමා ඔස්සේ පර්යේෂණාත්මක පාඨමාලාවන් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධිකරණ නිලධාරීන්ට පුස්තකාල පහසුකම් සහ වෙනත් අධ්‍යාපනික ආධාරකයන් සැපයීම

**2014.01.01 සිට 2014.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය**

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම | **19,033,000** | **19,032,865** |
| ප්‍රාග්ධන වියදම | **7,000,000** | **686,000** |
| එකතුව | **26,033,000** | **19,718,865** |

**2014.01.01 දින සිට 2014.12.31 දින දක්වා ප්‍රගතිය**

1. අභ්‍යාසලාභී අධිකරණ නිළධාරීන් උදෙසා පුහුණු සැසි 97 ක් පවත්වන ලදී.
2. "මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය; මහ බැංකුවේ නියාමන සහ අධීක්ෂණ කාර්යභාරය" යන මැයෙන් ආරාධිත දේශනයක් 2014.01.31 වන දින පවත්වන ලදී.
3. "සිද්ධි කළමනාකරණයෙන් නූතන ප්‍රවණතා සහ සමකාලීන අධිකරණ චර්යාව" යන මැයෙන් ආරාධිත දේශනය ඇමරිකා එක්සත් ජනපදයේ අභියාචනාධිකරණයේ සම්මානනීය ජ්‍යෙෂ්ඨ විනිසුරු සහ ප්‍රධාන විනිසුරු වන ගරු ජෝන් ක්ලිෆර්ඩ් වොලස් මැතිතුමා විසින් පවත්වන ලදී. ඒ සඳහා විනිසුරුවරුන් 145 දෙනෙකු සහභාගි වන ලදී.
4. "ඵලදායී සිද්ධි කළමනාකරණය සඳහා සමකාලීන පරිචයන් සහ නීතියේ ප්‍රමාදයන් වැළැක්වීම" යන මැයෙන් මහාධිකරණ විනිසුරුවන් සඳහා නේවාසික වැඩමුළුවක් පවත්වන ලදී.
5. ඇමෙරිකා එක්සත් ජනපදයේ නෙවාඩා දිස්ත්‍රික්කයේ දිසා විනිසුරු රොගර් එල්. හන්ට් මැතිතුමා විසින් "සිද්ධි කළමනාකරණය" යන තේමාව යටතේ වැඩමුළුවක් පවත්වන ලදී. විනිශ්චයකාරවරුන් 138 දෙනෙක් මේ සඳහා සහභාගී වූහ.

6. දකුණ , උතුරුමැද, මධ්‍යම සහ උතුරු පළාත්වල විනිසුරුවරුන් සඳහා " සිද්ධි කළමනාකරණය සහ සමථකරණය" පිළිබඳව නේවාසික වැඩමුළුවක් පවත්වන ලදී.
7. මහනුවර උසාවි සංකීර්ණයේ විනිසුරුවරුන්, නීතිඥවරුන් සහ නැගෙනහිර පළාතේ දිසා විනිසුරුවරුන් සඳහා " සිද්ධි කළමනාකරණය සහ සමථකරණය" පිළිබඳ එක් දින සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.
8. ගරු විනිසුරු ජේ.එෆ්.ඒ සෝසා අනුස්මරණ දේශනය පවත්වන ලද අතර විනිශ්චය කාරවරුන්ගේ ජර්නලයේ (Judges Journal) III වන වෙළුම 2014 මැයි 09 වන දින එළි දක්වන ලදී.
9. විනිශ්චයකාරවරුන්ගේ භාවිතය පිණිස "මනුපුත්‍ර නෛතික දත්ත සංහිතාව" ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේදී ස්ථාපනය කරන ලදී.
10. විනිශ්චයකාරවරුන්ගේ පරිශීලනය පිණිස පුස්තකාලය සඳහා නීතිය පිළිබඳ නව ග්‍රන්ථ මිලදී ගන්නා ලදී.
11. පහත සඳහන් පරිදි කාර්ය මණ්ඩලයට බඳවා ගැනීම් සිදු කෙරිණි.

| | |
|---|---|
| කා.කා.ස (කොන්ත්‍රාත් පදනම) | 02 |
| ගෘහ පාලක (කොන්ත්‍රාත් පදනම) | 01 |
| පුස්තකාලයාධිපති (ස්ථිර) | 01 |
| සහකාර ගණකාධිකාරී (ස්ථිර) | 01 |

12. ඒ.ආර්.බී අමරසිංහ මැතිතුමා විසින් රචිත අධිකරණ ආචාර ධර්ම පිළිබඳ ග්‍රන්ථ 52ක් මිළදී ගෙන විනිශ්චයකාරවරුන් අතර බෙදා හරින ලදී.
13. අධිකරණ විෂය අඛණ්ඩව හැදෑරීම සාක්ෂාත් කරගැනීමේ පියවරක් ලෙස කණ්ඩායම් සාකච්ඡා සහ සිද්ධි අධ්‍යයන වැඩසටහන් වැනි නව ශිල්පීය ක්‍රම හඳුන්වා දෙමින් අධිකරණ නිලධාරින්, මහාධිකරණ විනිසුරුවරුන්, කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් සඳහා සෙනසුරාදා දිනවල පැවැත්වෙන දේශන තවදුරටත් පවත්වාගෙන යාම සඳහා සියලුම පියවර ගනු ලැබ තිබේ. ඒ අනුව මහාධිකරණ විනිසුරුවරුන් 321 ක්, අධිකරණ නිලධාරින් 822 ක් සහ කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් 118 දෙනෙකුගේ සහභාගීත්වයෙන් සෙනසුරාදා දිනවල දේශන 57 ක් පවත්වා තිබේ.
14. විද්‍යුත් පුස්තකාලයක් එළි දක්වන ලදී.

විනිශ්චයකාරවරුන් සඳහා පවත්වන ලද විදේශ පුහුණු වැඩසටහන්

| පුහුණු වැඩසටහන | ආයතනයේ නම | විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව |
|---|---|---|
| අධිකරණ අචාරධර්ම සහ ඵලදායි අධිකරණ සහ සිද්ධි කළමනාකරණය | අධිකරණ පුහුණු ආයතනය මලයාසියාව | **80** |
| අධිකරණ ප්‍රතිසංස්කරණ සහ විශිෂ්ඨත්වය - සිංගප්පූරු අත්දැකිම | සිවිල් සේවා පාසැල සිංගප්පූරුව | **25** |
| සිද්ධි කළමනාකරණය සහ සිවිල් නීති ප්‍රතිසංස්කරණ සහ පවුල් නීති ප්‍රතිසංස්කරණ | අධිකරණ අධ්‍යාන ආයතනය දිල්ලි නුවර | **40** |

## 8.2 නීති විද්‍යාලය

**1990** සංශෝධිත නීති අධ්‍යයන සභා පනත යටතේ පිහිටුවන ලද නීති අධ්‍යාපන සභාව, ශ්‍රී ලංකා නීති විද්‍යාලීය කළමනාකරණයේ වගකීම දරනු ලබයි. අධිකරණ අමාත්‍යවරයාගේ එකඟතාවය මත නීති අධ්‍යාපන සභාව විසින් සකස් කරන ලද නීති අනුව නීති විද්‍යාලය ක්‍රියාත්මකවේ. නීති අධ්‍යාපන සභාවේ සභාපතිත්වය ගරු අගවිනිසුරුතුමා විසින් හොබවන අතර නම්කරන / පත්කරනු ලබන සමාජිකයන් **10** දෙනෙකුගෙන් සභාව සමන්විත වේ. අගවිනිසුරුතුමා විසින් නම් කරන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් දෙදෙනෙකුගෙන් ද ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සමාජිකයන් දෙදෙනෙකුගෙන්ද අධිකරණ අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන සමාජිකයන් හය දෙනෙකුගෙන්ද හා නිල බලයෙන් පත්වන සාමාජිකයන් **03** දෙනෙකුගෙන් මෙම සභාව සමන්විත වෙයි. නිලබලයෙන් පත්වන සාමාජිකයන් තිදෙනා ලෙස ගරු නීතිපතිතුමා, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් සහ ගරු සොලිසිටර් ජනරාල් නම් කර ඇත.

නීති විද්‍යාලය වසර **3 1/2** ක පාඨමාලාවක් පවත්වන අතර එක් එක් වසර අවසානයේ පවත්වන පරීක්ෂණ තුනෙන් සමත්වන අපේක්ෂකයින් නීතිඥවරුන් ලෙස බඳවා ගනු ලැබීමට සුදුසුකම් ලබයි. මෙම නීති සිසුන් නීතිඥයකු ලෙස දිවුරුම් දීමට ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලුම් කිරීමට පෙර අවුරුදු **08** ක අවම පළපුරුද්ද සහිත ජ්‍යෝෂ්ඨ නීතිඥවරයෙකු යටතේ මාස **06** ක ආධුනික කාලයක් ගත කිරීම අවශ්‍ය වෙයි.

මෙම ආයතනය ස්වයංමූල්‍ය සංවිධානයක් ලෙස ක්‍රියාත්මක වේ. එසේම නීතිඥ වෘත්තියේ ඉතාමත් දක්ෂ හා පළපුරුදු සම්පත් දායකයින් විසින් දේශන පවත්වනු ලබයි.

නීති විද්‍යාලයේ විභාග කටයුතු වඩාත් කාර්යක්ෂම කොට ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා විභාග අධ්‍යක්ෂකවරයකු යටතේ ස්වාධීන විභාග අංශයක් ස්ථාපිත කොට, අභ්‍යන්තර නීති විභාග සියල්ල ඒ හරහා පැවැත්වීමට විධිවිධාන සළස්වා තිබේ. ඒ අනුව **2014** අප්‍රේල් විභාගයට පෙනී සිටි සිසුන් **872**කට විභාගය පැවැත්වීම හා නීති විද්‍යාලය තුළම උත්තර පත්‍ර පරික්ෂා කරවීම තුළින් ප්‍රතිඵල විනිවිද භාවය ආරක්ෂා කරවීමට අතිරේකව ප්‍රතිඵල කඩිනමින් නිකුත් කිරීමේ හැකියාවද ලැබී ඇත.

**2014.01.01** දින සිට **2014.12.31** තෙක් කාලයට නීති ශිෂ්‍යයන් (නීති ප්‍රවේශ විභාගයෙන් සහ එල්.එල්.බී. නීති ශිෂ්‍යයන්) **670** දෙනෙකු පාඨමාලා සඳහා බඳවාගෙන පුහුණු කිරීම කරනු ලැබේ.

**2015** වර්ෂයට නීති ශිෂ්‍යයින් ඇතුළත් කරගැනීම සඳහා විභාග කොමසාරිස් විසින් තරඟ විභාගයක් **2014.09.06** දින පවත්වන ලදී. ඊට අයදුම්කරුවන් **3571**ක් පෙනී සිටි අතර ඉන් **214** අධ්‍යන වර්ෂය සඳහා තෝරා ගන්නා ලදී.

# II කොටස

අංක **1909/20** දරණ **2015.04.06** දිනැති අති විශේෂ ගැසට් පත්‍රය අනුව අධිකරණ අමාත්‍යාංශයය් විෂය පථයට පහත සඳහන් දෙපාර්තමේන්තු හා ආයතන ද ඇතුලත් කරන ලදි.

**1.** නීතිපති දෙපාර්තමේන්තුව

**2.** නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව

**3.**බන්ධනාගාර දෙපාර්තමේන්තුව

**3.**ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

**4.**මහා භාරකාර දෙපාර්තමේන්තුව

ඒ අනුව ඉහත දෙපාර්තමේන්තු හා පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයට අදාළව **2014** වර්ෂයේ කාර්ය සාධන වාර්තාව මෙතැන් සිට ඉදිරියට දක්වා ඇත.

# 9. පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

## අමාත්‍යාංශය ළඟා කර ගත් ඉලක්කයන්

### 1. රැඳවි තදබදය අවම කිරීම

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ දී තදබදය අවම කිරීම සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරන ලදී. ඒ අනුව පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත

### 1.1. බන්ධනාගාර විතැන් කිරීම

ඉතා ඉහළ ආර්ථික වටිනාකමක් ඇති නගර මධ්‍යයේ ස්ථාපිත කර ඇති බන්ධනාගාර නගරයෙන් බැහැර වඩා ඉඩ පහසුකම් ඇති ප්‍රදේශවලට විතැන් කිරීම අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිය වේ. ඒ අනුව බෝගම්බර බන්ධනාගාරය පල්ලෙකැලේට (දුම්බර) විතැන් කිරීම පියවර 03ක දී අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර මේ වන විට දෙවන පියවරෙහි වැඩ නිම කර ඇත.

එසේම තංගල්ල බන්ධනාගාරය අගුණකොලපැලැස්සට විතැන් කිරීමට කටයුතු කරමින් පවතී.



මීට අමතරව කුලී නිවාස දෙකක දැඩි අපහසුතා මධ්‍යයේ රැඳවියන් 400 ක් පමණ රඳවා ගනිමින් දැනට පවත්වා ගෙන යනු ලබන යාපනය බන්ධනාගාරය වෙනුවට නව බන්ධනාගාරයක් ඉදි කිරීමේ කටයුතු මේ වන විටත් සිදු වෙමින් පවතී.

තව ද ගාල්ල, මීගමුව, ත්‍රිකුණාමලය සහ මඩකලපුව යන බන්ධනාගාර විතැන් කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කෙරෙමින් පවතී.

### 1.2. ප්‍රජා පාදක විශෝධන ක්‍රමය ශක්තිමත් කිරීම

බන්ධනාගාර තුළ පවතින තදබදය අවම කිරීම සඳහා විකල්ප ක්‍රමයක් වශයෙන් වසර 02කට අඩු දඬුවම් ලබා දිය හැකි වැරදි සම්බන්ධයෙන් ක්‍රියාත්මක කෙරෙන ප්‍රජා පාදක විශෝධන ක්‍රමය පුළුල් කිරීමට කටයුතු යොදා ඇත. ඒ යටතේ අවශ්‍ය මානව හා භෞතික සම්පත් හා නෛතික ප්‍රතිපාදන ලබාදීමට පියවර ගෙන ඇත.

### 2. ගුණාත්මක සේවයක් සඳහා පරිපාලන ප්‍රතිසංස්කරණ

අමාත්‍යාංශය හා අනුබද්ධිත දෙපාර්තමේන්තු හා ආයතනයන්හි සේවක පුරප්පාඩු පිරවීමටත්, නව තනතුරු ඇති කිරීමට හා මනා කාර්යක්ෂම හා ඵලදායී මානව සම්පතක් සඳහා දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් පියවර ගෙන ඇත.

බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ දැනට පවතින පුහුණු ආයතනය වඩා පහසුකම් සහිතව 2015 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව මාතර කොටවිල ප්‍රදේශයේ ඉදිකිරීමට පියවර ගෙන ඇත.

## 3. රැඳවි පුනරුත්ථාපනය ගුණාත්මකව සංවර්ධනය කිරීම

### 3.1. වටරැක බන්ධනාගාර පාසල



බන්ධනාගාරගතවීම හේතුවෙන් අධ්‍යාපන අවස්ථා අහිමි වන සිරකරුවන්ට විධිමත් අධ්‍යාපනයක් ලබාදීම සඳහා වටරැක එළිමහන් බන්ධනාගාරය කේන්ද්‍ර කරගෙන අධ්‍යාපන අමාත්‍යාංශයේ සෘජු මැදිහත් වීම යටතේ බන්ධනාගාර පාසලක් ආරම්භ කිරීම.

### 3.2. නිදහස්වීමට නියමිත හා නිවාස නිවාඩු *ලබන රැඳවියන් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම සඳහා පුද්ගල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.*

- මේ යටතේ බන්ධනාගාර නිලධාරීන් 100 දෙනෙකු පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත.
- තවද "බුදු දහම තුළින් ජීවිතය ගොඩනැගීම" යන තේමාව යටතේ බන්ධනාගාර 04 ක් තුළ දේශන මාලාවක් පවත්වා ඇත.

## 4. රැඳවි පවුල් සුභසාධනය, සංවර්ධනය හා පසුභාරකාරීත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

නැවත නැවත බන්ධනාගාරගත වීමේ ප්‍රවණතාවය හා වැරදිවලට බලපාන සාධක අවම කිරීමටත්, පුනරුත්ථාපනය වී සමාජගත වූ පසුව ඔවුන් පිළිබඳ පසුවිපරම් කිරීමටත්, ඔවුන්ට මුහුණ දීමට සිදුවන සමාජ, ආර්ථික ගැටළු විසඳා ගැනීමට සහාය වීම තුළින් යහපත් මිනිසුන් ලෙස ජීවත්වීමට අවශ්‍ය සමාජ වටපිටාව නිර්මාණය කරදීමටත්, බන්ධනාගාර තුළ සිටින රැඳවියන්ගේ පවුල්වල ආර්ථික, සමාජ හා අධ්‍යාත්මික තත්ත්වය නඟා සිටුවීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම සිදුකිරීමටත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

මේ යටතේ ශ්‍රී ලංකාවේ සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීමට සැලසුම් කර ඇති අතර මේ වනවිටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 242 කට නිලධාරීන් අනුයුක්ත කර ඇත. එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි සිර පවුල්වල පාසල් නොයන ළමුන් පාසල් යැවීම, වෘත්තීය නිපුණතාවය ලබාදීම, ස්වයං රැකියාවලට යොමුකරවීම වැනි වැඩසටහන් දැනට ක්‍රියාත්මක කරමින් ඇත.

## 5. පනත් සංශෝධනය

අධිකරණ අමාත්‍යාංශය විසින් පත්කරන ලද විශේෂිත කමිටුවක් විසින් කෙටුම්පත් කරන ලද සංශෝධිත බන්ධනාගාර පනතට මෙම අමාත්‍යාංශයේ නිරීක්ෂණ සහිත එකඟතාවය අධිකරණ අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. ප්‍රජා පාදක විශෝධන පනත සංශෝධනය කිරීම සඳහා පත් කරන ලද විශේෂ කමිටුවක් මඟින් සංශෝධනයන් කෙටුම්පත් කර ඇත.

**6.** **මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා පොළොන්නරු දිස්ත්‍රික්කයේ කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානය වෙත යොමු කිරීම.**

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් බන්ධනාගාරගත නොකර පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය යටතේ ඇති කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානය වෙත යොමු කර පුනරුත්ථාපනය කෙරෙමින් පවතී.

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් තවදුරටත් වරදකරුවන් වශයෙන් නොසලකා ඔවුන්ගේ චර්යා හැඩ ගැස්වීම තුළින් මනා පෞරුෂයකින් හෙබි පුද්ගලයන් ලෙස සමාජගත කිරීම මෙහි අරමුණ වේ. ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සලසා දෙන ලදී. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් බන්ධනාගාරවලින් ඉවත් කිරීමත් සමඟ බන්ධනාගාර තදබදය අවම කිරීමට හැකි වී ඇත.

**7.** **පුනරුත්ථාපන ක්‍රියාවලිය වඩා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා අන්තර් අමාත්‍යාංශ සහයෝගීතාවය ලබා ගැනීම.**

ඵලදායී පුනරුත්ථාපන ක්‍රියාවලියක් සඳහා ඒකාබද්ධ අන්තර් අමාත්‍යාංශ වැඩපිළිවෙලක අවශ්‍යතාව වටහාගෙන විවිධ අමාත්‍යාංශ සමඟ ඒකාබද්ධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. එමඟින් විවිධ අමාත්‍යාංශයන් හි සහාය ලබාගෙන වෘත්තීය පුහුණුව, කලා හා සෞන්දර්ය, අධ්‍යාපන, උපදේශන වැනි වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

උදා : අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව වටරැක බන්ධනාගාර පාසල පවත්වාගෙන යාම

**8.** **බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම.**

සිරකරුවන් පිළිබඳ සියළු තොරතුරු පරිගණකගත කිරීමත් එමඟින් කාර්යක්ෂම අන්තර් තොරතුරු හුවමාරුවක් ඇති කිරීමත් පරිපාලනය කාර්යක්ෂම කිරීමත්, ආරක්ෂාව විධිමත් කිරීමත් තොරතුරු කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම තුළින් අපේක්ෂා කෙරේ.

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල පුනරාවර්තන හා මූලධන වියදම් සාරාංශය

| ආයතනය | වැය විෂය | 2014 වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන (රු.මි.) | | | 2014.12.31 දිනට සමුච්චිත වියදම (රු.මි.) | |
|---|---|---|---|---|---|---|
| | | වාර්ෂික ඇස්තමේන්තුව | අමතර ප්‍රතිපාදන ලැබීම් | එකතුව | වියදම | ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් වශයෙන් |
| පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය ✶ | මූලධන | 51.400 | | 51.400 | 46.279 | 90.04% |
| | පුනරාවර්තන | 118.580 | | 118.580 | 114.963 | 96.95% |
| | එකතුව | 169.980 | | 169.980 | 161.242 | |
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව | මූලධන | 1110.500 | 484.796 | 1595.296 | 1424.439 | 89.29% |
| | පුනරාවර්තන | 3951.250 | 327.350 | 4278.600 | 4233.166 | 98.94% |
| | එකතුව | 5061.750 | 812.146 | 5873.896 | 5657.605 | |
| ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | මූලධන | 6.700 | 6.400 | 13.100 | 12.750 | 97% |
| | පුනරාවර්තන | 79.650 | 120.970 | 200.620 | 162.020 | 81% |
| | එකතුව | 86.350 | 127.370 | 213.720 | 174.770 | |
| මුළු එකතුව | මූලධන | 1168.600 | 491.196 | 1659.796 | 1483.468 | 89.38% |
| | පුනරාවර්තන | 4149.480 | 448.32 | 4597.800 | 4510.149 | 98.09% |
| | මුළු එකතුව | 5318.08 | 939.516 | 6257.596 | 5993.617 | |

✶ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ සහ පුනරුත්ථාපන අධිකාරියේ මූලධන හා පුනරාවර්තන වියදම් අමාත්‍යාංශයේ වියදම් තුළ අන්තර්ගත වී නැත.

## 9.1 බන්ධනාගාර දෙපාර්තමේන්තුව

ආරක්ෂාව, රැකවරණය හා විශෝධනය යන ප්‍රධාන අරමුණු ඉලක්ක කර ගෙන 1905 ජූලි මස 16 වන දින දෙපාර්තමේන්තුවක් බවට බන්ධනාගාර දෙපාර්තමේන්තුව පත් විය. ඉහත අරමුණු ළගා කර ගැනීම සඳහා දිවයින පුරා විහිදුනු සංවෘත බන්ධනාගාර 03 කින් ද, රිමාන්ඩ් බන්ධනාගාර 20 කින් ද, වැඩ කඳවුරු 10 කින් ද, එළිමහන් සිර කඳවුරු 02 කින් ද, තරුණ වරදකරුවන් සඳහා වූ විශෝධන මධ්‍යස්ථාන 02කින් ද, බන්ධනාගාර පාසල් 01කින් ද යුක්තව වර්තමාන බන්ධනාගාර දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ.

## 2014 ළගා කර ගැනීමට අපේක්ෂා කළ ඉලක්කයන්

01. බන්ධනාගාර තදබදය අවම කිරීම සඳහා නගරාශ්‍රිත බන්ධනාගාර විතැන් කිරීමට කටයුතු කිරීම.
02. සේවා අවශ්‍යතාවයන්ට අනුකූලව පුහුණු හා පර්යේෂණ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම මගින් මනා පරිචයකින් හා සේවා තෘප්තියකින් යුතු සේවකයන් බිහිකිරීම.
03. සිරකරුවන් රටේ නිෂ්පාදන ක්‍රියාවලියට දායක විය හැකි වෘත්තීය කුසලතාවයෙන් පිරිපුන් නීතිගරුක හා සදාචාරසම්පන්න පුද්ගලයින් බවට පත් කිරීම.
04. බන්ධනාගාර ස්වයං යැපුම් මට්ටමකට ගෙන ඒම තුළින් රටේ ආර්ථික සංවර්ධනයට සිර ශ්‍රමය දායක කර ගැනීම.

## 2014 ළගා කර ගත් ඉලක්කයන්

1. <u>බන්ධනාගාර තදබදය අවම කිරීම</u>

අධික තදබදයකින් යුතු බන්ධනාගාරයන් හි රැඳවියන් වර්ගීකරණය, රැඳවියන්ගේ පුනරුත්ථාපන කටයුතු හා ඔවුන්ට අවශ්‍ය මූලික පහසුකම් ලබා දීම යනාදිය සිදු කිරීම අපහසු බැවින් නගර මධ්‍යයේ පිහිටි බන්ධනාගාර නගරයෙන් පිටත වඩාත් ඉඩ පහසුකම් සහිත ස්ථානයන් හි ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරමින් පවතී.

මේ යටතේ මහනුවර නගර මධ්‍යයේ පිහිටි බෝගම්බර බන්ධනාගාරය පවත්වාගෙන ගිය භූමිය 2014 ජුනි 20 වැනි දින රජයට භාර දීමට කටයුතු කරන ලදි.

1.1. නගර මධ්‍යයේ පිහිටුවා ඇති බන්ධනාගාර නගරයෙන් බැහැරට විතැන් කිරීම.

I. මහනුවර නගර මධ්‍යයේ පැවති බෝගම්බර බන්ධනාගාරය පල්ලෙකැලේ (දුම්බර) නව බන්ධනාගාර සංකීර්ණය වෙත විතැන් කිරීම.

2013 වර්ෂයේ දී පළමු අදියර අවසන් කර ඇති අතර 2014 වර්ෂයේ දී දෙවන අදියරට අදාලව මේ වන විට රුපියල් මිලියන 223ක් වැය කර පහත ඉදිකිරීම් සිදු කර ඇත.

- I පෙළ ජේලර් නිල නිවාස 100%
- අමුත්තන් රැඳිසිටීමේ ශාලාව 100%
- ජල ටැංකි 52%
- ප්‍රධාන ගබඩාව 44%
- බන්ධනාගාර රෝහල 36%

II. යාපනයේ නව බන්ධනාගාර සංකීර්ණය ඉදිකිරීම



රු.මිලියන 196 ක් වැය කර අදියර 1 A හි වැඩ අවසන් කර ඇති අතර ඒ සඳහා මෙම වර්ෂයේ රු.මිලියන 87ක වැය දරා ඇත. 1B අදියර සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර මේ වනවිට 25% ක වැඩ නිමකර ඇත.

III. අගුණකොලපැලැස්ස නව බන්ධනාගාර සංකිර්ණය ඉදිකිරිම



දැනට අක්කර 01 ¼ ක පිහිටුවා ඇති තංගල්ල බන්ධනාගාරය අක්කර 65 කින් යුතු අගුණකොලපැලැස්ස නව බන්ධනාගාර සංකිර්ණයට විතැන් කිරීමට කටයුතු කරමින් පවතින අතර 2014 වර්ෂයට වෙන් කළ රුපියල් මිලියන 961 ක ප්‍රතිපාදන මගින් අත්තිකාරම් මුදල් ගෙවීම් කර 16% ක ඉදිකිරීම් මේ වන විට අවසන් කර ඇත. මෙම නව බන්ධනාගාරය මානුෂික අවශ්‍යතා සැලකිල්ලට ගෙන සකස් කර ඇති අතර එය බන්ධනාගාර රෝහල, අංග සම්පූර්ණ වෘත්තීය පුහුණු අංශය, කර්මාන්ත අංශය, කර්මාන්ත නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානය, ක්‍රීඩා සංකීර්ණය, අමුත්තන් රැඳී සිටීමේ ශාලාව, රැඳවියන් බැලීමේ ශාලාව, නිලධාරීන් සඳහා නිල නිවාස, භෝජනාගාර ඇතුළු සියලු පොදු පහසුකම් වලින් සමන්විත බන්ධනාගාරයකි.

IV. මාතර හා ත්‍රිකුණාමලය බන්ධනාගාර ඉදිකිරීම් සඳහා ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන් කර ඇති අතර ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නියමිතව ඇත.

V. ඉදිරි වසරවල දී මීගමුව, ගාල්ල සහ මඩකලපුව නව බන්ධනාගාර විතැන් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.

### 1.2. බන්ධනාගාරගත රැඳවියන් සමාජගත කිරීම

රැඳවි තදබදය අවම කිරීම සඳහා බලපත්‍ර මත මුදා හැරීම, බන්ධනාගාර සාමාන්‍ය සමාව හා නිදහස් දින සහ වෙසක් දින විශේෂ රාජ්‍ය සමාව යටතේ රැඳවියන් 9688ක් සමාජගත කර ඇත.

## 2. <u>මානව සම්පත් සංවර්ධනය</u>

### 2.1. පුරප්පාඩු පිරවීම හා තනතුරු ඇති කිරීම

#### 2.1.1. නව තනතුරු ඇති කිරීම.

මෙම වසර තුළ II පෙළ ජේලර් (කාන්තා) තනතුරු 11ක් හා නියාමක (කාන්තා) තනතුරු 80ක් ලෙස තනතුරු 91ක් සඳහා කාර්ය මණ්ඩලය වැඩිකර ගැනීමට කටයුතු කර ඇත.

#### 2.1.2. උසස්වීම්

2014 වර්ෂයේ දී පහත පරිදි උසස්වීම් ලබා දීමට කටයුතු කර ඇත.

| අංකය | තනතුරු නාමය | සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ප්‍රධාන ජේලර් (පිරිමි ) | 20 |
| 2. | පුනරුත්ථාපන නිලධාරි (I පෙළ පිරිමි ) | 5 |
| 3. | පුනරුත්ථාපන නිලධාරි (I පෙළ කාන්තා ) | 1 |
| 4. | II පෙළ ජේලර් (කාන්තා) | 4 |
| 5. | II පෙළ ජේලර් (පිරිමි) | 58 |
| 6. | සැරයන් | 492 |
| 7. | හෙද නිලධාරි (III,II,I) | 16 |
| 8. | කර්මාන්ත පරිපාලක | 6 |
| 9. | I පෙළ වෘත්තීය උපදේශක/ II පෙළ වෘත්තීය උපදේශක | 51 |
| | එකතුව | 653 |

තවද බන්ධනාගාර කොමසාරිස් තනතුරු 03ක්, විශේෂ ශ්‍රේණියේ බන්ධනාගාර අධිකාරි තනතුරු 05ක්, බන්ධනාගාර අධිකාරි තනතුරු 07ක් සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) 01ක් හා සහකාර බන්ධනාගාර අධිකාරි තනතුරු 15ක් සඳහා පත්වීම් ලබාදීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට ඉල්ලුම් කර ඇත.

### 2.1.3. නව බඳවාගැනීම්

2014 වර්ෂයේ දී සිදුකර ඇති නව බඳවා ගැනීම් පහත පරිදි වේ.

| අංකය | තනතුරු නාමය | සංඛ්‍යාව |
|---|---|---|
| 1. | නියාමක | 239 |
| 2. | මෝටර් රියදුරු | 25 |
| 3. | මෝටර් කාර්මික | 5 |
| 4. | ට්‍රැක්ටර් රියදුරු | 5 |
| 5. | මුරකරු | 9 |
| 6. | කම්කරු | 1 |
| | එකතුව | 284 |

බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා අනුමත කර ඇති තනතුරු සංඛ්‍යාවෙන් පුරප්පාඩු 2146 ක් පවතින අතර ඒ සඳහා නව බඳවා ගැනීම් සඳහා කටයුතු සිදු කරමින් පවතී.

## 2.2. කාර්යක්ෂම සේවයක් සඳහා පුහුණුව

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අරමුණු හා ඉලක්ක සපුරාලනු වස් කුසලතාවයෙන් පිරිපුන් කාර්යක්ෂම නිලධාරීන් පිරිසක් බිහිකිරීම සඳහා නිලධාරීන් 2862 කට රු. මි. 8.183 ක මුදලක් වැය කරමින් පහත දැක්වෙන පාඨමාලා පවත්වා ඇත.

**2.3. 2015** දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව මාතර කොටවිලවත්තේ බන්ධනාගාර පුහුණු පාසලක් ඉදිකිරීමට පියවර ගෙන ඇත. **2014** වර්ෂය සඳහා රු. මිලියන **15** ක මුදලක් වැයකර ඇත.

**3.** රැඳවි පුනරුත්ථාපනය ගුණාත්මකව සංවර්ධනය කිරීම

**3.1.** එළිමහන් සිර කඳවුරු ඇති කිරීම

දැනට පවතින බන්ධනාගාර සංඛ්‍යාව අඩු කර ඒවා පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා එළිමහන් සිර කඳවුරු බවට පත් කිරීමෙන්, හුදෙක් වරදකරුවන් සිරගත කර තැබීම වෙනුවට ඔවුන්ගේ පුනරුත්ථාපන කටයුතු ගුණාත්මකව සිදුකිරීමට හැකියාව ලැබේ. ගිරිබාව එළිමහන් සිර කඳවුරක් ඇති කිරීමටත්, හංගිලිපොල එළිමහන් සිර කඳවුර වැඩි දියුණු කිරීමටත් බලාපොරොත්තු වේ.

**3.2.** බන්ධනාගාර රැඳවියන්ට විධිමත් අධ්‍යාපනයක් ලබා දීම පිණිස වටරැක බන්ධනාගාර පාසල අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි. දැනට තරුණ රැඳවියන් **39**ක් හා සාමාන්‍ය රැඳවියන් **17** ලෙස ශිෂ්‍යයන් **56**ක් අධ්‍යාපනය ලබයි.

**3.3.** රැඳවියන් සඳහා පැවැත් වූ පුනරුත්ථාපන වැඩසටහන්

| අංකය | වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | රැඳවියන් සංඛ්‍යාව | වැය වූ මුදල (රු) |
|---|---|---|---|---|
| 1 | සර්වාගමික වැඩසටහන් | 4427 | 132742 | 708,148 |
| 2 | අධ්‍යාපන හා සුබසාධක කටයුතු | 5990 | 225018 | 544,560 |
| 3 | ක්‍රීඩා හා වෙනත් | 1605 | 56882 | 1,293,086 |
| 4 | ත්‍යාග දීම් (රැඳවි ඇගයීම්) | 198 | 5209 | 217,750 |

- පළමු වරට බන්ධනාගාර නේවාසිකයින් **500** ක් බාලදක්ෂයින් ලෙස බඳවාගෙන පුහුණුවීම් සිදු කර පළමු බාලදක්ෂ කඳවුර **2014** පෙබරවාරි **08, 09** දෙදින තුළ නුවරඑළිය පීඩෘ බාලදක්ෂ කඳවුරේ දී පවත්වන ලදී.



- සිරකරුවන්ගේ කලා කුසලතා සංවර්ධනය උදෙසා වැලිකඩ බන්ධනාගාර නේවාසිකයින් විසින් ඉදිරිපත් කරන ලද " වීරයෝ මැරෙන්නෙ නෑ" වේදිකා නාට්‍ය **2014** පෙබරවාරි **28** දින වේදිකා ගත කරන ලදි.

- සූපවේදී පුහුණුව ලත් බන්ධනාගාර නේවාසිකයින් ප්‍රථම වතාවට ඉදිරිපත් කරන ලද ආහාර ප්‍රදර්ශනය **2014** මාර්තු **08** වන දින ගාලු මුවදොර පිටියේ දී පැවැත්වීමට කටයුතු කිරීම.

- සියළුම බන්ධනාගාර ආයතනවල සහභාගීත්වය යටතේ බන්ධනාගාර වෙසක් කලාපය ගාල්ල සමණල ක්‍රීඩාංගණයේ දී ද, පොසොන් කලාපය අකුරැස්ස අමලගොඩ මහා විදුහල් ක්‍රීඩාංගණයේ දී ද, ඇසල කලාපය දෙණියාය මධ්‍ය මහා විද්‍යාලීය ක්‍රීඩාංගණයේ දී ද පැවැත්වීම

- බන්ධනාගාර නිලධාරීන් සඳහා මෝටර් සයිකල් 50ක් බෙදා දීමේ උත්සවය 2014.09.03 දින බන්ධනාගාර මූලස්ථානයේ දී පැවැත්වීම.
- නව බන්ධනාගාර පුහුණු පාසලට මුල්ගල තැබීම 2014.09.05 වන දින මාතර කොටවිල දී සිදුකිරීම.
- අන්තර් බන්ධනාගාර මළල ක්‍රීඩා උත්සවය 2014 දෙසැම්බර් මස 06, 07 යන දෙදින තුළ කොළඹ - 07, ටොරින්ටන් ක්‍රීඩා පිටියේ දී පවත්වන ලදි.
- බන්ධනාගාර සේවා පදක්කම් ප්‍රදානෝත්සවය 2014.09.07 දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට කටයුතු කිරීම.

### 3.4. රැඳවි පුනරුත්ථාපනය සඳහා අන්තර් අමාත්‍යාංශ දායකත්වය

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ මැදිහත්වීම මත ක්‍රියාත්මක අන්තර් අමාත්‍යාංශ වැඩසටහන යටතේ අමාත්‍යාංශ හා ආයතන 18 ක සහභාගීත්වයෙන් පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය.

ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

| අංකය | දායකත්වය සැපයූ අමාත්‍යාංශය/ ආයතනය | අපේක්ෂිත වැඩසටහන් සංඛ්‍යාව | ක්‍රියාත්මක වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභී රැඳවියන් සංඛ්යාව |
|---|---|---|---|---|
| 1. | වෘත්තීය පුහුණු අධිකාරිය | 361 | 361 | 1091 |
| 2. | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 123 | 123 | 295 |
| 3. | සංස්කෘතික අමාත්‍යාංශය | 33 | 33 | 49 |
| 4. | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 18 | 18 | 45 |
| 5. | අධ්‍යාපන අමාත්‍යාංශය (නොවිධිමත් අධ්‍යාපන ඒකකය) | 283 | 283 | 802 |
| 6. | කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය | 39 | 39 | 84 |
| 7. | ජාතික තරුණ සේවා සභාව | 6 | 6 | 10 |
| 8. | සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | 6 | 6 | 10 |
| 9. | කෘෂිකර්ම අමාත්‍යාංශය, ගොවිජන සේවා මධ්‍යස්ථානය | 18 | 18 | 15 |
| 10. | සෞඛ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 228 | 228 | 5006 |
| 11. | දේශිය වෛද්‍ය අමාත්‍යාංශය | 37 | 37 | 390 |
| 12. | අධිකරණ අමාත්‍යාංශය | 37 | 37 | 127 |
| 13. | අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය | 118 | 118 | 1775 |
| 14. | කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව | 6 | 6 | 60 |
| 15. | පරිසර අමාත්‍යාංශය | 1 | 1 | 100 |
| 16. | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 40 | 40 | 340 |
| 17. | සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | 18 | 18 | 30 |
| 18. | වනිතා කටයුතු අමාත්‍යාංශය | 12 | 12 | 13 |

## 4. සංවර්ධන ක්‍රියාවලිය සඳහා සිර ශ්‍රමය යොදා ගැනීම

### 4.1. කෘෂි කාර්මික, සත්ව පාලන හා කර්මාන්ත අංශ වැඩි දියුණු කිරීම තුළින් නිෂ්පාදන ඵලදායිතාව ඉහළ නැංවීම.

බන්ධනාගාර රැඳවියන් රටේ ආර්ථික සංවර්ධනයට දායක කර ගැනීමත්, ඔවුන්ගේ පුනරුත්ථාපන ක්‍රියාවලිය වඩා විධිමත් අයුරින් සිදු කිරීමට අවශ්‍ය පහසුකම් ලබාදීමත් තුළින් රැඳවි ශ්‍රමය යොදාගෙන බන්ධනාගාර ස්වයං යැපුම් මට්ටමකට ගෙන ඒම අපේක්ෂා කෙරේ.

ඒ අනුව පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

| බන්ධනාගාරය | ක්‍රියාත්මක කර්මාන්තය | වියදම | ආදායම |
|---|---|---|---|
| වටරැක | ගොවිපල, සත්වපාලනය, කොහු/ඉදල් | **574,510.00** | **1,829,157.87** |
| මහර | කෘෂිකර්මාන්ත, කම්මල්, කොහු/ඉදල්, වඩු, සත්ව පාලනය, බේකරි, මැහුම් | **3,964,239.12** | **10,577,313.79** |
| දළුපත | පේෂකර්ම, මැහුම්, කොහුමෝල, ගඩොල්, බේකරි, වඩු, කොහු/ඉදල්, රජක, සබන්, කම්මල්, ගරාජ්, ලියුම් කවර | **6,351,143.03** | **11,433,340.28** |
| බෝගම්බර | කොහු/ඉදල්, මැහුම්, කම්මල්,වඩු, පේෂකර්ම, රජක, පෙදරේරු, බේකරි, සබන්, ගරාජ් | **1,106,436.00** | **4,510,764.64** |
| පල්ලේකැලේ | බේකරි, ගඩොල්, රජක, පේෂකර්ම, මැහුම්, වඩු, කොහු/ඉදල්, සබන්, පෙදරේරු, කම්මල්, ගරාජ් | **22,528,701.88** | **27,793,270.38** |
| අනුරාධපුර | බේකරි, ගඩොල්, රජක, පේෂකර්ම, මැහුම්, වඩු, කොහු/ඉදල්, සබන්, පෙදරේරු, කම්මල්, ගරාජ් | **10,564,516.61** | **15,411,755.95** |
| වීරවිල | වගා, කොහු/ඉදල්, සත්වපාලනය, වඩු, කම්මල්, ගඩොල්, බේකරි | **1,387,887.00** | **6,346,601.90** |
| වැලිකඩ | බේකරි, රජක, පේෂකර්ම, මැහුම්, වඩු, කොහු/ඉදල්, සබන්, කම්මල්, ගරාජ්, ලියුම්කවර | **18,860,810.47** | **34,267,579.01** |
| තල්දෙන | රජක, මැහුම්, පේෂකර්ම, බේකරි, කොහු/ඉදල්, වඩු, ගඩොල්, සබන්, ලියුම්කවර, කම්මල්, ගරාජ්, විසිතුරු | **4,246,431.80** | **6,589,912.35** |
| කුරුවිට | ගොවිපල, සත්වපාලනය | **408,713.50** | **3,531,177.66** |
| බූස්ස | ගොවිපල, බේකරි, සත්වපාලනය, විවිධ | **862,581.89** | **2,452,915.00** |
| වාරියපොල | වගා අංශය, සත්ව පාලනය, බ්ලොක් ගල් | **340,494.00** | **1,853,378.62** |
| තංගල්ල | වගා අංශය, සත්ව පාලනය | **462,598.00** | **1,821,745.35** |
| බදුල්ල | රජක අංශය | | **41,692.50** |
| කො:රි:බ: | ගරාජ් | **2,627,194.50** | **2,220,039.75** |
| එකතුව | | **74,286,257.80** | **130,680,645.03** |

## 9.2 ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

**1999 අංක 46 දරණ ප්‍රජා පාදක විශෝධන පනත මඟින් වරදකරුවන් බන්ධනාගාරගත කිරීම වෙනුවට විකල්ප දඬුවම් ක්‍රමයක් වශයෙන් හඳුන්වා දෙන ලද ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය, 2000 වසරේ දී ආරම්භ කරන ලද අතර 2014 වර්ෂයේ අධිකරණ කොට්ඨාශ 97ක් දක්වා වර්ධනය වී තිබේ.**

**එම අධිකරණ කොට්ඨාශයන් හි පිහිටුවා ඇති ප්‍රජා විශෝධන ප්‍රාදේශීය කාර්යාල මඟින් විශෝධන ආඥා ලබා ගැනීම, වෘත්තීය පුහුණු හා විශෝධන වැඩසටහන් පැවැත්වීම මෙන්ම ආඥාලාභීන් සම්බන්ධ කර ගනිමින් නිෂ්පාදන හා කෘෂිකාර්මික වැනි විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබේ.**

## 2014 වසරේදී ලඟා කරගත් ඉලක්කයන්


**ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්මට අනුව සකසන ලද 2014 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම යටතේ පහත ඉලක්කයන් ලඟා කරගන්නා ලදී.**

| අංකය | වැඩසටහන | ක්‍රියාකාරකම | අපේක්ෂිත ව්‍යාපෘති සංඛ්‍යාව | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | ප්‍රජා විශෝධන ආඥා ප්‍රමාණය වැඩිකර ගැනීම | විනිසුරුවන් හා නීතිඥවරු දැනුවත් කිරීම | **20** | **12** |
| | | ප්‍රජාව දැනුවත් කිරීම | | |
| | | ප්‍රාදේශිය කාර්යාල අධික්ෂණය | **97** | **61** |
| 2 | ප්‍රජා විශෝධන ආඥාලාභීන් සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | උපදේශන වැඩසටහන් | **1030** | **1321** |
| | | අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් | **400** | **274** |
| | | වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම (ආඥාලාභීන් සංඛ්‍යාව) | **600** | **1562** |
| | | වෘත්තිය පුහුණු වැඩසටහන් | **200** | **226** |
| 3 | ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ ශ්‍රමය රටේ සංවර්ධනයට යොදාගැනීම | විශේෂ ව්‍යාපෘති හරහා ආඥාලාභීන්ගේ ශ්‍රමය රටේ ආර්ථිකයට දායක කර ගැනීම | **90** | **55** |
| | | ශ්‍රමදාන වැඩසටහන් | **750** | **669** |
| 4 | කාර්යාල ක්‍රම වැඩිදියුණු කිරීම | වෙබ් පිටුව සකස් කිරීම | **01** | **01** |
| 5 | මානව සම්පත් සංවර්ධනය | ප්‍රජා විශෝධන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් | **01** | **03** |
| | | වැඩ පරීක්ෂකවරුන් සඳහා පුහුණු වැඩසටහන් | **01** | **01** |
| | | උපදේශන ඩිප්ලෝමා/සහතික පත්‍ර පාඨමාලා සඳහා නිලධාරීන් යොමු කිරීම | **03** | **03** |
| 6 | කාර්යාල උපකරණ මිල දී ගැනීම | ප්‍රජා විශෝධන නිලධාරින් සහ සංවර්ධන නිළධාරීන්සඳහා කාර්යාල උපකරණ මිලදී ගැනීම | **215** | **215** |
| | | ප්‍රධාන කාර්යාලයට සහ ප්රදේශීය කාර්යාල සඳහා පරිගණක ලබා දීම | **24** | **24** |

## 1. බන්ධනාගාරගත කිරීමට විකල්පයක් ලෙස ප්‍රජා විශෝධන ක්‍රමය


### 1.1. ලබා ගත් විශෝධන ආඥා ප්‍රමාණය

| අංකය | පළාත | විශෝධන ආඥා ලැබූ සංඛ්‍යාව |
|---|---|---|
| 01. | බස්නාහිර | 5856 |
| 02. | මධ්‍යම | 1824 |
| 03. | ඌව | 463 |
| 04. | දකුණ | 1750 |
| 05. | සබරගමුව | 1406 |
| 06. | නැගෙනහිර | 685 |
| 07. | වයඹ | 3780 |
| 08. | උතුරු මැද | 651 |
| 09. | උතුර | 571 |
| | එකතුව | 16986 |




### 1.2. වරදේ ස්වභාවය අනුව විශෝධන ආඥා ප්‍රමාණය


| අංකය | වරද | නියෝග ලැබූ සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|
| 01. | හෙරොයින් | 1752 | 10.31 |
| 02. | ගංජා | 1671 | 9.84 |
| 03. | නීති විරෝධී මත්පැන් | 9232 | 54.35 |
| 04. | මහජන පීඩා | 1962 | 11.55 |
| 05. | සොරකම් | 256 | 1.51 |
| 06. | වංචාව | 19 | 0.11 |
| 07. | අනවසර ආයුධ | 9 | 0.05 |
| 08. | සොරබඩු ලග තබා ගැනීම | 53 | 0.31 |
| 09. | සුදුව | 621 | 3.66 |
| 10. | කෝලාහල | 194 | 1.14 |
| 11. | වෙනත් | 1217 | 7.16 |
| | එකතුව | 16986 | |




**1.3.** ප්‍රජා විශෝධන ආඥාලාභීන් වෙනුවෙන් පවත්වන ලද විශෝධන වැඩසටහන්

ප්‍රජා විශෝධන ආඥාලාභීන් වෙනුවෙන් උපදේශන හා මත් නිවාරණ, අධ්‍යාත්මික හා වෘත්තීය පුහුණු වැඩසටහන් පවත්වා ඇති අතර ඔවුන් සම්බන්ධ කර ගනිමින් සංවර්ධන වැඩසටහන් 3808 ක් සාර්ථකව දිවයින පුරා අධිකරණ කලාප මට්ටමින් ක්‍රියාත්මක කර ඇත.

| අංකය | වැඩසටහනේ නම | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| 1. | උපදේශන හා මත් නිවාරණ | 1136 |
| 2. | සංවර්ධන හා ශ්‍රමදාන වැඩසටහන් | 602 |
| 3. | ආධ්‍යාත්මික සංවර්ධන | 263 |
| 4. | වෘත්තීය පුහුණු | 245 |
| 5. | වෛද්‍ය ප්‍රතිකාර (යොමු කල ගණන) | 1562 |



### 1.3.1. පළාත් මට්ටමින් සිදු කළ විවිධ වැඩසටහන්

පළාත් මට්ටමින් ප්‍රාදේශිය කාර්යාල විසින් ප්‍රජා විශෝධන ආඥාලාභීන් සඳහා පහත පරිදි විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

| අංක | පළාත | උපදේශන හා මත් නිවාරණ වැඩසටහන් | සංවර්ධන හා ශ්‍රමදාන වැඩසටහන් | ආගමික වැඩසටහන් | වෘත්තීය පුහුණු වැඩසටහන් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1. | බස්නාහිර | 408 | 322 | 59 | 70 | 859 |
| 2. | මධ්‍යම | 197 | 29 | 104 | 8 | 338 |
| 3. | දකුණ | 123 | 66 | 14 | 11 | 214 |
| 4. | උතුර | 58 | 14 | 9 | 2 | 83 |
| 5. | නැගෙනහිර | 39 | 23 | 4 | 3 | 69 |
| 6. | වයඹ | 158 | 98 | 32 | 87 | 375 |
| 7. | උතුරු මැද | 105 | 32 | 21 | 17 | 175 |
| 8. | ඌව | 63 | 23 | 12 | 0 | 98 |
| 9. | සබරගමුව | 169 | 62 | 19 | 26 | 276 |
| 10 | එකතුව | 1320 | 669 | 274 | 224 | 2487 |

### 1.3.2. වෘත්තීය පුහුණු හා කෘෂිකාර්මික ව්‍යාපෘති

දිවයිනේ සියලුම ප්‍රාදේශීය කාර්යාලයන් හි මේ වන විට ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ ශ්‍රමය යොදා ගනිමින් කෘෂිකාර්මික හා නිෂ්පාදන ව්‍යාපෘති 45ක් සිදු කර ඇත. ආකල්ප සංවර්ධනය මෙන්ම පවුලේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ඔවුන් නැඹුරු කරලීම ප්‍රධානතම අරමුණ වන අතර නිෂ්පාදන අලෙවියෙන් ලැබෙන ආදායම රජයේ ආදායමට බැර කිරීම තුළින් රටේ සංවර්ධනයට ද දායක කරවා ගනී.

ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ ශ්‍රම දායකත්වයෙන් හා රුපියල් 717,399.00 ක වියදමින් සිදු කරන ලද ව්‍යාපෘතිවලින් 2014 වර්ෂයේ රුපියල් 632,646.00 ක ආදායමක් උපයා ගැනීමට හැකි වී ඇත.



*වලස්මුල්ල පොල්පැල තවාන්*




*මතුගම පුරන් කුඹුරු අස්වැද්දීමේ ව්‍යාපෘතිය*

## 2. <u>ගුණාත්මක සේවයකට මානව සම්පත් සංවර්ධනය</u>

### 2.1. නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු කිරීමේ වැඩසටහන්

2014.07.22 වන දින බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානයේ දී වැඩ පරීක්ෂකවරුන් 50 දෙනෙකු සඳහා රුපියල් 212,691ක වියදමින් මූලික මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ දින 5 ක පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. එමෙන්ම පිළිගත් අධ්‍යාපන ආයතනවල උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීම සඳහා ප්‍රජා විශෝධන නිලධාරීන් තිදෙනෙකුට රු. 155,000 ක් ලබා දී ඇත.

### 2.2. රැඳවි පවුල්වල සුභසාධනය, සංවර්ධනය හා පසුවිපරම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම

රැඳවි පවුල්වල සුභසාධනය, සංවර්ධනය හා පසුවිපරම් ක්‍රියාවලිය හා මහින්ද චින්තන ඉදිරි දැක්ම ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සංවර්ධන නිලධාරීන් 242ක් අනුයුක්ත කර ඇත. ඔවුන් මගින් ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන් සහ රැඳවි පවුල් සඳහා ගැලපෙන පරිදි සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ දී ප්‍රජා විශෝධන නිලධාරීන් 100 ක් සඳහා රුපියල් 147,500 ක වියදමින් මහින්ද චින්තන ඉදිරි දැක්ම ක්‍රියාවට නැංවීමේ ඇගයුම් හා මෙහෙයුම් යාන්ත්‍රණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

## 3. <u>විශෝධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම</u>

### 3.1. පළාත් මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම

දිවයිනේ සියලුම ප්‍රජා විශෝධන කාර්යාලයන්හි ප්‍රජා විශෝධන නිලධාරීන් සම්බන්ධ කරගනිමින් පළාත් මට්ටමින් ප්‍රගති සමාලෝච රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන ලදී. ඒ හරහා ප්‍රාදේශිය කාර්යාලයන් හි නිලධාරීන් සඳහා ආවේණික වූ ගැටළු හඳුනා ගැනීමට හැකි වූ අතර ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා වන ඉදිරි සැලසුම් සාකච්ඡා කිරීමට හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හැකි විය.

### 3.2. ප්‍රජා විශෝධන පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ අරමුණින් මහේස්ත්‍රාත්වරු, නීතිඥවරුන් සහ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 24ක් පවත්වා ඇත.

නව කාර්යාල ආරම්භ කිරීම

දශක 3 ක් පුරා පැවති යුද්ධය නිමා වීමත් සමග ප්‍රජා විශෝධන ක්‍රියාවලිය උතුරු පළාත තුළ ද ව්‍යාප්ත කිරීමේ අරමුණින් මුලතිව්, කිලිනොච්චි, වවුනියා සහ මල්ලාකම් යන ප්‍රදේශයන්හි ප්‍රජා විශෝධන කාර්යාල ආරම්භ කරන ලදී.

### 3.3. කාර්ය මණ්ඩලය සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීම

ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා උතුරු පළාත වෙනුවෙන් නව වැඩ පරීක්ෂකවරු තිදෙනෙකු බඳවා ගෙන ඇති අතර සංවර්ධන නිලධාරීන් 25 දෙනෙකු සහ ප්‍රධාන කාර්යාලය සඳහා කාර්යාල කාර්ය සහායකයින් 05 දෙනෙකු බඳවා ගෙන ඇත.

## 10. නීතිපති දෙපාර්තමේන්තුව

දැක්ම

ශ්‍රී ලංකාව වෙනුවෙන් සහ එහි ජීවත්වන සියලුම ජනතාව වෙනුවෙන් යුක්තිය හා සාධාරණත්වය ඉෂ්ඨ කිරිම සඳහා ඵලදායි ලෙස ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය ලෙස කටයුතු කිරිම.

මෙහෙවර

- ශ්‍රී ලංකාවේ අපේක්ෂාවන් සපුරාලීම උදෙසා, ගෞරවනීයවත්, අභිමානවත් ලෙසත්, අවංක ලෙසත් කටයුතු කිරිම සහ අපගේ උපරිමයෙන් ශ්‍රී ලාංකික ජනතාවට සේවය කිරිම.

- සාමාජීය සහ ආර්ථික සෞභාග්‍යය,සම අවස්ථාවන් සහ මානව දයාව දිරිගැන්වීමේ ප්‍රයත්නයේ දී ශ්‍රී ලාංකීය ජනතාව උදෙසා සාධාරණත්වය, ආරක්ෂාව සහ ස්වාධීනත්වය තහවුරු කරනු වස්, අපක්ෂපාතීව සහ සාධාරණ ලෙස ශ්‍රී ලංකාවේ නීතින් ක්‍රියාත්මක කිරිමට නිතිපති දෙපාර්තමේන්තුව ප්‍රයත්න දරනු ඇත.

අරමුණ

- ශ්‍රී ලංකා රජය සහ රජයේ ආයතන, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය සියලු නෛතික සේවාවන් සහ නීති උපදෙස් නොපමාව සැපයීම සහ රජයේ පුළුල් අරමුණු ව්‍යාප්ත කිරීමේ ක්‍රියාවලියේ දි සුවිශේෂී මෙහෙවරක් ඉටු කිරිම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් පෙනී සිටින ප්‍රධාන නීති නිලධාරියා නීතිපතිවරයා වන අතර දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ගණන් දීමේ නිලධාරියා වශයෙන් ගරු නීතිපති තුමා කටයුතු කරයි. "ඒ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වන නීතිපති දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක **1651/20, 2010.04.30** දරණ ගැසට් පත්‍රය අනුව අතිගරු ජනාධිපති තුමා භාරයේ පවතී.

නීතිපති දෙපාර්තමේන්තුව මධ්‍යම රජයට, පළාත් සභාවලට රජයේ දෙපාර්තමේන්තු වලට , ව්‍යවස්ථාපිත මණ්ඩල හා අනිකුත් අර්ධ රාජ්‍ය ආයතනවලට නීතිමය සහය ලබාදෙයි. එකී සහය ලබාදීමේදී දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් විසින් ප්‍රධාන වශයෙන් සිවිල්, අපරාධ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ වාණිජ යන කාරණා සම්බන්ධයෙන් රජයට සහ රජයට අයත් ආයතන වලට උපදෙස් දීමත්, දිවයිනේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අනෙකුත් අධිකරණ වල හා කම්කරු විනිශ්චය සභාවල පවරා ඇති නඩු වලදී රජය සහ රාජ්‍ය ආයතන නියෝජනය කිරීමත් සිදු කරනු ලැබේ.

සිවිල් අංශය, අපරාධ නඩු අංශය හා රාජ්‍ය නීතිඥ අංශය වශයෙන් ප්‍රධාන අංශ තුනක් මගින් දෙපාර්තමේන්තුවේ සිවිල් හා අපරාධ නඩු වලට අදාලව කටයුතු ඉටු කරනු ලබන අතර පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා ආයතන අංශය හා ගිණුම් අංශය ස්ථාපිත කර ඇත. මෙම අංශ වලට අමතරව දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීලෙස ක්‍රියාත්මක කිරීමට සංස්ථා අංශය, හදිසි අවස්ථා නියෝග හා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පවරන නඩු සම්බන්ධව කටයුතු කරන

ටීරීආර් ඒකකය, ළමා අපචාර නඩු ඒකකය, ආගමන හා විගමන ඒකකය, මහජන පැමිණිලි ඒකකය,ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය යන ඒකක නීතිපති දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මකව පවතී.

## 10.01 නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය

නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය පහත පරිදි සංක්ෂිප්තව දැක්විය හැක.

- සිවිල්, අපරාධ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, වාණිජ යන කාරණා, ජාත්‍යන්තර නීති කටයුතු සහ එක්සත් ජාතින්ගේ මානව හිමිකම් කොමිසමට අදාල කාරණා සම්බන්ධයෙන් රජයට සහ රජයට අයත් ආයතනවලට උපදෙස් දීම.
- දිවයිනේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අනිකුත් අධිකරණවල හා කම්කරු විනිශ්චය සභාවල පවරා ඇති නඩුවලදී රජය සහ රාජ්‍ය ආයතන නියෝජනය කිරීම.
- නව නිති සම්මත කිරීමේදි හා පවතින නිති සංශෝධනය කිරීමේදි අවශ්‍ය නෛතික උපදෙස් ලබාදීම.

ඉහත කාර්යයන් ඉටු කිරීමේදී, දෙපාර්තමේන්තුවේ පහත දක්වා ඇති අංශ නීති කාර්ය මණ්ඩලයට සහාය වෙයි.

- අපරාධ නඩු අංශය
- සිවිල් අංශය
- රාජ්‍ය නීතිඥ අංශය
- ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය
- සංස්ථා අංශය

තවද දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට විශේෂ වශයෙන් හඳුනාගත් වගකීම් පවරා ඇති විශේෂ ඒකක ද ක්‍රියාත්මකවේ.
එම ඒකක වන්නේ;

- මහජන පෙත්සම් ඒකකය (මහජන පෙත්සම් සම්බන්ධයෙන් කටයුතු කරන්නේ මෙම අංශයයි)
- ළමා අපචාර නඩු ඒකකය (ළමුන් අපචාරවලට ලක් කිරීමට අදාල නඩු පිළිබඳ ක්‍රියාකිරීම පිණිස පිහිටුවා ඇත)
- ටීරීආර් ඒකකය (හදිසි අවස්ථා නියෝග සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පවරන නඩු සම්බන්ධව කටයුතු කරයි)
- ආගමන සහ විගමන ඒකකය (ආගමන හා විගමන පනත යටතේ පවරන නඩු සම්බන්ධව කටයුතු කරයි)

නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉටුවිය යුතු ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සඳහා ඉහත කී අංශ සහ ඒකක කටයුතු කරනු ලබන අතර, නීතිපති දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා ආයතන අංශය හා ගිණුම් අංශය ස්ථාපිත කර ඇත.

එක් එක් අංශයන්හි 2014 වර්ෂයේ කාර්ය සාධනය පහත පරිදි සංක්ෂිප්ත කොට දැක්විය හැකිය.

| ශාඛාව | විවෘත කල ලිපිගොනු සංඛ්‍යාව | අධි චෝදනා යැවූ ගොනු සංඛ්‍යාව | උපදෙස් දුන් ගොනු සංඛ්‍යාව | නිදහස් කල ගොනු සංඛ්‍යාව | වැඩ අවසන් කල ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| *සිවිල් අංශය | **2686** | **-** | **-** | **-** | **118** |
| අපරාධ නඩු අංශය | **5496** | **2210** | **1304** | **870** | **3970** |
| *රාජ්‍ය නීතිඥ අංශය | **128** | **-** | **-** | **-** | **1712** |
| ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය | **392** | **-** | **-** | **-** | **680** |
| සංස්ථා අංශය | **1885** | **-** | **-** | **-** | **1751** |
| කාන්තා හා ළමා අපචාර නඩු ඒකකය | **4428** | **739** | **540** | **909** | **2188** |
| මහජන පෙත්සම් අංශය | **530** | **-** | **-** | **-** | **220** |

***සිවිල් අංශය මගින් විවෘත කරනු ලබන ගොනු වලින් බහුතර සංඛ්‍යාවක් රාජ්‍ය නීතිඥ අංශය හරහා කටයුතු කරනු ලබන බව සලකන්න**

**2014.01.01 සිට 2014.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය**

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---:|---:|
| පුනරාවර්තන වියදම් | **496,720,000** | **496,288,535** |
| ප්‍රාග්ධන වියදම | **38,300,000** | **38,190,388** |
| එකතුව | **535,020,000** | **534,478,923** |

# 11. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

දැක්ම

යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරිම සඳහා නොයෙකුත් රාජ්‍ය ප්‍රතිපත්තින් නීතිය බවට පරිවර්තනය කරමින් ශ්‍රී ලංකා ජනරජයට සහාය වීම.

මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්තින්, නීතිය බවට පරිවර්තනය කිරිමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, ඊට අදාළ පනත් සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි භාෂා තුනෙන්ම සම්පාදනය කිරීම

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව "ඒ" ශ්‍රේණියේ රාජ්‍ය දෙපාර්තමේන්තුවකි. මෙම දෙපාර්තමේන්තුව අංක 1651/20 හා 2010.04.30 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව 2015.01.18 දිනය දක්වා අතිගරු ජනාධිපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ පැවතුණි.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යභාරය වනුයේ, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද තීරණ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, විවිධ විෂයන් පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තීන් ලිඛිත නීතිය බවට පරිවර්තනය කිරිම ය. එසේ රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කිරිමේ ක්‍රියාවලියේ දී දෙපාර්තමේන්තුව විසින්, නව පනත් කෙටුම්පත් සම්පාදනය කිරිම , පවත්නා නීති සංශෝධනය කිරිමේ පනත් කෙටුම්පත් සම්පාදනය කිරිම සහ අදාළ අමාත්‍යාංශවලින් ඉදිරිපත් කරන අනුනීති ප්‍රතිශෝධනය කිරිම සිදු කරයි. පනත් කෙටුම්පත් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගිවීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේදි පාර්ලිමේන්තුව සමඟ අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරිමද දෙපාර්තමේන්තුවට පැවරි ඇති රාජකාරි කටයුතු වේ. මෙම දෙපාර්තමේන්තුව, සියලු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ද ඇතුළු සෑම අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක් වෙත සේවා සලසයි. පනත් කෙටුම්පත් සහ අනුනීති සැකසීම සම්බන්ධයෙන් නොයෙකුත් අමාත්‍යාංශ හා රාජ්‍ය දෙපාර්තමේන්තුවලට නෛතික උපදෙස් ලබාදිම ද,
දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන තවත් රාජකාරියකි.

2014.01.01 සිට 2014.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම(රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම | 69,845,000 | 67,979,040 |
| ප්‍රග්ධන වියදම | 42,475,000 | 7,858,979 |
| එකතුව | 112,320,000 | 75,838,019 |

# 12. මහා භාරකාර දෙපාර්තමේන්තුව

දැක්ම

**පරිත්‍යාගශීලි දානපතියන් විසින් මහා භාරකාරතැන කෙරෙහි තබන ලද විශ්වාසය අනුව විවිධ කාර්යයන් සඳහා යෙදවීමට පරිත්‍යාගකරන ලද මුදල්/දේපළ අදාළ ස්ථාපකවරුන් ගේ ද තෙස්තමේන්තුකරුවන් ගේ ද පොදු මහජනතාව ගේ ද අභිලාෂයන් සහ අවශ්‍යතාවයන් සපිරෙන පරිද්දෙන් නෛතික රාමුවක් තුළ සැමට උපරිම ප්‍රතිලාභයක් සලසමින් විශ්වාසනීය භාරකරුවෙකු වශයෙන් ක්‍රියාකිරීම.**

මෙහෙවර

**දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද දේපළ, බූදල්, වන්දි සහ මුදල් වෘත්තීමය දැනීම සහ නිපුණතාවය මත පරිපාලනය, කළමනාකරණය සහ ආයෝජනය කරමින් ඒවායේ අර්ථලාභීන්/ උරුමකරුවන්/ යැපෙන්නන්/ ලබන්නන් හට විශ්වාසනීය, කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් ලබාදීම.**

## 12.1 මහා භාරකාරධූරය හා නෛතික ශක්නුතාවය

**1931 අංක 11 සහ 1938 අංක 59 දරණ ආඥා පනත් මඟින් ද, 1973 අංක 44 සහ 1975 අංක 25 දරණ නීති මඟින් ද, 1983 අංක 41 සහ 1988 අංක 61 දරණ පනත් මඟින් සංශෝධිත 1922 අංක 01 දරණ මහා භාරකාර ආඥා පනත මඟින් ශ්‍රී ලංකාව තුළ මහා භාරකාරධූරය, ස්වාධීන අවිච්න්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිතව ස්ථාපිතකොට ඇති අතර, ධූරයේ නාමයෙන් නඩු පැවරීමට සහ පවරනු ලැබීමට නෛතික ශක්නුතාවයක් සහිත වේ.**

**මහා භාරකාරවරයාගේ කටයුතු සම්බන්ධයෙන් සහය වීම සඳහා 1988 අංක 61 දරන ආඥා පනතේ 04 වන ඡේදය යටතේ නියෝජ්‍ය මහා භාරකාරවරයකු හෝ කිහිපදෙනෙකු පත් කල හැක.**
**නෛතික කාර්ය භාරයක් ඉටුකරන එකී ධූරයන් සඳහා නිලධාරීන් තෝරාපත්කර ගැනීමේ දී ප්‍රධානම සුදුසුකම වන්නේ නීතිඥවරයෙකුවීම ය.**

## 12.2 නෛතික පසුබිම

**1931 අංක 11 සහ 1938 අංක 59 දරණ ආඥා පනත් මඟින් ද, 1973 අංක 44 සහ 1975 අංක අංක 25 දරණ නීති මඟින් ද, 1983 අංක 41 සහ 1988 අංක 61 දරණ පනත් මඟින් සංශෝධිත 1922 අංක 1 දරණ මහා භාරකාර ආඥා පනත යටතේ මහා භාරකාරධූරය ස්වාධීන නෛතික පුද්ගලයෙක් ලෙස ස්ථාපිත කර ඇති අතර, අදාළ ආඥා පනත් අනුව ආයතනය සහ ඒ අනුශාංගික කරුණු පාලනය වේ.**

**භාර සම්බන්ධයෙන් මහා භාරකාර ආඥා පනතට අමතරව 1918 අංක 04, 1934 අංක 1 දරණ ආඥා පනත් මඟින් ද 1968 අංක 7 සහ 1971 අංක 30 දරණ පනත් මඟින් ද සංශෝධිත 1917 අංක 9 දරණ භාර ආඥා පනත බලපැවැත්වෙන අතර, එකී පනත නිහඬවන්නා වූ යම් අවස්ථාවක දී ඉංග්‍රීසි සාධාරණත්ව අදාළ වේ.**

## 12.3 කාර්ය භාරය

මහා භාරකාර ආඥාපනත, සිවිල් නඩු විධාන සංග්‍රහය, අධිකරණ සංවිධාන පනත සහ වෙනත් ලිඛිත නීති මත පහත කාර්යභාරයන් මහා භාරකාරතැන වෙත පැවරී ඇත.

1. සාමාන්‍ය භාරකාරුවකු, රැකවරණ භාරකරුවකු හෝ ආරක්ෂක භාරකරුවකු ලෙස කටයුතු කිරීම.
2. දේපළ රැස්කිරීමේ නියෝග යටතේ දේපළ රැස්කිරීම.
3. බාලවයස්කරුවකු ගේ දේපළ භාරකරු හෝ සහය මිත්‍රයා (ආරක්ෂක කළමනාකරුවකු) ලෙස කටයුතු කිරීම (දිසා අධිකරණය මඟින් පවරන ලද අවස්ථාවක).
4. සිහිවිකල් පුද්ගලයකු ගේ දේපළ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම (දිසා අධිකරණය මඟින් පවරන ලද අවස්ථාවක).
5. නිශ්චල දේපළ ගිවිසුම්ගත කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම. (ආරක්ෂක භාරකරුවකු ලෙස පෙනී සිටින අවස්ථාවල දී එම භාරයන්හි පත්කර ඇති "භාරකාර මණ්ඩලය" මඟින් කලින් කලට ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට පමණක් ආරක්ෂක භාරකරු බැඳී සිටී).
6. විදේශගත වූ ශ්‍රී ලාංකිකයකු ගේ ඇටර්නි බලකරු ලෙස ඔවුන්ට අයවිය යුතු මුදල් ලබාදීම හෝ ගෙවීම සඳහා කටයුතු කිරීම.
7. සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ ප්‍රතිපාදන යටතේ ගරු අධිකරණය මගින් දේපළ සම්බන්ධව සහ අනෙකුත් කරුණු සම්බන්ධව කටයුතු කිරීම.
8. ගරු අධිකරණය මඟින් පවරන අවස්ථාවල දී අන්තිම කැමති පත්‍රයක් රහිත පුද්ගලයකු ගේ අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස කටයුතු කිරීම.
9. අධිකරණ සංවිධාන පනත මත දේපළ රැස්කරන්නකු ලෙස කටයුතු කිරීම.
10. වරදකට සිරගතවුවකු ගේ දේපළ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම.
11. ඕනෑම පුද්ගලයෙකු ගේ අන්තිම කැමති පත්‍රයක් සුරක්ෂිතව තැන්පත් කර තබාගන්නකු ලෙස කටයුතු කිරීම.
12. විහාරස්ථ දේපළෙහි භාරකරු වශයෙන් කටයුතු කිරීම.

## 12.4 උක්ත කාර්යයන් හැර වෙනත් ක්ෂේත්‍ර කෙරෙහි මහා භාරකාරතැන ගේ මැදිහත්වීම

මහා භාරකාර ආඥා පනතට පසුව කරන ලද සංශෝධනයන් අනුව සහ වෙනත් ලිඛිත නීති අනුව පැවරී ඇති වෙනත් කාර්යයන්.

- 1988 අංක 61 දරණ පනත මඟින් සංශෝධිත මහා භාරකාර ආඥා පනතේ 10 (අ) වගන්තියට ප්‍රකාරව සේවා නියුක්තිය සඳහා විදේශගත වන්නන්, විදේශයක දී මිය ගියහොත් ඔවුන් වෙනුවෙන් ලැබෙන වන්දි මුදල් යැපෙන්නන් සහ/හෝ නීත්‍යානුකූල උරුමකරුවන් අතර බෙදී දීම කාර්යක්ෂම සහ නිවැරදි ලෙස සිදුකිරීම සහ එකී කාර්යය පහසුකිරීම සඳහා අදාළ සේවා නියුක්තිකයන් ලියාපදිංචි කිරීම.

- **1944 අංක 42 දරණ විහාර ඉඩම් (වන්දි) ආඥා පනත ක්‍රියාත්මක කිරීම.**
- **1981 අංක 42 දරණ පනතින් සංශෝධිත 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් පනත යටතේ පැවරී ඇති කාර්යයන් ඉටුකිරීම.**
- **1973 අංක 28 දරණ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමෙහි කොටස්වල භාරකාරත්වය රජය වෙනුවෙන් දැරීම.**

## 12.5 මහා භාරකාරතැනගෙන් සැලසෙන සේවාවන්

මෙම දෙපාර්තමේන්තුවෙහි පිහිටුවා ඇති භාරවල අරමුණු අනුව/අන්තිම කැමතිපත්‍රවල ඇති අරමුණු අනුව/අධිකරණ නියෝග මත පහත විෂයයන්හි කටයුතු කරමින් ජනතාවට සේවය කරනු ලබයි.

- අධ්‍යාපනය හදාරන මූල්‍යමය අතින් ඉතාමත් දුෂ්කරතා ඇති දරුවන් දිරිමත් කිරීම සඳහා ශිෂ්‍යත්ව ලබාදීම.
- අසරණ සහ හදිසි ප්‍රතිකාර අවශ්‍ය රෝගීන්ට වෛද්‍ය ප්‍රතිකර ලබා ගැනීම සඳහා වෛද්‍යාධාර ලබාදීම.
- ආගමික සිද්ධස්ථාන නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති භාරවල අරමුණු අනුව මූල්‍යාධාර සැපයීම.
- පුණ්‍යාධාර කටයුතු.
- විවිධ හේතූන් නිසා ජීවත්වීමට අපහසු අසරණ පුද්ගලයන්ට සහ එවැනි පුද්ගලයන් සිටින ආයතනවලට ආධාර කිරීම.
- විහාර දේවාලගම් පනත යටතේ රජයට පවරාගන්නා ලද නිශ්වල දේපළ සඳහා හිමිවන වන්දි මුදල්, බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා ගේ නිර්දේශ මත  බෙදාහැරීම.
- භාර/ බූදල් දේපළ කළමනාකරණය කිරීම.
- අධ්‍යාපනය හදාරන මූල්‍යමය දුෂ්කරතා ඇති දක්ෂ දරුවන් දිරිමත් කිරීම අරමුණු කොට ඇති භාරයන්ගෙන් ආදායම උපයෝගි කරගනිමින් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
- සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ දෙදෙනෙකු හා සභාපති පත්කිරීම.
- විදේශ වන්දි බෙදාහැරීම.
- විහාර වන්දි බෙදාහැරීම.
- රාජ්‍ය ආයතනයක් වශයෙන් උපයන ආදායමින් ප්‍රතිශතයක් රාජ්‍ය භාණ්ඩාගාරය වෙත ලබාදීම. (2013 වසරේ රු:6,396,102.51ක මුදලක් රාජ්‍ය භාණ්ඩාගාරය වෙත ලබා දී ඇත).

## 12.6 භාර බුදල් සංඛ්‍යාව

**2013.12.31 දිනට දෙපාර්තමේන්තුවෙහි පිහිටුවා ඇති භාර සංඛ්‍යාව 1019ක් වන අතර, දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන බුදල් සංඛ්‍යාව 130කි. භාර ආරම්භ කළ දානපතීන් ගේ අරමුණු අනුව අදාල කාර්යයන් ඉටු කරනු ලැබේ.**

| වර්ෂය | ක්‍රියාත්මක කරන භාර සංඛ්‍යාව | ක්‍රියාත්මක කරන බුදල් සංඛ්‍යාව |
|---|---|---|
| **2011** | **981** | **119** |
| **2012** | **999** | **126** |
| **2013** | **1019** | **130** |

## 12.7 රාජ්‍ය භාණ්ඩාගාරය වෙත යොමු කර ඇති මුදල් ප්‍රමාණය

**මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති සහ පිහිටුවා ඇති භාර හා බුදල්වලට අදාලව මහා භාරකාර ආඥාපනත යටතේ අය කරනු ලබන මූලධන, ආයෝජන, ආදායම් ගාස්තු හා වෙනත් ගාස්තු පහත පරිදි රාජ්‍ය භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත.**

| වර්ෂය | මුදල (රු:) |
|---|---|
| **2011** | **3,783,187.40** |
| **2012** | **6,543,360.52** |
| **2013** | **6,396,102.51** |

**2014.01.01 සිට 2014.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය**

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම | **36,488,000** | **36,404,604** |
| ප්‍රාග්ධන වියදම | **1,917,000** | **1,722,836** |
| එකතුව | **38,405,000** | **38,127,440** |